# 2026.02.10 වන දින පැවති ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ.
# සාමාන්‍ය මහා සභා රැස්වීම් වාර්තාව.

මෙදින පෙ.ව 9.30 ට සාමාන්‍ය මහා රැස්වීම ආරම්භ වූ අතර පහත නම් සඳහන් ගරු සභික මහත්ම මහත්මීන් සහභාගී විය.

| අනු අංක | නම | තනතුර |
|---|---|---|
| 01. | ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා | ගරු සභාපති |
| 02. | ගරු මන්ත්‍රී යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා | ගරු උප සභාපති |
| 03. | ගරු මන්ත්‍රී ජී.එච්.එස්.එන්.කේ.විජේසූරිය මැතිතුමා | සභික |
| 04. | ගරු මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා | සභික |
| 05. | ගරු මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා | සභික |
| 06. | ගරු මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා | සභික |
| 07. | ගරු මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා | සභික |
| 08. | ගරු මන්ත්‍රීනී ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය | සභික |
| 09. | ගරු මන්ත්‍රීනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය | සභික |
| 10. | ගරු මන්ත්‍රී පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා | සභික |
| 11 | ගරු මන්ත්‍රී කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා | සභික |
| 12 | ගරු මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා | සභික |
| 13 | ගරු මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා | සභික |
| 14 | ගරු මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා | සභික |
| 15 | ගරු මන්ත්‍රී එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණිය | සභික |
| 16 | ගරු මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා | සභික |
| 17 | ගරු මන්ත්‍රීනී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය | සභික |
| 18 | ගරු මන්ත්‍රී එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා | සභික |
| 19 | ගරු මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා | සභික |
| 20 | ගරු මන්ත්‍රී එච්.එල්.ජයසේකර මැතිතුමා | සභික |
| 21 | ගරු මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා | සභික |
| 22 | ගරු මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා | සභික |
| 23 | ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා | සභික |
| 24 | ගරු මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා | සභික |
| 25 | ගරු මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය | සභික |
| 26 | ගරු මන්ත්‍රී ජී.එම්.නෙල්සන් ජයසේකර මැතිතුමා | සභික |
| 27 | ගරු මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා | සභික |
| 28 | ගරු මන්ත්‍රී පී.මාලින්ද මුදන්නායක් මැතිතුමා | සභික |
| 29 | ගරු මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා | සභික |
| 30 | ගරු මන්ත්‍රීනී පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිණිය | සභික |
| 31 | ගරු මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා | සභික |
| 32 | ගරු මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා | සභික |
| 33 | ගරු මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා | සභික |
| 34 | ගරු මන්ත්‍රීනී සරෝජනී ජිනේන්ද්‍රානි මැතිණිය | සභික |
| 35 | ගරු මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා | සභික |

**නොපැමිණීම්:-**

සභික ගරු මන්ත්‍රී එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා

01.ඩී.බී.මනොජ් තිවංක මයා සභාවේ ලේකම් ලෙස සහභාගී විය.

**සභාපතිතුමා :-**
අද දින මේ සඳහා පැමිණ සිටින උපසභාපතිතුමා, සියලුම මන්ත්‍රීවරුන් මන්ත්‍රීවරියන්, ඒ වගේම ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමා ඒ වගේම ප්‍රාදේශීය සභාව නියෝජනය කරන නිලධාරීන් දෙපල ඒ වගේම මාධ්‍යවේදී සහෝදර හිතවතුන් සියලු දෙනාට ම මම මේ අවස්ථාවේ ඉතාමත් ම ගෞරවයෙන් යුතුව පිළිගනු ලබනවා.එහෙම නම් අපි අද දිනයේ න්‍යාය පත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරමු.

**සභාපතිතුමා :-**
**01.පසුගිය සභා වාර්තා සම්මත කිරීම.**

**01.01.**2026.01.13 වන දින පැවති සාමාන්‍ය මහා සභා වාර්තාව සභා සම්මත කිරීමට යෝජනා කරමි.

**සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, පසුගිය සභා වාර්තාවේ 33වන පිටුවේ සඳහන්ව තිබෙනවා ඇහැලියගොඩ වත්ත අලුත් යාය ලෙස, එය අලුත් කැල්ල ලෙස සංශෝධනය විය යුතුයි.ඒතන ම තියෙනවා අවුරුදු පහක් කියලා.ඒක අවුරුදු දෙක හමාරක් කියලා නිවරදි වෙන්න ඕන. එමෙන්ම අවසාන පිටුවේ සඳහන් වෙනවා, ප්‍රශ්න වෙන්න පුළුවන් එම පනතේ තියෙන නිසා කියලා.එහෙම පනතේ නැහැ.මං ඒහෙම කිවුවේ නෑ.ඒ නිසා ඒය පනතේ නෑ කියන ලෙසට සංශෝධනය විය යුතුයි.

**සභාපතිතුමා :-**
බොහොම ස්තුතියි මන්ත්‍රීතුමා.සංශෝධන එලෙස නියමිත ස්ථානය පෙන්වා දෙමින් සංශෝධනය ඉදිරිපත් කිරිහ ඉතාම වටිනවා.

**සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, 2025-01-13 වන දින පැවති සාමාන්‍ය මහා සභා වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත කරමි.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව, 2026.01.13 වන දින පැවති සාමාන්‍ය මහා සභා වාර්තාව සංශෝධන සහිතව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
**02.සභාපතිවරයා විසින් සභාව වෙත ඉදිරිපත් කළ යුතු නිවේදන.**
මගේ දකුණු පස සහ වම් පස ගරු මන්ත්‍රීතුමන්ලාට සහ මන්ත්‍රීවරියන්ට විශේෂ නිවේදනයක් තිබෙනවා.ගමන් වියදම් දීමනවා සම්බන්ධව. එහිදී සභාපතිවරයා විසින් පවරන අත්‍යවශ්‍ය කරුණු වලට පමණයි ගමන් වියදම් ලබාදිය හැක්කේ. හැමෝම දැන් කමිටුවල ඉන්නවානේ, ඒ කමිටුවලට අනිවාර්යයෙන් ම සහභාගී විය යුතුයි. ඒ වගේ ම අපි තව ටිකක් විමධ්‍යගත කරලා, ඒ කියන්නේ මේක දෙපැත්තට ම අදාළයි.කාර්මික කමිටුව, පරිසර කමිටුව,නිවාස කමිටුව වගේ ඒවයෙ ,යන්න තිබෙන නිරීක්ෂණ චාරිකා සඳහා දෙපැත්තෙන්ම අය සහභාගී වෙන්න. විපක්ෂයේ සියලුම මන්ත්‍රීතුමන්ලා කමිටුවල නැත්නම් අපි ඒවට නිර්දේශයක් හදමු.අත්‍යවශ්‍ය ස්ථාන වලට සභාපතිවරයාගේ නියමය පරිදි එලෙස සොයා බැලුවා කියා සභාවේ කටයුතු තවදුරටත් විමධ්‍යගත වෙන්න පක්ෂ විපක්ෂව.එක පැත්තකින් විතරක් අපිට දීමනාව කපා හරින්න බැහැ.ගමන් වියදම ලබා දෙන්න හරි කරුණු ඉදිරිපත් වෙන්න ඕන.ඒ නිසා කවුරුත් එම කමිටුවලට සහභාගී වෙන්න කියා මම සියලු දෙනාගෙන් ම ඉල්ලා සිටිනවා.මේක ලබාදීම ගැටලුවක් නෑ.හැමෝ ම ඒ අදාළ කමිටුවලට සහභාගී වෙන්න කියලා හැමෝගෙන් ම මම ඉල්ලා සිටිනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එය රු.8000.00 ක ගමන් හා යැපීම් දීමනාව සභිකයින්ට ලැබෙන්නේ කොහොමද කියන එක ගැන තව දුරටත් පැහැදිලි කිරීමක් සිදු කරනවා නම් හොඳයි. මෙන්න මේ සුදුසුකම් මත තමයි රු.8000.00 ලැබෙන්නේ කියලා. මම ඒක තව ටිකක් පැහැදිලි කරන්නම්. දැන් ඇත්තට ම ඔබතුමන්ලාගේ ආණ්ඩුව යන කොට ඔබතුමන්ලා හදපු පාරවල් විවෘත කරන්න, ඔබතුමන්ලාගේ පාරවල් වල ඇස්තමේන්තු හදන්න, නැත්නම් ඒ සම්බන්ධව වැඩ කරන කොට අපි යන්නේ නැහැනේ.ඔබතුමන්ලා අපිට කතා කරන්නෙත් නැහැ. අපි යන්නෙත් නැහැ. එවිට සභාපතිතුමා වැඩ පැවරීම කියන කාරණාවේදී අපේ කණ්ඩායමට මේ රු.8000.00 ලබාගැනීමේ සුදුසුකම් ඔබතුමා විශ්වාස කරන විදිහට නැතිවෙන්න ඉඩකඩ වැඩියි. රු.8000.00 නැති වුණාට ප්‍රශ්නයක් නැහැ.සමහර විට ආණ්ඩු පක්ෂයෙන් කෙරෙන්නේ නැති කාර්යභාරයක් විපක්ෂයෙන් කෙරෙනවා.අවංකව කතා කළොත් පාරක් හදලා ඒක ට්‍රැක් වෙලා කියලා.එහෙම අවස්ථා තිබ්බා.උදාහරණයක් විදිහට කිරිපෝරුවෙ පාරක් සම්බන්ධව අපිට අහන්න ලැබුණා අලුතින් දාපු කොන්ක්‍රීට් එක ට්‍රැක් වෙලා කියලා.අපි ඒව බලන්න ගියා.එවිට අපිට තේරුනා ප්‍රශ්නයක් නැහැ.එතනදී අපි කොතනද ගැටළුව තියෙන්නේ කියලා අවබෝධ කරගත්තා.එතනින් ඒක ඉවරයි.එවිට එම රු.8000.00 දීම තුළ ගමන් වියදම් ලැබීම තුළ අපිත් යම් කිසි කාර්යභාරයක් සභාපතිතුමා නොදැනුවත්ව විපක්ෂයක් විදිහට කරනවා.ඒක මේ වෙලාවෙදි පැහැදිලි කරන්න ඕනි.එම දීමනාව ලබන කොට සුදුසුකම් සපුරා ගැනීම කියන දේ සභාපතිවරයා විසින් වැඩ පැවරීම කියන කාරණාවෙදි ඒක පොඩ්ඩක් නැවත සලකා බලන්න.යම්කිසි පැහැදි කිරීමක් කරන්න කොහොමද මේ රු.8000.00 ලැබීමේ සුදුසුකම් කියලා.

**සභාපතිතුමා :-**
මහ සභාව කාරක සභාවක් බවට පත්කර මේ පිළිබඳව පැහැදිලි කරමු.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමට මා යෝජනා කරනවා.

**සභික ටී.ඩී.වජීර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

මෙතැන් සිට මහා සභාව කාරක සභාවක් බවට පත්විය.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, කාරක සභාව මහ සභාවක් බවට පත් කිරිමට මම යෝජනා කරනවා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
බොහොම ස්තුතියි. එසේනම් මම ගරු මන්ත්‍රීතුමන්ලාට මම පැහැදිලි කළේ, අපි මේ නීති රාමුව තුළ අපිත් එක්ක ඒකාබද්ධ වෙලා, මේ වැඩේ කරමු.අපි මේක හදන කොට,වීථි පහන් නිරීක්ෂණ ම නැතුව, අපි කමිටුවට එමු.නිරීක්ෂණ චාරිකා යමු.ඇත්තට ම හොඳයි.නිකන් කෝල් එකක් දාල කියන්න මට.එවිට මම සටහනක් දානවා.එතකොට මට හරි පහසුයි මේක.කෝල් කියන්න මාර්ගය නිරීක්ෂණය කිරීම සඳහා අද ආවා කියලා.මෙන් මේ මන්ත්‍රීවරියන් සහ මන්ත්‍රීතුමන්ලා සහභාගී වුණා කියලා.එවිට ගෙවීම් කරන්න පහසුයි.එහෙම නැතුව කපන කතාවක් නෙවෙයි මම කිවුවේ. ඒ කියන්නේ අපි මේකට උත්තර බඳින්න එපැයි.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, සමාවෙන්න.දැන් අපි ඔබතුමාට කෝල් එකක් දීල කිවුවොත් එහෙම බොරුවට,මේ පාර හදල තියෙනව හරි නැහැ, ඵලදායී නැහැ, පුපුරලා තියෙන්නේ, ඔබතුමන්ලාගෙ ව්‍යාපෘතිය අසාර්ථකයි, අපි මේක බලන්න යනවා කියලා, ඊට පස්සේ මොකද වෙන්නේ.

**සභාපතිතුමා :-**
ඒක ගැටළුවක් නැහැනේ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඔබතුමා කියන එක හරි.හැබැයි අපි එතෙන්ට ගිහින් කරන වැඩේ සාර්ථක වෙන්නේ නැහැනේ. උදාහරණයක් විතරයි ඒ කිවුවේ .

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඇත්තට ම ගරු සභාපතිතුමා, අපිට රීති ටිකක් තියෙනවා.අපි වැරැද්දක් හරි අඩුපාඩුවක් හරි විධිමත්ව නොවෙන දෙයක් තියෙනවා නම් අපේ වගකීම තමයි ඒක විධිමත්ව ඉදිරියට කරන එක.කොතනකින් හරි පටන් අරගෙන කරන එක.මේක අපිට රීති පෙන්වලා දීල තියෙනවා.දැන් අපේ තියෙනවා කමිටු 04ක්.මුදල් කමිටුව, නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව, පරිසර හා පොදු පහසුකම් කමිටුව හා කාර්මික සේවා කමිටුව.මන්ත්‍රීතුමන්ලා සිටින ප්‍රමාණය අනුව ඒක අපිට ලේසියි.අපේ ඉන්නේ මන්ත්‍රීවරු 36යි. අපේ ගත්තොත් එහෙම, හැම කමිටුවකට ම එක්කෙනා ගානේ ඉන්නවා.ඔබතුමාම යෝජනා කරලා අපි කමිටුවල සාමාජිකත්වය වැඩි කලා. ගිය අවුරුද්දේ තිබුනේ 07යි. මේ අවුරුද්දේ 09ක් කළා. ඔබතුමන්ලාගේ වම්පස සහ දකුණු පස සියලුම මන්ත්‍රීතුමන්ලා එහි සිටිනවා. එවිට අපිට ප්‍රදේශීය සභාවේ සේවාවන් ගොඩක් තියෙනවා. ඒ සියල්ලම හරියට වෙනවද, අඩුපාඩු මොනවද කියල බලන්න කාලයක් නැහැ.අපි හැමෝට ම තියෙන්නේ පැය 24 යි.අපි ගත්තොත් අජන්ත මන්ත්‍රීතුමා, සුජීව මන්ත්‍රීතුමා එහෙම ගොඩක් අඩුපාඩු පෙන්වලා දෙනවා.මේවා නිවැරදි විය යුතුයි කියලා. අපි හැමෝම කමිටුවල සාමාජිකයොනෙ.ඒ නිසා අපේ මේ සේවාවන් ටික, මහජනතාවට සේවා සපයන අපේ මේ ආයතන ටික සහ අපේ සභා සම්පත් ටික අපිට පුළුවන් කමිටු වලට බෙදන්න. ඒ නිසා ගරු සභාපතිතුමනි, කාර්මික සේවා කමිටුවට, මුදල් කමිටුවට, පරිසර හා පහසුකම් කමිටුවට අදාළ විෂයන් ටිකක් තියෙනවා. එවිට හැම කමිටුවකට ම අදාළ රාජකාරි හැම කමිටුවකට ම කමිටු සාමාජිකයන්ට බෙදාගෙන ඕන.සභාපතිතුමා විදිහට සභාපතිතුමාට අදාළ ඒ නිර්දේශ ලිඛිතව අදාළ අඩුපාඩුව දැකල කරන යෝජනාව නිර්දේශයක් විදිහට අපිට ඒක දෙන්න පුළුවන්.මම හිතනවා මේ කියන නීති රාමුව ඇතුළේ, මේ කාර්යය විධිමත් කරලා, නීත්‍යානුකූල රාමුව ඇතුළේ සිදු කර ගන්න හැකියාවක් තියෙනවා.

**සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම කලිනුත් කිවුවා අනුරාධපුර පැත්තේ ගෙවනවා කියලා. උපෙසභාපතිතුමා කිවුවා පළාතෙන් පළාතට වෙනස් කියලා. මේ ක්‍රියාවලියත් සබරගමුව පළාතේ සෑම පළාත් පාලන ආයතනයකම ක්‍රියාත්මක වෙනවද?

**සභාපතිතුමා :-**
ඔබතුමා කිවුවා හරි.පළාතෙන් පළාතට වෙනස්. සබරගමුව පළාතේ ක්‍රියාත්මක වෙන්නේ මේ ක්‍රියාවලිය.

**සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මං මේ වැරද්දක් නෙමේ කියන්නේ.මේ ක්‍රියාවලිය මේ පළාතේ සෑම පළාත් පාලන ආයතනයක ම ක්‍රියාත්මක වෙනවද? එහෙම ක්‍රියාත්මක වෙනව නම් අපිත් ක්‍රියාත්මක කරන්න වෙනවා.

**සභාපතිතුමා :**
මේක ආණ්ඩුකාරතුමියගේ චක්‍රලේඛයක් තියෙන්නේ.මේ කාර්ය පළාතෙන් පළාතට වෙනස්.පළාත් සභා හරහානේ පාලනය වෙන්නේ.සබරගමුව පළාතේ ක්‍රියාත්මක වෙන්නේ මේ අනුව.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ කාරණාව සම්බන්ධව මගේ අවසාන අදහස් දැක්වීම.එවිට සභාපතිතුමා කියන විදිහට උප සභාපතිතුමා පැහැදිලි කරපු විදිහට, මේ විපක්ෂයේ මන්ත්‍රීවරු විදිහට, යම් කිසි කාර්යභාරයක් පනවනවා කිවුවා. අපි එය ඉටුකළොත් තමයි අපිට මේ යැපීම් දීමනාව හම්බවෙන්නේ කියලා ඔබතුමා සඳහන් කළා. ඉටු කළොත් තමයි හම්බවෙන්නේ. හැබැයි මේ පිළිබඳව මම කණ්ඩායමත් එක්ක සාකච්ඡා කළේ නැහැ, මගේ පෞද්ගලික මතය තමයි, මේ 8000 දීමනාව ලබා ගැනීම සඳහා, අපි දේශපාලනයක් කරනවා.දේශපාලනය

කිසිසේත් පාවා දෙන්නේ නැහැ.ඒක මං මේ වෙලාවේ පැහැදිලි කරන්න ඕනේ.යම්කිසි භේදයකින් අටදාහ දීමනාව ගන්න මෙන්න මෙහෙම පිටිපස්සෙන් ඉන්න කියලා කවුරුහරි විශ්වාස කරනවා නම්, ඉතින් ඒ වෙනුවෙන් අපේ බලවත් කණගාටුව .එහෙම විශ්වාස කළාට ,අපි මේ පාවාදීම අපි දේශපාලන වශයෙන් සිද්ධ කරන්නේ නැහැ.මොකද අපිට මාසික යැපීම් දීමනාව හම්බ වුනොත් එහෙමයි.නැතොත් එහෙමයි.අපේ දේශපාලන මතය, දේශපාලන ගමන් මාර්ගය වෙනස් කරන්නේ නැහැ සභාපතිතුමා. ඔබතුමාගේ වගකීමක් හරි යුතුකමක් හරි තියෙනව නම්, අපි කිවුවානේ ඔබතුමා නොදන්වාත් අපි වැඩ කරනවා. ඔබතුමාට අඩුපාඩු හොයා දෙන ඒව තියෙනවා.අඩු පාඩු පෙන්වා දෙනවා.අදාළ අවශ්‍යතා ඉටු කරනවා. හැබැයි මේ අටදාහ ගන්න පස්සෙන් එයි කියලා කවුරු හරි විශ්වාස කරනව නම්, එහෙම වෙන්නේ නැහැ කියන එක මම මේ වෙලාවෙදි ප්‍රකාශ කරන්න කැමතියි.

**සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපේ සංවර්ධන කටයුතු වලදී සහ අනෙකුත් කටයුත් වලදී , අපිට සහභාගීත්වයක් දක්වන්න හරි නිරීක්ෂණය කරන්න හරි ,අපිව දැනුවත් කිරීමක් කරන්නේ නැහැ. උදාහරණයක් ලෙස බෝපැත්තේ වීථි පහන් දෙවරක් දැම්මා.නමුත් එක වතාවක් වත් මාව දැනුවත් නැහැ.මම දන්නෙත් නෑ.නමුත් පළමු වතාවේ මම දැන ගෙන හිටියා 17 වෙනිදා වීථි පහන් සවි කරන්න එනවා කියලා.එදා අපි සැදී පැහැදී සිටියා.නමුත් කිසිම දැනුවත් කිරීමක් නැහැ.එහෙම දැනුවත් කිරීමක් සිදු වෙනවා නම් අපිත් සහභාගී වෙනවා.එහෙම දැනුවත් කිරීමක් නැතුව බෝපැත්ත දිද්ද කොට්ඨාශයේ සමඟි ජන බලවේගයේ ප්‍රාදේශිය සභා මන්ත්‍රීවරයා ලෙස සහභාගී වෙන්න බැහැ. එවිට සමඟි ජන බලවේගය වෙනුවෙන් ඡන්දය දීපු පාක්ෂිකයින් දෙකේ කොලයට දාන්නත් බැහැ, මම අපහසුතාවයට පත් වෙන්නත් බැහැ. අපිට දැනුවත් කිරීමක් සිදු වෙන්න ඕනි. නැත්නම් ආරාධනයක් තියෙන්න ඕනි යම් කිසි අවස්ථාවකදි. ඒ නිසා ඒ දැනුවත් කිරීම වටිනවා ගරු සභාපතිතුමනි.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපේ දිලීන් මන්ත්‍රීතුමා කිවුවා වගේ අටදාහ සම්බන්ධව ඔබතුමාව අපි විශ්වාස කරන්නේ, ඔබතුමන්ලාට පුළුවන් මේක යම් කාරණාවක් තුළ, ආණ්ඩුකාරතුමිය ඔබතුමන්ලාගේ පක්ෂයේ කෙනෙක්.ආණ්ඩුකාරතුමියට ඕනි දෙයක් වෙනස් කරන්න පුළුවන්. ඒක තමයි ඇත්ත ම තත්වය. ඒ නිසා ආණ්ඩුකාරතුමියත් එක්ක කතා කරලා කරන්න ඕනි කාරණාවක්, මේකට සභාවේ කාලය අපතේ යාම සම්බන්ධව මම නම්, හිතන්නේ අපරාධ කටයුත්තක්.මම එදා ඔබතුමාට කිවුවා, සභාපතිවරුන්ගේ සංගමයක් තියෙනවා. ඒ සංගමයට පුළුවන් මේවා ආණ්ඩුකාරතුමියත් එක්ක කතා කරන්න.දේශපාලන අධිකාරිය යටතේ තමයි, කුමන ආණ්ඩුව ආවත් ආණ්ඩුකාරතුමිය හෝ තුමා ඉන්නේ.ඒ නිසා මේක මෙච්චර දුර ගෙනියන්න ඕනි කාරණාවක් නෙවෙයි.අපේ කාලේ නම් අපි එහෙම කරලා නැහැ.එක දුරකථන ඇමතුමකින් අපි මේව වෙනස් කරලා තියෙනවා.එහෙම හැකියාවක් හදාගන්න ඕනි ඔබතුමාලා.
ඊළඟ කාරණාව තමයි අපේ චන්ද්‍රදාස මන්ත්‍රීතුමා කිවුවා වගේ මෙතෙන් දී සභාපතිතුමාගේ වම් පසයි දකුණු පසයි කියලා කතා කරනවා.හැබැයි ගමට ගියාට පස්සේ.මේ ගමේ මන්ත්‍රීවරයාට අමතරව තවත් ඉන්නවා නියෝජිතයෝ, තමුන්නාන්සේලාගේ පක්ෂයේ.ඒක NPP ද JVP ද අපි දන්නේ නෑ.මට කියන්න ලැජ්ජයි මෙතන. ආරියදාස මන්ත්‍රීතුමා සාක්ෂි දරයි. එතුමා බුළුගහපිටියයි යකුදාගොඩයි ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයා. හැබැයි ආරියදාස මන්ත්‍රීතුමා නෙවෙයි තීන්දු ගන්නනේ . ගමේ ඉන්න ,මෙතන කියන්න බැහැ මහ කැතයි.සමාජය අයින් කරපු, එදා සිංහල රජ කාලේ පළවෙනි වෘත්තිය කරපු එවුන් තමා මේ තීන්දු ගන්න හදන්නේ.ආරියදාස මන්ත්‍රීතුමා පවු. මම අවංකවම කියන්නේ.සභාපතිතුමාට තීන්දු ගන්න බැරි වෙලා තියෙනවා.උපසභාපතිතුමත් මෙතන කතා කරනවා, සභාපතිතුමාගේ වම්පස දකුණුපස කියලා.නමුත් කමිටුවකට දැම්මහම, කියන්න හොඳ නෑ.හැබැයි මම කියනවා මේ ටික.ඔයාල ප්‍රජා කමිටුවක් ගෙනාව. ප්‍රජා කමිටුවේ මම 2011 ඉඳන් ඉන්නවා. ඒ කමිටුවට මම මේ අඛණ්ඩව සභාව නියෝජනය කරපු මන්ත්‍රීවරයා විදිහට දැම්මහම, ආරියදාස මන්ත්‍රීතුමා ඒකට නිර්දේශ දෙනවා.සමාවෙන්න ඕන මේවා වාර්තාවේ දාන්න එපා.ගැහැනියෙන් මාව මේ කමිටුවෙන් අයින් කරනවා.මොකක්ද මේකෙ තේරුම.සභාපතිතුමාද උපසභාපතිතුමාද මේ තීන්දු ගන්නේ.කොට්ඨාශ මන්ත්‍රීවරයොද ගන්නේ.ඒ නිසා ඔයාලගෙ මේ වම්පසයි දකුණුපසයි, උපසභාපතිතුමා මතක තියාගන්න මේවා.මේවා අපි නොකියා ඉන්න කාරණා මේවා.මේවගේ ගැහැණුන්ට තීරණ ගන්න දෙන්න එපා මේකේ.ඔබතුමා සභාපතිවරයා, ඔබතුමා උපසභාපතිවරයා, කොට්ඨාශ මන්ත්‍රීවරයාට අපි අයින් කරන්න තියෙන ප්‍රශ්නය.අපි කුපාඩියොද, අපි හොරුද, අපි මං කොල්ලකාරයොද, අපි පොදුජන පෙරමුණේ මහජන නියෝජිතයෙක් විදිහට ඉන්නේ.මං මේ ඇත්ත කියන්නේ.කොහෙවත් ඉන්න ගැණියෙක් කොහොමද තීන්දු ගන්නේ.අපි සම්බන්ධිකරණයට ගියත්, අපි හරි දේ කතා කරන්නේ.අපි යෝජනා කරනවා මේ සභාවට, අපි සුදුසු නැද්ද ඒ කමිටුවලට.හැම පක්ෂයක් ම නියෝජනය කරන්න ඕනේ.මට කියන්න මෙතන අපේ 16 දෙනාගෙන් කවුද ගත්තේ කියලා.ඔක්කො ම අයින් කළා.මීන්නානේ කමිටුවකට යන්න බෑ.ගොවි සංවිධානයට යන්න බෑ.මොකක්ද මේ තියෙන බලු වැඩ.ඔයාල මෙතන කතා කරනවා.උපසභාපතිතුමා මෙතන කතා කරනවා සහයෝගයෙන් කරමු කියලා.එහෙනම් ගමට ගෙනියන්න මේ සහයෝගය.ගමෙන් පටන් ගන්න මේ සහයෝගය.ඒ නිසා මේ යථාර්ථය, මේ කතා කරන දේ හදවතින් ම, සාමාන්‍යයෙන් අපේ භාෂාවෙන් කිවුවොත් බොක්කෙන් කරන්නේ සභාපතිතුමා.මෙතන එකක් එතන එකක් කතා කරන්න එපා.ඒ ගමේ ඉන්න ගෑණුන්ට කියලා තීන්දු ගන්න කොට, මට සලකන්න එපා,ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයට සලකන්න කියන්න.ඕව වෙනස් කරලා එන්න.එතකොට අපි උදව් කරන්නම්.

**සභාපතිතුමා :-**
අපි එහෙනම් ඉස්සරහට යන් නේද.අපිට වෙනත් කාරණා තියෙනවානේ මන්ත්‍රීතුමා.අපි තාම පටන් ගත්තෙත් නෑ. ආරියදාස මන්ත්‍රීතුමා සමාවෙන්න.

විශේෂ යෝජනාවක් තියෙනවා. නගර සැලැස්ම පිළිබඳව. ඒ පිළිබඳව 2026.02.12 වෙනි දින තිබෙනවා උදේ ඉඳන් සවස 3.30 වෙනකන් නගර සැලසුම පිළිබඳ ප්‍රසන්ටේෂන් එකක්.ඒකට ආයතන හැත්තෑ ගානකට වැඩි ප්‍රමාණයක් සහභාගී වෙනවා.ඒකට සීමා සහිත නිසා මන්ත්‍රී කණ්ඩායමෙන් 04 දෙනයි සහභාගී වෙන්නේ.ඔබතුමන්ලාටත් පුළුවන් එන්න.එකට නගරයේ ඉන්න 04 දෙනෙක් සහභාගී කරවන්න. නගර

කලාපයේ ඉන්න 04 දෙනා, ඒ කියන්නේ යකුදාගොඩ, කැන්දන්ගමුව, මීන්නාන, මොරගල.ඒ නිසා ඔයාල කතා කරලා හතරදෙනෙකුට සීමා කළොත් හොඳයි,මේ මාසෙ 12 වෙනිදා ලෆායට් හෝටලයේ උදේ 9.00 සිට සවස 3.30 වෙනකන් තියෙනවා.නාගරික සංවර්ධන අධිකාරියෙන් කරන්නේ. ගයේෂාන් මන්ත්‍රීතුමා පුළුවන්නම් එන්න. සියලු දෙනාගේ ම අදහස් වටිනවා.

**සභික පී.මාලින්ද මුදන්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඇත්තට ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා විපක්ෂයටත් අවස්ථාව ලබාදීම පිළිබඳව.අපි Facebook එකෙන් දැක්කා.කලින් තිබුණ සාකච්ඡා වට වලට අපිට ආරාධනා කරලා ලැබුණේ නැහැ.ඒ කියන්නේ විපක්ෂයේ කට්ටිය නිකන් කොන් කරලා වගේ.මම දැක්කා සාකච්ඡා කරලා Facebook එකේ දාලා තියෙනවා.සභාපතිතුමා සද්භාවයෙන් අපිට එහෙම ආරාධනා කරනවා නම් ඇත්තට ම අපි එනවා.අපි කලින් දිලීන් මන්ත්‍රීතුමා සහ ගයේෂාන් මන්ත්‍රීතුමා සමග කතා වුණා.අපි ඇත්තට ම හිතුවා අපිට ආරාධනා කළේ නැත්නම් අපි යන්න ඕනි නැහැ කියලා. මොකද අපි මහජන නියෝජිතයින් ලෙස කවුරු හරි, මොකෙන් හරි, කුමන හෝ මාර්ගයකින් අපිව පත්කරලා එවලා තියෙනවා.ඒ නිසා ඔබතුමා කුමන හෝ සංවර්ධන කටයුත්තක් කරනවා නම් ඇත්තට ම අපිට මේ වෙලාවේ ආරාධනා කිරීම ගැන මේ වෙලාවේ ස්තුතිවන්ත වෙනවා. නමුත් එහෙම කොන් කරන්න එපා. ඔයගොල්ලෝ හැම වෙලාවෙ ම අපිව කොන් කරනවා.එහෙම කරන්න එපා.ඉස්සරහට මොනව හරි සංවර්ධන කටයුත්තක් කරනවා නම්, විපක්ෂයේ කියලා කාර්යභාරයක් කරන්න අපිව පොඩ්ඩක් මොනවට හරි සම්බන්ධ කර ගන්න.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, නගර සැලැස්ම ගැන කතා කරන කොට අපේ හිටපු ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ආර්.ධනරත්න මන්ත්‍රීතුමා ජනාධිපතිතුමාට ලිවුමක් යවලා තිබෙනවා මේ සම්බන්ධව.ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී, ගරු විපක්ෂ නායක සජිත් ප්‍රේමදාස මැතිතුමාට, හිටපු අමාත්‍ය ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නාමල් රාජපක්ෂ මැතිතුමාට,සර්වජනබලයේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී දිලීත් ජයවීර මැතිතුමාට, ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ සියලුම මන්ත්‍රීතුමන්ලාට තියෙන්නේ.මම ඒක ඔබතුමාට යොමු කරනවා.ඒ සම්බන්ධව ගරු හිටපු මන්ත්‍රීවරයෙක් ලෙස එවල තියෙනවා.ඒ සම්බන්ධව ඔබතුමා කටයුතු කරන්න.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමා, නාගරික සංවර්ධනය කොට, දැනට අත්පත් කරගෙන තියෙන ඉඩම්වල විශාල වහයෙන් ඉදි කිරීම් දැනටත් සිද්ධ වෙනවා.සුමිත් මන්ත්‍රීතුමා යෝජනා කරලා තිබුණා ඉදිකිරීම් කරන එකට මැදිහත් වීම නතර කරන්න කියලා. දැනට අත්පත්කරගෙන තියෙන ඉඩම්වල ඉදිකිරීම් කළා ම නැවත ඉවත් කිරීමට නඩු කටයුත්තකට යන්න පුළුවන්.වෙනත් හේතු නිසා ඒවා ඉවත් කිරීම ගැටළු සහගත වෙන්න පුළුවන්.මේකට විශේෂ අවධානය යොමු කරන්න.ඒ නිසා අත්පත්කරගෙන තියෙන ඉඩම් ටිකවත් රැකගන්න උත්සාහ කරන්න.වැඩිපුර ම ඉදිකිරීම් කරලා තියෙන්නේ NPP එක කියලා තමයි අපිට තොරතුරු ලැබිලා තියෙන්නේ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,අනවසර ඉදිකිරීම් ඔක්කොම ඉවත් කරනවා නේද?

**සභාපතිතුමා :-**
ඇත්තට ම අනවසර ඉදිකිරීම් අපිත් දැකලා තියෙනවා.සමහර වෙලාවට සමහරු මුදල් වියදම් කරලා කරනවා.ඇත්තට ම කියලා තියෙන්නේ සියලු දෙනාට ම හිතවත්කම්,ඒවා මුකුත්ම ඉතුරු වෙන්නේ නැහැ.අනිවාර්යයෙන්ම නීතිය සැමට එක හා සමානව කරනවා.ඒ ටික ගලවනවා. අපි කවුරුත් දන්නවා 2013 තමයි ඒක පවරා ගත්තේ.කඩවල් 03 ක් වගේ තමයි මම දන්නේ ඉදිකරනවා ඒ භූමියේ. මීට අවුරුදු තුන හතරක ඉඳන්ම කර ගෙන යන එකක්.සමහර විට මේ පාර ඔවුන් උදව් කරන්න ඇති අපිට.ඒ නිසා එහෙම හිතෙන්න ඇති.නමුත් අපිට ඒ වැඩේ කරන්න බැහැ.ඒ නිසා කිසිම ගැටළුවක් හිතන්න එපා.අපි ඒ සියල්ල ඉවත් කරනවා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මට මතකයි 2025-11-04 දින තිබුණ සම්බන්ධීකරණ රැස්වීමේදී ඔබතුමයි, උපසභාපතිතුමයි දෙන්න ම හිටියා.ගරු සභාපතිතුමයි, මාර්ග සංවර්ධන අධිකාරියේ අයයි හිටියා.මේ නගරය මැද දැන් අපිට පේනවා.අපිට පේන තෙක් මානයේ අනවසර ඉදිකිරීම් තියෙනවා.එතකොට ඔබතුමා ඒ සම්බන්ධව ක්‍රියාමාර්ගයක් ගත්තද?.මොකක්ද ඒ සම්බන්ධ වැඩපිළිවෙල?මේ සීමාවේ තියෙනවී.ඒ සම්බන්ධීකරණයෙන් පස්සේ ඒ සම්බන්ධයෙන් ගත්ත ක්‍රියාමාර්ග මොනවාද?

**සභාපතිතුමා :-**
ඇත්තට ම ඒක තමා අපි 12 වෙනිදා සිදු කරන්නේ. ඔය ටික තමා කතා කරන්නේ.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
කිසිම භේදයක් බලන්න එපා.සමහර මිනිස්සු, දැන් අපි දකිනවා අපේ පුස්තකාලය තියෙන සීමාවේ ගොඩක් දේවල් වෙනවා. සියල්ලට ම ඒ රාජකාරිය කරමු .ඔබතුමාට ලොකු වගකීමක්.අපි සහයෝගය දෙනවා.

**සභාපතිතුමා :-**
අනිවාර්යයෙන් ම.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, නාගරික සංවර්ධන අධිකාරිය සමඟ මෙම 12 වෙනිදා තිබෙන්නේ සියලුම රාජ්‍ය ආයතන,වෙළඳ සංගම්, මහජන නියෝජිතයින් ගෙන්වලා සාකච්ඡා කරලා දැනටමත් හදලා තියෙන්නේ.ඇහැලියගොඩ නගර සංවර්ධනය පිළිබඳව ඔවුන් දැනටමත් හදල තියෙන මූලික සැලසුම් ටික කතා කරලා, අඩුපාඩු කතා කරලා, ඒවා කොහොමද සාර්ථක කරගන්නේ කියන එක.ආයතන ගතහොත්

හැත්තෑ ගනණක් තියෙනවා මං හිතන්නේ.ඒ නිසා නගර සංවර්ධනය සම්බන්ධව සියලු ම ගැටළු, යෝජනා ,අදහස් තියෙන්න පුළුවන් .අපි ඒවා එතනදි සාකච්ඡා කරනවා.

**සභාපතිතුමා :-**
**03. මහා සභාවට පැමිණිය නොහැකි බව දන්වා ඇති ලිපි සභාගත කිරිම.**
ගරු ප්‍රාදේශිය සභා ගරු මන්ත්‍රී රංජිත් බණ්ඩාර මැතිතුමා ලිපියක් එවා තිබෙනවා ප්‍රාදේශිය සභා රැස්වීමට පැමිණීමට නොහැකි බව දන්වා ලිපියක් එවලා තියෙනවා.දං ඒක මේ මොහෙතේ සභාගත කරනවා.
ප්‍රාදේශිය සභා රැස්විමට සහාගීවිමට නොහැකි බව දන්වා සිටිමි.ඉහත නම් සඳහන් මා හට 2026.02.10 වන අද දින පැවැත්වෙන රැස්වීම සඳහා සහභාගීවීමට නොහැකි වන බව කාරුණිකව දන්වා සිටිමි.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම නිවාඩු අනුමත කිරීමේ යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
**04.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්,පැමිණිලි හා සන්නිවේදන.**
කිසිවක් ලැබී නැත.

**සභාපතිතුමා :-**
**05.යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.**
කිසිවක් ලැබී නැත.

**සභාපතිතුමා :-**
**06. යථා පරිදි කල් දී ඇති යෝජනා.**
කිසිවක් ලැබී නැත.

**සභාපතිතුමා :-**
**06.යථා පරිදි කල් දී ඇති යෝජනා.**

**සභාපතිතුමා :-**
සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.01 යෝජනාව
**06.01.ඇහැලියගොඩ බස් නැවැතුම්පල අසල කඩ කාමර 10 සඳහා නියෝජ්‍ය ප්‍රධාන තක්සේරුකරු (වැ.බ.)ගේ අංක RT/RP/1248 හා 2026.01.08 දින ලද තක්සේරු වාර්ථාව අනුව 2026 මාර්තු මස සිට මාසික බදු කුලිය අය කිරීම සඳහා මම යෝජනා කරමි.**

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකහතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.01 යෝජනාව, ඇහැලියගොඩ බස් නැවැතුම්පල අසල කඩ කාමර 10 සඳහා නියෝජ්‍ය ප්‍රධාන තක්සේරුකරු (වැ.බ.)ගේ අංක RT/RP/1248 හා 2026.01.08 දින ලද තක්සේරු වාර්ථාව අනුව 2026 මාර්තු මස සිට මාසික බදු කුලිය අය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.02 යෝජනාව

**06.02.2025 වර්ෂය සඳහා ඇහැලියගොඩ එළ ගව මස් වෙළෙඳසැල බදු ගිවිසුම් අත්සන් කිරීම වෙනුවෙන් තබන ලද ගිවිසුම් ඇප මුදල වන රු.1,193,845.25ක මුදල එම්.ආර්. නස්රි මොහොමඩ් මයා වෙත ආපසු ගෙවීම සඳහා මම යෝජනා කරමි.**

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකහතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.02 යෝජනාව, 2025 වර්ෂය සඳහා ඇහැලියගොඩ එළ ගව මස් වෙළෙඳසැල බදු ගිවිසුම් අත්සන් කිරීම වෙනුවෙන් තබන ලද ගිවිසුම් ඇප මුදල වන රු.1,193,845.25ක මුදල එම්.ආර්. නස්රි මොහොමඩ් මයා වෙත ආපසු ගෙවීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.03 යෝජනාව
**06.03.සබරගමු පළාත් පාලන කොමසාරිස්ගේ අංක CLG/LG/-5/3/1- (IV වෙළුම) හා 2026.01.01 දිනැති ලිපිය අනුව අප ප්‍රාදේශීය සභාව සතු පහත සඳහන් වෙළෙඳ ස්ථාන වල බදුකරුවන්ගේ අතුරු බදු දීම් නියමානුකුල කිරීමට අදාල තොරතුරුමහා සභා අනුමැතියෙන් ගරු ආණ්ඩුකාරතුමිගේ ද අනුමැතිය ලබා ගැනීම යොමු කිරීම සඳහා මමයෝජනා කරමි.**

| අනු අංක | කඩ කාමරය පිහිටි ස්ථානය | පළමු බදුකරු | අතුරු බදුකරු |
|---|---|---|---|
| 01 | වෙළෙඳ සංකීර්ණය පළමු මහල අංක 05 | ප්‍රභාත් ප්‍රසන්න ගම්ලත් මයා | ඩබ්.නිමල් කරුණාතිලක මයා |
| 02 | වෙළෙඳ සංකීර්ණය පළමු | යූ.එල්.ඩී.අජිත් ආනන්ද මයා | ජී.ඒ.චූලසේන මයා |

| | | | |
|---|---|---|---|
| | **මහල අංක 07** | | |
| **03** | **වෙළෙඳ සංකීර්ණය පළමු මහල අංක 09** | **චිත්‍රා උපුල් රණසිංහ මයා** | **ජේ.ඒ.ඩී.සුනේත්‍රා රණසිංහ මයා** |
| **04** | **වෙළෙඳ සංකීර්ණය පළමු මහල අංක 10** | **එච්.එම්.ටී.වීරවංශ මයා** | **එච් සිරිසේන මයා** |
| **05** | **වෙළෙඳ සංකීර්ණය පළමු මහල අංක 14** | **එම් සී එම් නිෂාම් මයා** | **ඒ.එස්.වීරසිංහ මයා** |
| **06** | **වෙළෙඳ සංකීර්ණය පළමු මහල අංක 15** | **ජී.එස්.එම්.කේ.විජේසූරිය මයා** | **ජගත් ප්‍රේමලාල් පින්නගොඩ විතාන මයා** |
| **07** | **වෙළෙඳ සංකීර්ණය බිම් මහල අංක 07** | **ඒ.ඒකොඩිප්පිලි මයා** | **විශ්මි නවෝදාා අබේසිංකොඩිප්පිලි මිය** |
| **08** | **බස් නැවැතුම්පල අසල අංක 01** | **එම්.පී.සුමිත් ජයසිංහ මයා, පී.සුනිල් චන්ද්‍ර මයා** | **එල්.ගුණසේගරන් මයා** |
| **09** | **බස් නැවැතුම්පල අසල අංක 03** | **වෙ.ලෙ.මොහොමදූ රියාදූ මයා** | **ඩී.එම්.එස්.කුමාරසිංහ මිය** |
| **10.** | **බස් නැවැතුම්පල අසල අංක 07** | **ඒ.එල්.ඒ.ඉක්බාල් මයා** | **ඊ.ඩබ්.නිහාල් පද්මසිරි මයා** |

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.03 යෝජනාව, සබරගමු පළාත් පාලන කොමසාරිස්ගේ අංක CLG/LG/-5/3/1- (IV වෙළුම) හා 2026.01.01 දිනැති ලිපිය අනුව අප ප්‍රාදේශීය සභාව සතු පහත සඳහන් වෙළෙඳ ස්ථාන වල බදුකරුවන්ගේ අතුරු බදු දීම් නියමානුකුල කිරීමට අදාල තොරතුරු මහා සභා අනුමැතියෙන් ගරු ආණ්ඩුකාරතුමිගේ ද අනුමැතිය ලබා ගැනීම යොමු කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

| අනු අංක | කඩ කාමරය පිහිටි ස්ථානය | පළමු බදුකරු | අතුරු බදුකරු |
|---|---|---|---|
| 01 | වෙළෙඳ සංකීර්ණය පළමු මහල අංක 05 | ප්‍රභාත් ප්‍රසන්න ගම්ලත් මයා | ඩබ්.නිමල් කරුණාතිලක මයා |
| 02 | වෙළෙඳ සංකීර්ණය පළමු මහල අංක 07 | යූ.එල්.ඩී.අජිත් ආනන්ද මයා | ජී.ඒ.චූලසේන මයා |
| 03 | වෙළෙඳ සංකීර්ණය පළමු මහල අංක 09 | චිත්‍රා උපුල් රණසිංහ මයා | ජේ.ඒ.ඩී.සුනේත්‍රා රණසිංහ මයා |
| 04 | වෙළෙඳ සංකීර්ණය පළමු මහල අංක 10 | එච්.එම්.ටී.වීරවංශ මයා | එච් සිරිසේන මයා |
| 05 | වෙළෙඳ සංකීර්ණය පළමු මහල අංක 14 | එම් සී එම් නිෂාම් මයා | ඒ.එස්.වීරසිංහ මයා |
| 06 | වෙළෙඳ සංකීර්ණය පළමු මහල අංක 15 | ජී.එස්.එම්.කේ.විජේසූරිය මයා | ජගත් ප්‍රේමලාල් පින්නගොඩ විතාන මයා |
| 07 | වෙළෙඳ සංකීර්ණය බිම් මහල අංක 07 | ඒ.ඒකොඩිප්පිලි මයා | විශ්මි නවෝදාා අබේසිංකොඩිප්පිලි මිය |
| 08 | බස් නැවැතුම්පල අසල අංක 01 | එම්.පී.සුමිත් ජයසිංහ මයා, පී.සුනිල් චන්ද්‍ර මයා | එල්.ගුණසේගරන් මයා |
| 09 | බස් නැවැතුම්පල අසල අංක 03 | වෙ.ලෙ.මොහොමදූ රියාදූ මයා | ඩී.එම්.එස්.කුමාරසිංහ මිය |
| 10. | බස් නැවැතුම්පල අසල අංක 07 | ඒ.එල්.ඒ.ඉක්බාල් මයා | ඊ.ඩබ්.නිහාල් පද්මසිරි මයා |

**සභාපතිතුමා :-**
සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.04 යෝජනාව
**06.04.2026 ජනවාරි මස ගෙවීම් වාර්තාව සහා අනුමැතිය සඳහා යෝජනා කරමි.**

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඩී.ජී.ගයේෂාන් චින්ත කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඔබතුමා ඉදිරිපත් කරපු 2026 ජනවාරි මස ගෙවීම් වාර්තාවෙහි පෞද්ගලික ලේකම්වරයාට දීමනා ගෙවීම් කියලා තියෙනවා.ඒක රු.15,500.00 ද, රු.17,500.00 ද?

**සභාපතිතුමා :-**

රු. 15000.00 ක් තමයි නිර්දේශ කර තිබෙන්නේ.එහි රු.17500.00 ලෙස වැඩි වී තිබෙන්නේ ,සේවක අර්ථ සාධක අරමුදල 12%ක් සහ EPF එකට තමා ඉතිරි 3%.

**සභික ඩී.ජී.ගයේෂාන් චින්ත කරුණාරත්න මැතිතුමා:-**
අවශ්‍ය නම් දීමනාව වැඩිකර ගන්න පුළුවන් ඒක ගැටළුවක් නැහැ. ගිය පාර සභා වාර්තාවේ තිබුනේ රු.15000.00යි කියලානේ. නමුත් දැන් අපි ඊට වඩා වැඩි ප්‍රමාණයක් තමයි අනුමත කරගන්න යන්නේ. EPF සහ ETF එකත් මේක අස්සේ නේද තියෙන්න ඕනේ?

**සභාපතිතුමා :-**
සාමාන්‍යයෙන් අපි වැටුපක් තීරණය කළ විට 12% සහ 3% ඒක රජයේ. රජයේ නම් රජයේ ව්‍යාපාරික නම් ව්‍යාපාරික . 8% තමයි අපි එයාගෙන් කපන්නේ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
සභාපතිතුමනි,මොන පදනමකින්ද ඒ ලේකම්තුමා බඳවාගෙන ඉන්නේ.පදනම් කීපයක් තියෙනවනේ.

**සභාපතිතුමා :-**
තත්කාර්ය පදනමින්

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
තත්කාර්ය පදනම මත බඳවා ගන්නා සියලු දෙනාට ම අපි අනුමත කරන දීමනාවට එහා ගිහිල්ලා EPF, ETF සඳහා යම්කිසි මුදලක් සභාව වෙන් කරනවා කියන කාරණාවනේ මෙතන කියන්නේ.දැන් අපි මේ ගන්න තීරණය කවුරුහරි නිලධාරියෙක් ඊළඟට බඳවා ගත්තොත් එහෙම ඔහුටත් වලංගුයි. මෙච්චර කල් එහෙම වුණාද කියන එක මට පොඩි ගැටළුවක් තියෙනවා.කලින් සභාපතිවරුන්ටත් ලේකම්වරු සිටියා.එයාලටත් අපි සභාවෙන් 15,000.00 ක මුදලක් අනුමත කළා.නමුත් කවදාවත් ගෙවීම් වාර්තා වල රු.17500.00 කියන එක තිබුණ් නැහැ.මෙතන මොකක් හරි මූල්‍ය අක්‍රමිකතාවයක් හරි මොනව හරි ප්‍රශ්නයක් හරි වුණොත්, මේ අපිව සම්බන්ධ කර ගන්න එපා අධිහාරයට.

**සභාපතිතුමා :-**
මීට පෙර හිටිය සභාපතිතුමා සන්දනායක මන්ත්‍රීතුමාට, එතුමත් ඔබතුමන්ලා වගේ සුහදව කතා බහ කරලා ඉන්නවා.එතුමා කිවුව පළවෙනි එක තමයි තත්කාර්ය පදනමේ ඉන්න සියලුම අයටත් EPF සහ ETF හදන්න කිවුවා. එයාට නඩුවක් යනවා කිවුවා.ඒ නිසා මං විෂය නිළධාරීතුමියට කිවුවා, ඒ අයට EPF, ETF ගෙවන්න කියලා.මං හිතන්නේ ඒ නඩුව තාම ඉවර නෑ.මං හිතන්නේ එයා ඒ මුදල ගෙවන්න කැමති වුණත්, එයා කිවුවේ මාත් එක්ක , ගෙවුවොත් මේක පූර්වාදර්ශයක් යනවා කිවුවා.ඇත්තට ම මේකට විෂයභාර නිලධාරීත් වගකියන්නත් ඕනෙනේ.හැබැයි ඒ මුකුත් ම නෑ.කෙලින් ම සභාපතිට දාල තියෙන්නේ.ඒයා මේකට නඩු කියනවා.තාම ඒක විසඳිලා නෑ.ඒකයි අපි එහෙම කළේ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
මේ පිළිබඳව සාකච්ඡාවකින් පසු මට තීරණයක් දෙන්න පුළුවන්. එතෙක් අපි 16 දෙනාට මේ සඳහා ඒකමතික තීරණයක් ලබාදෙන්න බැහැ.

**සභාපතිතුමා :-**
ඒ සඳහා අපි රු.15000.00ක් තමයි දෙන්නේ.පුද්ගලික හෝ රාජ්‍ය අශයේ සේවකයෙකුට ලැබෙන පඩිය, ඒ අනුමත පඩියට 12% ක් EPF සහ ETF 12% සහ 3% රු. 15000.00 ට එකතු වෙනවා. 8% ක් කැපෙනවා.ඒක අනිවාර්යෙන් ම නිලධාරියාගෙන් කැපෙනවා.ඒක තමයි ක්‍රමවේදය තියෙන්නේ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
සභාපතිතුමනි ඒත් රු.250.00ක් වැඩියි.රු.17500.00 නේ දාල තියෙන්නේ.මේ ක 17,250.00 ක් තමා වෙන්න ඕනේ.

**සභාපතිතුමා :-**
නෑ. රු.17250.00 තමයි තියෙන්නේ.ඒක ඒකමතිකව සම්මත වෙනවා මන්ත්‍රීතුමා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.04 යෝජනාව, 2026 ජනවාරි මස ගෙවීම් වාර්තාව සහ අනුමැතිය සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහ සම්මත විය.

**සභාපතිතුමා :-**
සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.05 යෝජනාව
**06.05.ආයුර්වේදවල රෝගීන් සඳහා ප්‍රතිකාර කිරීමේ කටයුතු සඳහා අවශ්‍ය වන ගැස් ලබා ගැනීම සඳහා සභා අරමුදලින් වියදම් දැරීමට යෝජනා කරමි.**

**සභික ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික දිලීක් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපි කැමති නෑ මේ වගේ ඒවා සභා වර්තාවේ තියෙනවට.මොකද ඔබතුමන්ලා කියනව නම්, මේ වතුර බොන්න කියලා (සෝෂාව) මේවා සභා වාර්තාවේ ලියා ගන්න.මේ වතුර වීදුරුව කොපමණ දුරට ගුණාත්මක ද කියලා අපි දන්නේ නැහැ. අපි දන්න තොරතුරු අනුව මෙම ප්‍රාදේශීය සභාවේ පානීය ජලය

PHI විසින් බීමට සුදුසු නැහැ කියලා නිර්දේශ දීලා තියෙනවා කියලා තමයි අපි අන්තිමට දන්නේ.ඉතින් අපිට මේවා බොන්න කියල ද කියන්නේ.

(ඝෝෂාව)

**සභාපතිතුමා :-**
මොකක් හරි වුණා නම් අපි සුහදව විසඳ ගනිමු.මට මොකුත් කියන ඒවා ඇහෙන් නෑ.

**සභාපතිතුමා :-**
සභාව විනාඩි 10 කට කල්තියෙනවා.

**සභාපතිතුමා :-**
අපි සභාව නැවතත් ආරම්භ කරනවා.

**සභාපතිතුමා :-**
ගරු මන්ත්‍රීතුමන්ලා, අපි ඊයේ කෑම ලැයිස්තුව හදන කොට තමා තීරණය කලේ වතුර බොතල් දෙන් නැතුව වතුර වීදුරුවක් තියන්න.සමා වෙන්න.අපි ඒක වෙනස් කරලා වතුර ගේමු.ඒක කිසි ම අවුලක් නෑ.අපි ඔයාල කරන යෝජනා අපිත් ගන්නවනේ.රු.12000.00 ට වැඩි වෙන නිසා තමා අපි සාකච්ඡා කරලා තමා මෙහෙම කළේ.කිසිම මන්ත්‍රී කෙනෙක් දන්නේ නෑ මේක.දොස් කියන එක මට කියන්න.අපි ඊළඟ පාර ඉඳන් වතුර ගේමු.මිස් ඊළඟ වතුර ගේන්න හදන්න.මේක මෙච්චර කෑ ගහන්න දෙයක් නෙමෙයි.ඔයාල කියන ඒවා අපි සභාවේ අනුමත කරනවා.ඇත්තටම මම දන්නෑ.මම බත් කාල බොන්නෙත් මේකෙ වතුර.(ඝෝෂාව)

**සභික දිලීක් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපිට මේක සුහදව කතා කරලා ඉවර කරන්න තිබුනා. හැබැයි අපේ මේ ආණ්ඩු පක්ෂයේ ඉන්න මන්ත්‍රීවරු කිහිපදෙනෙක් මුන්සීර් මන්ත්‍රීතුමා, එතන දී සභාපති වෙන්න ගියා ඒකයි වැරැද්ද වුණේ. කතා කරපු විදිහ හොඳ නැහැ එතන.දැන් සුජීව මන්ත්‍රීතුමා කතා කරන්න නැගිට්ටා.මුන්සීර් මන්ත්‍රීතුමා වාඩි කරවන්න හැදුවා.සභාපතිතුමනි කියන්න මුන්සීර් මන්ත්‍රීතුමාට සභිකයො මේ පැත්තේ ඉන්න මන්ත්‍රීවරු වාඩි කරවන්න බැහැ. හිතන්නවත් එපා.
අනිත් කාරණාව තමයි මෙතන මම පැහැදිලි කළේ මේ වතුර බිමට සුදුසු නෑ කියල තමා අපි දැනුවත්.ඉතින් අපිට ඔබතුමා කලින් දැනුවත් කරලා තිබුණේ නැහැ ගෙදරින් වතුර බෝතලයක් ගේන්න කියලා.හැබැයි සමහරු ගෙනල්ලා පෙන්නනවා ගෙදරින් වතුර ගෙනාව කියලා.එතනත් අවුලක් අපිට තියෙනවා.මම දැක්කා ලේකම්තුමාගේ ඉස්සරහ වතුර බෝතලයක් තියෙනවා. තවත් බෝතල් කිහිපයක් දැක්කා.හැබැයි මැසේජ් එකක් දාල තිබුණා නම් වතුර දෙන්නේ නැහැ, අපිට මේකත් කප්පාදු කරන්න වෙනවා, අපේ කාර්යක්ෂමතාවය වැඩි කරන්න.ආණ්ඩුවේ මුදල් මහා භාණ්ඩාගාරයේ ඉතිරි කරන්න.මේකෙ ඉන්න මන්ත්‍රීවරුන්ගේ වතුර බෝතලය කප්පාදු කරනවා කියලා මැසේජ් එක දැම්මා නම්, අපි ගේනවා.ඔන්න ඔය ප්‍රශ්නය තමයි වුණේ.අපිට මේ වතුර බොන්න කියලා, අපිට හොඳ නැති වතුර පොවන්න ලෑස්ති වෙන්න එපා.අපි අනිත් දවසේ වතුර බෝතලයක් ගේන්නම් ගෙදරින්.ඉතින් ඔන්න ඕක තමයි ගැටළුව වුණේ.ඒවා කරන්න එපා. එහෙම කරන එක හොඳ නැහැ. තව රාජකාරි තියෙනවා අපිට කරන්න.ජනතාව වෙනුවෙන් තමා අපිත් මේකට ඇවිල්ලා තියෙන්නේ කියන එක කරුණාකරලා ඔබතුමාට මතක් කරනවා.

**සභාපතිතුමා :-**
අපි ඉදිරියට යමු .බොහොමත්ම ස්තුතියි.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.05 යෝජනාව, ආයුර්වේදවල රෝගීන් සඳහා ප්‍රතිකාර කිරීමේ කටයුතු සඳහා අවශ්‍ය වන ගෑස් ලබා ගැනීම සඳහා සභා අරමුදලින් වියදම් දැරීමට වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.06 යෝජනාව
**06.06.2025 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණයේ වාර්තාව මහා සභා අනුමැතිය සඳහා යෝජනා කරමි.**

**සභාපතිතුමා :-**
එම යෝජනාව මෙසේ සංශෝධනය වෙන්න ඕනේ.මං සංශෝධන යෝජනාව ඉදිරිපත් කරමි.

සංශෝධිත යෝජනාව**:-**
**2025 වසරට අදාලව සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණය අනුව වෙන්දේසි ලැයිස්තු වල සඳහන් සහ වෙන්දේසි කිරීමට නිර්දේශ කර ඇති භාණ්ඩ වෙන්දේසි කිරීමටත්, විනාශ කිරීමට නිර්දේශ කර ඇති හා විනාශ කිරීමේ ලැයිස්තු වල සඳහන් ඖෂධ, භාණ්ඩ හා පොත් විනාශ කිරීමටත්, ඌණ ලෙස සඳහන් කර ඇති භාණ්ඩ හා පොත් වෙනුවෙන් මුදල් අය කිරීමටත්, තබා ගන්නා ලෙසට නිර්දේශ කර නොමැති අබලි ද්‍රව්‍ය වෙන්දේසි කර, වෙන්දේසි නොවී ඉතිරි වන අබලි ද්‍රව්‍ය විනාශ කිරීමටත්, ඉදිරිපත් කර ඇති අනෙකුත් නිර්දේශ ක්‍රියාත්මක කිරීමටත් 2025 වසරට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මහ සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.**

**සභික සභික පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික පී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, 2025 භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මේක අද උදේ අපිට දුන්නේ. වේලාසන ලබා දුන්නා නම් වැදගත් කියන කාරණාව මම ඉදිරිපත් කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.06 යෝජනාව, 2025 වසරට අදාලව සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණය අනුව වෙන්දේසි ලැයිස්තු වල සඳහන් සහ වෙන්දේසි කිරිමට නිර්දේශ කර ඇති භාණ්ඩ වෙන්දේසි කිරීමටත්, විනාශ කිරීමට නිර්දේශ කර ඇති හා විනාශ කිරිමේ ලැයිස්තු වල සඳහන් ඖෂධ, භාණ්ඩ හා පොත් විනාශ කිරීමටත්, ඌණ ලෙස සඳහන් කර ඇති භාණ්ඩ හා පොත් වෙනුවෙන් මුදල් අය කිරීමටත්, තබා ගන්නා ලෙසට නිර්දේශ කර නොමැති අබලි ද්‍රව්‍ය වෙන්දේසි කර, වෙන්දේසි නොවී ඉතිරි වන අබලි ද්‍රව්‍ය විනාශ කිරීමටත්, ඉදිරිපත් කර ඇති අනෙකුත් නිර්දේශ ක්‍රියාත්මක කිරීමටත් 2025 වසරට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මහ සභා අනුමැතිය සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.07 යෝජනාව
**06.07.2026 වර්ෂයේ තිරසර සංවර්ධන සැලැස්ම අනුමත කිරිම සඳහා යෝජනා කරමි.**

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, වට්ස්ඇප් මැසේජ් එකක් දාලා තිබ්බා මන්ත්‍රීවරුන්ගේ පුහුණුවක් ගැන.තිරසාර සංවර්ධන සැලැස්ම යටතේ තියෙනවානේ පුහුණුවීම් ගැන වට්ස් ඇප් මැසේජ් එකක් දාල තිබ්බා.ඒ යටතේ තියෙනවා මම දැක්කා මන්ත්‍රීවරුන්ට සහභාගී වෙන්න පුළුවන් කියලා පුහුණු වීමක් . මේ සඳහා එක සභිකයෙකුගෙන් රු.5000.00ක මුදලක් අය කරනවා. ඉතින් අපි සභාවෙන් මේ මන්ත්‍රීවරු යවමු පුහුණු වෙන්න.මේ පුහුණුව වැදගත්.ඒ සඳහා සභිකයින්ට සභා අරමුදලින් මුදල් දීල ඒ සභිකයින් පුහුණුව දීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.07 යෝජනාව, 2026 වර්ෂයේ තිරසර සංවර්ධන සැලැස්ම අනුමත කිරිම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.08 යෝජනාව
**06.08.මාස 03 න් 03 සේවය බණ්ඩනය වන පරිදි බඳවා ගැනීමට අනුමත වී ඇති සෞඛ්‍ය කම්කරුවන් දෙදෙනා සඳහා ගිවිසුම්ගත වීමටත් ගිවිසුම්ගත වීමෙන් පසු සේවය කිරීම වෙනුවෙන් වැටුප් හා දීමනා ගෙවීමටත් පහත නම් සඳහන් කම්කරුවන් දෙදෙනා බඳවා ගැනීම සඳහා යෝජනා කරමි.**

**01.ඩබ්ලිව්. එල්. ඒ. සුසන්ත කුමාර මයා (සෞඛ්‍ය කම්කරු)**
**02.එම්. ඩබ්ලිව්. ඉන්දික ප්‍රදීප් කුමාර මයා (සෞඛ්‍ය කම්කරු)**

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මොන පදනම ද? කොන්ත්‍රාත් පදනම ද?

**සභාපතිතුමා :-**
කොන්ත්‍රාත් පදනම.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.08 යෝජනාව, මාස 03 න් 03 සේවය බණ්ඩනය වන පරිදි බඳවා ගැනීමට අනුමත වී ඇති සෞඛ්‍ය කම්කරුවන් දෙදෙනා සඳහා ගිවිසුම්ගත වීමටත් ගිවිසුම්ගත වීමෙන් පසු සේවය කිරීම වෙනුවෙන් වැටුප් හා දීමනා ගෙවීමටත් ඩබ්ලිව්. එල්. ඒ. සුසන්ත කුමාර මයා (සෞඛ්‍ය කම්කරු) හා එම්. ඩබ්ලිව්. ඉන්දික ප්‍රදීප් කුමාර මයා (සෞඛ්‍ය කම්කරු) යන නිලධාරී දෙදෙනා බඳවා ගැනීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.09 යෝජනාව
**06.09.2026 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම මහා සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරමි.**

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ප්‍රසම්පාදන වාර්තාව අපිට ලැබිලා නැහැ.ඒ නිසා අනුමත කරන්න බැහැ.

**සභාපතිතුමා :-**
ප්‍රසම්පාදන වාර්තාව මට ලැබිලා තියෙනවා.අපි සියලු දෙනාට ම ලැබීමට සලස්වනවා.එතෙක් අපි ඉදිරියට යමු.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමාගේ 06.09 යෝජනාව, 2026 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම මහා සභාවේ අනුමැතිය සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමාගේ 06.10 යෝජනාව

**06.10.කැලණිය විශ්ව විද්‍යාලයේ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ ශාත්‍රෙවිදී සාමාන්‍ය උපාධිය (බාහිර) හදාරන ඇහැලියගොඩ, දන්දෙනිය, අංක 174/ ඒ ස්ථිර ලිපිනයේ පදිංචි කේ.ඩී. සෞම්‍යා ප්‍රභානි දයාරත්න මෙයගේ ඉල්ලීම පරිදි, අවම මාස 03 ක කාලයක් සඳහා දීමනා රහිතව ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ ප්‍රායෝගික පුහුණුව ලබා දීම සුදුසු බව යෝජනා කරමි.**

**සභාපතිතුමා :-**
මේ කැලණිය විශ්ව විද්‍යාලයේ දුවක් මම හිතන්නේ.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපි මීට කලිනුත් යෝජනාවක් ගෙනාවා අස්ගගුලේ ළමයෙක්ට.සබරගමුව විශ්ව විද්‍යාලයේ පුහුණුව ලබන්න අයට මාස 06ක් ඉල්ලලා තිබුණානේ.හැබැයි ඒක යෝජනාවේ තිබුනේ රු.1000.00යි. ඊට පස්සේ අපි කතා කරලා රු.500.00 ක් දුන්නානේ.ඇයි ඒ අපි ගත්තු තීරණය මේකට වලංගු වෙන්නේ නැත්තේ.අපි සභාව තීරණයක් ගත්තාම, එහෙනම් මේ දීමනාව දෙන්නේ නැත්තේ NPP නොවන එක්කෙනෙක් වෙන්න ඇති මේ.

**සභාපතිතුමා :-**
මන්ත්‍රීතුමා, ඇත්තට ම මම දන්නෙත් නැහැ කවුද කියලා. මේ වගේ තීරණ එහෙම දීර්ඝ කාලීනව ගන්න බැහැ.ඒ නම තියෙන එක්කෙනාට අදාළ වෙන පරිදි තමයි ඒ තීරණ ගන්නේ.එහෙම නම් අපි මේක දාන්න ඕනිත් නැහැනේ. අපි ඒක දැම්මේ සභාවත් දැනුවත් කරලා එකින් එක.නැත්නම් ඒකත් එන්න පුළුවන්නේ, අපිට හිතවත් අය දානවා කියලා හිතන්න පුළුවන්නේ.ඒක හින්දා තමයි එකින් එක තනි එක්කෙනාගේ ඉල්ලීම පවා අපි සභාවට දාල අනුමත කර ගන්නේ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපි යෝජනා කරනවා සභාවේ විපක්ෂයේ 16 දෙනාගේ කණ්ඩායම, මේ ශිෂ්‍යයාට අධ්‍යාන කටයුතු පහසුව සඳහාත් යාම් ඒම් සඳහාත් සභාව තුළ සිටින පුහුණු කාලය තුළ යම් කිසි සේවාවක් කරනවා.අන්න ඒ වෙනුවෙන් දෛනික දීමනාව විදිහට රු.500.00 ක් ලබා දෙන්න.මොකද අපි කලින් තීරණය කරලා, අපි වාද විවාද කරලා කලින් පුහුණුලාභීන්ටත් ලබා දුන්නා. මේ පුහුණුලාභියාටත් ඒ රු.500.00 දීමනාව ලබා දෙන්න සුදුසු යැයි මම මේ වෙලාවේ යෝජනා කරනවා.

**සභාපතිතුමා :-**
ඒක මමත් ස්ථිර කරනවා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා

**සභික කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඇත්තටම දිලීන් මන්ත්‍රීතුමා කරපු යෝජනාව හොඳයි.ගියපාර අපි මාස දෙකකට විතර උඩදී .අපි දීමනාවක් දීල තමයි බඳව ගත්තේ.ඒක අපි මේ ළමයටත් දෙන්න ඕනේ.අපිට හිතවත්තම් දීමනාවක් දෙනවා නැත්නම් නෑ වගේ කතාවක් යන්න ඉඩ තියෙනවා මෙතන නැත්නම්.එහෙම එකක් නෑ.අපි මේ ළමයටත් දීමනාව ගෙවමු කියලා මමත් යෝජනා කරනවා.

**සභාපතිතුමා :-**
ඒක අහන්න ඕනිත් නෑ.එකඟයි.ඒක තමා වෙන්න ඕනි.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමාගේ 06.10 යෝජනාව, කැලණිය විශ්ව විද්‍යාලයේ දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රයේ ශාත්‍රෙවිදී සාමාන්‍ය උපාධිය (බාහිර) හදාරන ඇහැලියගොඩ, දන්දෙනිය, අංක 174/ ඒ ස්ථිර ලිපිනයේ පදිංචි කේ.ඩී. සෞම්‍යා ප්‍රභානි දයාරත්න මෙයගේ ඉල්ලීම පරිදි, උපරිම මාස 03 ක කාලයක් සඳහා දීමනා රහිතව ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ ප්‍රායෝගික පුහුණුව ලබා දීම සුදුසු බවට වූ යෝජනාව සඳහා පුහුණුවටට වාර්තා කරන දිනයන්ට අදාළව රුපියල් 500.00 ක දීමනාවක් ගෙවීමට මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**

සභික සරෝජනී ජිනේන්ද්‍රනි මැතිණියගේ 06.11 යෝජනාව

**සභික සරෝජනී ජිනේන්ද්‍රනි මැතිණිය:-**
**06.11.කෙල්ලාර පාලම සිට සුන්තරම් මහතාගේ නිවස දක්වා මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**
(මෙය කෙහෙල්වරාව කියලා නිවරදි වෙන්න ඕන.)

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික සරෝජනී ජිනේන්ද්‍රනි මැතිණිය:-**
කෙහෙල්වරාව පාලම සිට සුත්තරම් මහතාගේ නිවස දක්වා මීටර් 300 ක් පමණ දුර ප්‍රමාණයක් තියෙනවා.අඩි 08 ක පාරක්.ඒ පාරෙ යන්න බැරි තත්ත්වයක් තියෙන්නේ.වාහනයක්වත් යන්න බැරි තත්වයක් තියෙන්නේ.ජනතාව 80 ක් විතර ජීවත් වෙනවා.පාසල් ළමයිනුත් ඒ පාරෙ තමයි යන්නේ එන්නේ. මල ගෙයක් වුණත් මිනියක් ගෙනියන්නෙත් ඒ පාරෙන් තමයි. ඒ පාර හදල දෙන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි සමාවෙන්න ඕනි. කෙහෙල්වරාව කියලා දා ගත්ත නම් හොඳයි.

**සභාපතිතුමා :-**
කෙහෙල්වරාව නේද .හරි හරි අනිවාර්යයෙන් ම.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික සරෝජනී ජිනේන්ද්‍රනි මැතිණියගේ 06.11 යෝජනාව, කෙහෙල්වරාව පාලම සිට සුන්තරම් මහතාගේ නිවස දක්වා මාර්ගය සංවර්ධනය කිරීමට (මීටර් 300 ක්) වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය

**සභාපතිතුමා :-**
සභික දිලීන් කරුණාපාල මැතිතුමාගේ 06.12 යෝජනාව

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
**06.12.මෝරගල පල්ලිය ඉදිරිපිට ප්‍රධාන මාර්ගය හා විකල්ප මාර්ගය එකතු වන මංසන්ධියේ නිතර සිදුවන වාහන අනතුරු වලක්වා ගැනීම සඳහා road strips මාර්ග තීරු දැමීමට යෝජනා කරමි.**
**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ප්‍රථමයෙන්ම ස්තුතිවන්ත වෙනවා මේක ප්‍රාදේශිය සභාවට අයිති වැඩක් නොවෙයි කියලා මගේ යෝජනාව ඉවත නොදැමීම පිළිබඳව.න්‍යාය පත්‍රයට ඇතුළත් කර ගැනීම පිළිබඳව මම ස්තුතිවන්ත වෙනවා.කෙසේ වෙතත් සාමාන්‍යයෙන් මාසෙකට අනතුරු දෙකක් හෝ තුනක් සිදුවන ස්ථානයක්.මෝරගල පල්ලිය තියෙනවා දෙපැත්ත බයිපාස් එකයි ප්‍රධාන මාර්ගයයි දෙපැත්ත එකතු වන තැන.පිටින් එන අය දන්නේ නැහැ මෙතන මොකක්ද වෙන්නේ කියලා.මංසන්ධියක් නැහැ.රවුන්දබෝඩ් එකක් හදන්න මම හිතන්නේ නගර සංවර්ධන සැලැස්මේ යෝජනා වෙලා තිබුණා.ඒක තාම නැති හින්දා එතෙක් , වාහනවල ගමනාගමනයේ යම්කිසි වේගය අඩු කිරීමට හරි, අනතුරක් වලක්වා ගැනීමට ගොඩක් අය යෝජනා කරනවා ,Road Strip කියලා .සුදු ඉරි පදික මාරුව තියෙන්නේ අන්න ඒ වගේ වාහන වල යාම් ඒම් සඳහා බාධාවක් නොවන විදිහට මාර්ග තීරු යෙදීම සඳහා මාර්ග සංවර්ධන අධිකාරියට අපේ මේ ප්‍රාදේශිය සභාවේ යෝජනාවක් අනුමත වුණා සේ සලකලා යැවුවා නම් ඔවුන්ගේ අවධානය යොමුකර ගන්න ලේසියි.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික දිලීන් කරුණාපාල මැතිතුමාගේ 06.12 යෝජනාව, මෝරගල පල්ලිය ඉදිරිපිට ප්‍රධාන මාර්ගය හා විකල්ප මාර්ගය එකතු වන මංසන්ධියේ නිතර සිදුවන වාහන අනතුරු වලක්වා ගැනීම සඳහා road strips මාර්ග තීරු දැමීමට වූ යෝජනාව මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කිරීමට සුදුසු බවට තීරණය කිරීමත් සමඟ, ඒම යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමාගේ 06.13 යෝජනාව

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**
**06.13.මීගහවත්ත අලගාන මහතාගේ නිවස අසල සිට ඉදිරියට ම මාර්ග සංවර්ධනය කිරීම සඳහා යෝජනා කරමි. (මීටර් 100)**

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මීගහවත්ත අලගාන මහතාගේ නිවස අසල සිට ඉදිරියට මෙම මාර්ගය ගෙවල් 10 ක් විතර තියෙන මාර්ගයක්.කන්දක් උඩ තියෙන්නේ.මිනිසුන්ට යන්න එන්න අපහසුයි.වාහනයක්වත් යන්න බැහැ.මේ මාර්ගය මැද ලොකු ගල්, ලොකු වලවල් පිරිලා.මීට කලින් සංවර්ධනය නොකරපු මාර්ගයක්. එම මාර්ගය ඉතා ඉක්මනින් සංවර්ධනය කරදෙන මෙන් මම ඉල්ලා සිටිනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමාගේ 06.13 යෝජනාව, මීගහවත්ත අලගාන මහතාගේ නිවස අසල සිට ඉදිරියට ම මාර්ග සංවර්ධනය කිරීම (මීටර් 100 ක්) සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමාගේ 06.14 යෝජනාව

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**
**06.14.කලවිටගොඩ ඉම්තියාස් මහතාගේ නිවස අසල සිට සිද්ධික් මහතාගේ නිවස දක්වා පාර කොන්ක්‍රීට් කිරීම සඳහා යෝජනා කරමි. (මීටර් 100)**

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමාගේ 06.14 යෝජනාව, කලවිටගොඩ ඉම්තියාස් මහතාගේ නිවස අසල සිට සිද්ධික් මහතාගේ නිවස දක්වා පාර කොන්ක්‍රීට් කිරීම (මීටර් 100 ක්) සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමාගේ 06.15 යෝජනාව

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**
**06.15.නාපාවල මහතාගේ නිවස ඉදිරිපිට අන්ජර්ට් මහතාගේ නිවස අසලින් ප්‍රියන්ත මහතාගේ නිවස දෙසට මහගෙදරවත්ත මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමාගේ 06.15 යෝජනාව, නාපාවල මහතාගේ නිවස ඉදිරිපිට අන්ජර්ට් මහතාගේ නිවස අසලින් ප්‍රියන්ත මහතාගේ නිවස දෙසට මහගෙදරවත්ත මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමාගේ 06.16 යෝජනාව.

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
**06.16.දෙයියාගල අත්පන්දු ක්‍රිඩාපිටිය වටා ආවරණය ගසා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමාගේ 06.16 යෝජනාව, දෙයියාගල අත්පන්දු ක්‍රිඩාපිටිය වටා ආවරණය ගසා සංවර්ධනය කිරීමට වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමාගේ 06.17 යෝජනාව.

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා:-**
**06.17.බටහිර කරඳන පරණ පාර තඹුගල්ල කොටස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමාගේ 06.17 යෝජනාව, බටහිර කරඳන පරණ පාර තඹුගල්ල කොටස සංවර්ධනය කිරීමට වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමාගේ 06.18 යෝජනාව.

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා:-**
**06.18.සිරිසමන්පුර වික්‍රමකන්ද ගොඩපාර සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමාගේ 06.18 යෝජනාව, සිරිසමන්පුර වික්‍රමකන්ද ගොඩපාර සංවර්ධනය කිරිමට වු යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමාගේ 06.19 යෝජනාව.

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා:-**
**06.19.බටහිර කරදන තැන්න පිට මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමාගේ 06.19 යෝජනාව, බටහිර කරදන තැන්න පිට මාර්ගය සංවර්ධනය කිරීමට වු යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභික ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමාගේ 06.20 යෝජනාව.

**සභික ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා:-**
**06.20.මෝරගල වැකඩ සුනිල් මහතාගේ නිවසේ සිට මිහිරි මහත්මියගේ නිවස මාර්ගයේ කාණුව මාර්ගය මට්ටමට උස්සා කොන්ක්‍රීට් ස්ලැබ් කැබලි ඇතිරීමට යෝජනා කරමි.**

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මෙම මෝරගල වැකඩ අතුරු පාරේ, මේ වැකඩ ප්‍රදේශයේ එම මාර්ගයයි කාණුවයි ලොකු වෙනසක් තියෙනවා.පාර පාතයි කාණුව උසයි.උපසභාපතිතුමා මළගෙදරක ආපු වෙලාවකදී එතුමත් ඒක බලලා මට කිවුවා යෝජනාවක් දාන්න මන්ත්‍රීතුමා කියලා. ඒ නිසා එම මාර්ගය හැකි ඉක්මනින් සකස් කර දෙන්න ලෙස මම ඉල්ලා සිටිනවා.

**උපසභාපති මහේෂ් රත්නායක මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, ඇත්තට ම මිස්බාහ් මන්ත්‍රීතුමා කිවුවා හරි.එම මාර්ගයේ එතන කාණුව ටිකක් ලොකුයි.එතන කාණුව උඩින් මොකක්වත් ආවරණයක්වත් නැහැ.කට්ටිය වැටෙන්න පුළුවන්.වාහන දෙකක්වත් මාරු වෙන්න විදිහක් නැහැ.මම කිවුවා ඒ යෝජනාව දාන්න අපි කරමු කියලා .ඇත්තට ම ඒක වරිපනම් සීමාවෙ තියෙන්නේ.අපි ඒක ප්‍රමුඛතාවක් දීල මෙය සිදු කරමු කියා මම යෝජනා කරනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එතන කොන්ක්‍රීට් ස්ලැබ් දාන්න කියලා මිස්බාහ් මන්ත්‍රීතුමා දාල තියෙන්නේ.ඒක හොඳයි.අපිට විකල්ප දෙකකට යන්න පුළුවන්.එකක් කොන්ක්‍රීට් ස්ලාබ් එක දාන්න පුළුවන් නැත්නම් යකඩ ග්‍රේඩරින් එක හරි දාන්න පුළුවන්.ගොඩක් තැන්වල මම දැක්කා යකඩ ගේඩරින් එක තියෙනවා.එවිට පාර පළල් වෙලා ජනතාවට යන්න එන්න පහසු වෙනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමාගේ 06.20 යෝජනාව, .මෝරගල වැකඩ සුනිල් මහතාගේ නිවසේ සිට මිහිරි මහත්මියගේ නිවස මාර්ගයේ කාණුව මාර්ගය මට්ටමට උස්සා කොන්ක්‍රීට් ස්ලැබ් කැබලි ඇතිරීමට වු යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභික ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමාගේ 06.21 යෝජනාව.

**සභික ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා:-**
**06.21.මෝරගල සහන් කඩේ අසල මාර්ගයේ ශාන්ත මහතාගේ නිවස අසල සිට නිසාම් මහතාගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.**

**සභික පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මෙම මෝරගල සහන් කඩේ අසල තියෙන මාර්ගය.එතන අවට තියෙන සෑම මාර්ගයක් ම කොන්ක්‍රීට් වී ඇති බැවින් එම මාර්ගය විතරක් පොඩි ගැටළුවක් තියෙනවා.මේක පොඩි පාරක්.සාමාන්‍යයෙන් මීටර් 50 ක් පමණ තියෙන්නේ.එතනින් ඒ ටික නිම කළා නම්, මීට කලින් එම මාර්ගයේ කොන්ක්‍රීට් කරලා තියෙන නිසා, සුජීව මන්ත්‍රීතුමා ඒ කාළේ ඒ ටික කරලා තියෙන්නේ.තවත් පොඩි කොටසක් තියෙනවා.ඒ ටික කළා නම් සම්පූර්ණයෙන් ම ඒ ටික නිම වෙනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමාගේ 06.21 යෝජනාව, මෝරගල සහන් කඩේ අසල මාර්ගයේ ශාන්ත මහතාගේ නිවස අසල සිට නිසාම් මහතාගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීමට වු යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභික ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමාගේ 06.22 යෝජනාව.

**සභික ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා:-**
**06.22.කැන්දන්ගමුව නගරය කොත්විල මාර්ගයේ රංජි මහතාගේ නිවස අසල සිට සිට ජස්මින් මහතාගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීමට යෝජනා කරමි.**

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මෙම මාර්ගයත් මීට කලින් සඳහන් කරපු මාර්ගය වගේ ම පොඩි කොටසක් තමයි ඉතුරු වෙලා තියෙන්නේ.මීටර් 30 ක විතර කොටසක්.එම කොටස හදල ඉවර කළා නම් එම මාර්ගයත් සම්පූර්ණයෙන් ම සාර්ථක වෙනවා.මේක ඔබතුමාගේ කැන්දන්ගමුව කොට්ඨාශයේ. සභාපතිතුමනි එය සාදා දෙන ලෙස මම යෝජනා කරනවා.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමාගේ 06.22 යෝජනාව, කැන්දන්ගමුව නගරය කොත්විල මාර්ගයේ රංජි මහතාගේ නිවස අසල සිට සිට ජස්මින් මහතාගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරීමට වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභික එච්.එල්.ජයසේකර මැතිතුමාගේ 06.23 යෝජනාව.

**සභික එච්.එල්.ජයසේකර මැතිතුමා:-**
**06.23.හිඳුරංගල ගල් පුරාණ පාරේ ප්‍රියන්ත මහතාගේ නිවසේ සිට උපාලි මහතාගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.( මීටර් 50)**

**සභික එච්.එල්.දීපාල් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික එච්.එල්.ජයසේකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මෙම මාර්ගය ගිය අවුරුද්දේ යෝජනා කරපු එකක්. ඒක කර ගන්න බැරි වුණා. ඒ නිසයි නැවත මේ යෝජනාව දැම්මේ. එම නිසා මෙය කර දෙන ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එච්.එල්.ජයසේකර මැතිතුමාගේ 06.23 යෝජනාව, හිඳුරංගල ගල් පුරාණ පාරේ ප්‍රියන්ත මහතාගේ නිවසේ සිට උපාලි මහතාගේ නිවස දක්වා මාර්ගය කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීමට ( මීටර් 50 ක්) වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න මැතිතුමාගේ 06.24 යෝජනාව.

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න මැතිතුමා:-**
**06.24.නැදුරන මොරපිටිය වත්ත කොටසට පානීය ජලය ලබා දීම සඳහා ළිඳක් ඉදි කර නළ මඟින් ජලය ලබා දීමට යෝජනා කරමි.**

**සභික සුජීව විජේසූරිය මැතිතුමා**:-
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම ගම්මානයේ පොඩි කොටසක් වෙනම දූපතක් වගේ තියෙන්නේ. ඒ හරියේ ළිඳක් කපන්න බැහැ. මොකද මඩ ගතිය වැඩියි.ඒ නිසා පරිත්‍යාගශීලි පුද්ගලයෙක්ගෙන් ඉඩමක කොටසක් ඉල්ල ගෙන එතන ළඳක් හදලා තමා අපිට ඒ ප්‍රදේශයට පානීය ජලය ලබා දෙන්න අවස්ථාව තියෙන්නේ. ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කර එම කටයුතු සිදු කර දෙන මෙන් ඉල්ලා සිටිනවා.

**සභික දිලීන් කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අවධානය යොමු කරන්න කැමතියි.එම යෝජනාව සඳහා ප්‍රාදේශිය සභාවේ ප්‍රතිපාදන ප්‍රමාණවත් නැත්නම්, අපිට පුළුවන් ප්‍රජා ජල සම්පාදන මණ්ඩලයට, ප්‍රාදේශිය සභාවේ යෝජනාවක් විදිහට අනුමත වුණා කියලා යවලා, ඒ වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කර ගෙන ඒ වැඩේ කරන්න. ඒ සඳහා ඔබතුමාගේ අවධානය යොමු කරනවා.

**සභාපතිතුමා :-**
අනිවාර්යයෙන්ම

**සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිනිය:-**
ගරු සභාපතිතුමනි, මේ ප්‍රියන්ත මන්ත්‍රිතුමිය ගෙනා යෝජනාව ගැන මං සංවර්ධන නිලධාරීතුමිය එක්කත් කතා කළා.දැන් අලුතින් නළ ළිං සෑදීමට යෝජනා දාන්නත් ව්‍යාපෘතියක් ඇවිත් තියෙනවා කියලා, ඒකට රජයේ ඉඩමක් තියෙනව නම් ඒ සඳහා අවශ්‍ය කටයුතු සලසන්න පුළුවන් කියලා තමා එතුමිය කිවුවේ.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, නළ ළිඳක් ඉදිකිරීමට අපේක්ෂා කරනවා නම් තාක්ෂණික වාර්තාවක් අනිවාර්යයෙන් ලබා ගන්න ඕනි.මොකද නළ ළිං වල ජලය සම්බන්ධව යම් යම් ප්‍රශ්න තියෙනවා.නළ ළිං ජලයේ ඛනිජ ද්‍රව්‍ය අඩංගු බවට වාර්තා වෙමින් පවතිනවා.වාර්ෂික වාර්තාවක් ලබා ගැනීම වැදගත් වෙනවා. ඒ නිසා නළ ළිඳක සාර්ථකත්වය තීරණය කරන්න වෙන්නනේ, පරිසර වාර්තාවත් එක්ක.

**සභාපතිතුමා :-**
ගරු මන්ත්‍රීතුමා කියපු කතාවේ වැදගත්කමක් තියෙනවා. වතුර ප්‍රශ්න වලදී අපේ කාර්මික නිලධාරී වාර්තාවලට ඒක කරන්න බැහැ.ගොඩක් තැන්වල හිඳුරංගල එකක් තියෙනවා.ඒකට ජල සම්පාදන මණ්ඩලයෙන් ම කාර්මික නිලධාරීන් ඇවිත් තමයි අවසර දෙන්නේ. ඒකට ජල සම්පත් මණ්ඩලයෙන් අවසර ගන්න ඕනේ.ජල සම්පාදන මණ්ඩලයෙන් අවසර ගන්න ඕනේ.ඔබතුමා කිවුවා හරි. ඒ ජලයත් එක්ක තියෙන ගණුදෙනු වලදී, මන්ත්‍රීතුමා අපිට ඒ ක්‍රමවේදයට තමයි යන්න වෙන්නේ.

**සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ප්‍රියන්ත මන්ත්‍රීතුමා ඉදිරිපත් කළේ මොරපිටිය වත්ත කොටසට ජලය ලබා ගන්න ළිඳක් කපන්න තැනක් ඒ ප්‍රදේශයේ නෑ.ඒ නිසා වෙන තැනක ළිඳක් කපලා නළ මාර්ගයෙන් තමා ඒ තැනට ජලය ගන්න වෙන්නේ.ඒක තමා යෝජනා කළේ.

**සභාපතිතුමා :-**
රංජිත් මන්ත්‍රීතුමා,ප්‍රියන්ත මන්ත්‍රීතුමාගේ යෝජනාවත් ඒ විදිහටම සම්මත වෙනවා.කොට්ඨාශයේ මන්ත්‍රීවරිය හැටියට මෙහෙම යෝජනාවකුත් ඇවිල්ලා තියෙනවා කියලා තමා සඳහන් කළේ.මන්ත්‍රීතුමා ප්‍රියන්ත මන්ත්‍රීතුමාගේ යෝජනාව තමා සම්මත වෙන්නේ.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න මැතිතුමාගේ 06.24 යෝජනාව, නැදුරන මොරපිටිය වත්ත කොටසට පානීය ජලය ලබා දීම සඳහා ළිඳක් ඉදි කර නළ මඟින් ජලය ලබා දීමට යෝජනාව සඳහා ප්‍රජා ජල සම්පාදන මණ්ඩලය දැනුවත් කරන ලෙසට තීරණය කිරිමත් සමඟ මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න මැතිතුමාගේ 06.25 යෝජනාව.

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න මැතිතුමා:-**
**06.25.මීටිපොල පහළ කුඹුර ලුවිස් මුදලාලි මහතාගේ කඩේ ඉදිරිපිට බෝක්කුව ඉදි කිරීම හෝ හියුම් පයිප්ප ලබා දී එය ඉදි කිරීමට යෝජනා කරමි. (පළාත් සභාව හරහා)**

**සභික පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේක පළාත් සභා පාරක්.පළාත් සභාව දැනුවත් කරලා තමා මේක කරන්න ඕනේ.බස් ටික හරවන්න හරි අමාරුයි. ඒ නිසා මේක කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න මැතිතුමාගේ 06.25 යෝජනාව, මීටිපොල පහළ කුඹුර ලුවිස් මුදලාලි මහතාගේ කඩේ ඉදිරිපිට බෝක්කුව ඉදි කිරීම හෝ හියුම් පයිප්ප ලබා දී එය ඉදි කිරීම සඳහා (පළාත් සභාව හරහා) වූ යෝජනාව පළාත්ව දැනුවත් කිරීම සඳහා යොමු කිරීමට තීරණය වීමත් සමඟ මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න මැතිතුමාගේ 06.26 යෝජනාව.

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න මැතිතුමා:-**
**06.26.කිරිපෝරුව වීරසිංහ ගොඩ රබර් කැල්ල කොටසට අඩි 3 – 4 විශ්කම්භය ඇති හියුම් පයිප්පයක් ලබා දීමට යෝජනා කරමි.**

**සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිනිය:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න මැතිතුමාගේ 06.26 යෝජනාව, කිරිපෝරුව වීරසිංහ ගොඩ රබර් කැල්ල කොටසට අඩි 3 – 4 විශ්කම්භය ඇති හියුම් පයිප්පයක් ලබා දීමට වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමාගේ 06.27 යෝජනාව.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
**06.27.ප්‍රාදේශිය සභාවේ වායු සමීකරණ යන්ත්‍ර නඩත්තු කිරීම සඳහා යෝජනා කරමි.**

**සභික එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා මැතිනිය:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපි නම් මේ භූමියේ රැඳෙන අවස්ථා අඩුයි.ඒත් දෛනිකව සේවකයෝ විශාල පිරිසක් මේ භූමියේ රැඳෙනවා.සභාපතිතුමාගේ නිළ කාමරයේ ඇතුළු සියලුම වායු සමීකරණ යන්ත්‍ර අක්‍රිය වෙලා තිබ්බේ මං එන මොහොතේ.දැන් හදල ද දන්නෑ. මං දැක්කා නිලධාරී ඔක්කොම හරි අපහසුතාවයකට පත්වෙලා තියෙනවා.ඒකයි යෝජනා කළේ.සභාපතිතුමා පවා අපහසුතාවයට පත් වෙලා තියෙනවා.ඒක මූලික කටයුත්තක් කියලා සලකලා ඒ කටයුත්තට ප්‍රමුඛතාවය ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.මොකද සේවකයෝ දැඩි අපහසුතාවයට පත් වෙනවා.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමාගේ 06.27 යෝජනාව, ප්‍රාදේශීය සභාවේ වායු සමීකරණ යන්ත්‍ර නඩත්තු කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමාගේ 06.28 යෝජනාව.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
**06.28.ඇහැලියගොඩ නගරයේ රෝහල් පිවිසුම් මාර්ගය සිට රෝහල දක්වා කාණු පද්ධතිය ක්‍රමවත් කිරීම සඳහා යෝජනා කරමි.**

**සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, කලින් යෝජනා කරා පාර.පාර හදන් නැති නිසා කාණුවක් දාල හදන්න හදන්නේ.පිවිසුම් මාර්ගයේ වැසි දවසට අඩි භාගයක් වගේ ප්‍රමාණයක වතුර පිරෙනවා.මොකද රෝහල් භූමියේ තියෙන වතුරත් ඒ කාණු පද්ධතියෙන් ගලා එනවා.විශාල අපද්‍රව්‍ය මුසු වෙනවා ඒකත් එක්ක ම.ඒත් එක්ක ම වැසි අවස්ථාවලදී පයින් ගමන් කරන සේවකයින්ට යන්න අපහසුයි.ඒ වගේම නගරයේ විශාල පිරිසක් මැණික් වෙළඳාමේ කටයුතුවල නිරත වෙනවා.වැසි දිනවලදී මේ කාණු පද්ධතිය නිසා දැඩි අපහසුතාවයට පත් වෙලා තියෙනවා.ඒ සියලු දේ සලකා බලා ඒකට ප්‍රමුඛතාව ලබා දෙන ලෙස මං ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**සභාපතිතුමා :-**
ඇත්තටම ඒ යෝජනාව සම්බන්ධව නගර සැලසුම්වල තියෙවා.අපේ මන්ත්‍රීවරුන්ට බලා ගන්න පුළුවන්.

**සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ප්‍රියන්ත මන්ත්‍රීතුමාගේ 06.25 යෝජනාව සම්බන්ධයෙන්, එතුමා ඉදිරිපත් කරපු යෝජනාවේ ඒක පළා සභා පාරක්.දැන් එතකොට ඒකට දැන් ගත්තතීරණය මොකද්ද? මමත් යෝජනාවක් කරලා තිබුණා, බෝපැත්තේ පිරිවෙන අසල පාරේ පැත්තක් ගැලවී තියෙනවා, බැම්මක් ගහන්න අවශ්‍ය කටයුතු කර යුතුයි කියලා.මම කලින් ඒ යෝජනාව කරලා තිබුණේ.මට ඒකට පිළිතුරු ලිපියක් එවලා තියෙනවා පළාත් සභාවට අයිති පාරක් නිසා පළාත් සභාව දැනුවත් කරන්න කියලා.මේ යෝජනාවත් පළාත් සභා පාරක්.

**සභාපතිතුමා :-**
මන්ත්‍රීතුමා, අපිට ඒක කරන්න බැනේ.අපි ඒක යවනවා.අපිට කරන්න බැරි නිසා අපි අදාළ ආයතනයට දන්වලා, ඒකෙ පිටපත්ක් අදාළ මන්ත්‍රීවරයාට දානවා.මේකත් අපි මාර්ග සංවර්ධන අධිකාරියට යවලා ඒකෙ පිටපතක් ගරු මන්ත්‍රීතුමාට දැන ගැනීම පිණිස අතුරලිය මන්ත්‍රීතුමාට එවනවා.ඒක ඒ විදිහට යනවා.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමාගේ 06.28 යෝජනාව, ඇහැලියගොඩ නගරයේ රෝහල් පිවිසුම් මාර්ගය සිට රෝහල දක්වා කාණු පද්ධතිය ක්‍රමවත් කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමාගේ 06.29 යෝජනාව.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
**06.29.බටහිර කරඳන බෝමළුව අසලින් ගමන් ගන්නා මල්වත්ත පාලම සැකසීම සඳහා යෝජනා කරමි.**

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ මල්වත්ත පාලම සකස් කරන්න අවස්ථා කිපයකදී ම උත්සහ කළා.නිවෙස් රාශියකට ගමන් ගන්නා මාර්ගයක්.ආර්ථික වශයෙන් වැදගත් වන කුරුදු ඉඩම් රාශියක් තියෙනවා.ඒ ආර්ථිකය නගා සිටුවන්න මේ පාලම සෑදීම ගොඩක් වටිනවා.වැහි දිනවලදී සාමාන්‍ය වැස්සට පවා මේ පාලමේ තියෙන තත්ත්වයත් එක්ක මේ ප්‍රදේශයේ ජනතාව ලොකු අපහසුතාවයට පත් වෙනවා.ඒ නිසා මේකට ප්‍රමුඛතාව ලබා දෙන ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ යෝජනාව ඉදිරියේදී ක්‍රියාත්මක වීමට නියමිත යෝජනාවලට ඇතුළත් කරලා තියෙනවා.මේ වසරේ හෝ ලබන වසරේ මේක කර ගන්න පුළුවන් වෙයි කියලා බලාපොරොත්තුවක් තියෙනවා.මේක ගමන් කරන්න අපහසු පාරක්.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ප්‍රාදේශිය සභාවක් විදිහට අපි පාරවල් පාලම් බෝක්කු සකස් කරන්න ඕනේ.ඒක ප්‍රාදේශිය සභාවේ වගකීමක්.පළාත් සභා පාරවල් තියෙනවා, මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ග තියෙනවා.අපිට ප්‍රාදේශිය සභා ප්‍රතිපාදනවලින් හදන්න බැරි පාරවල් තියෙනවා.ඒ නිසා අපිට අවස්ථාවක් ඇවිල්ලා තියෙනවා ප්‍රාජා ශක්ති එකේ යෝජනා හරහා, සෑම වසමක ම ජනතාවගේ යෝජනා අරගෙන ඒ යෝජනා ප්‍රමුඛතාගත කරලා අමාත්‍යාංශ හරහා, පළාත් සභා හරහා, ප්‍රාදේශිය සභා හරහා විශාල වැඩ කොටසක් සිදු වෙනවා.ප්‍රජා ශක්ති යෝජනා හරහා ගොඩක් ඒවා ක්‍රියාත්මක වෙනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, බොහොමත් ම ස්තුතියි.මේ පාලමට මන්ත්‍රීමත්, උපසභාපතිතුමත් අදහස් දැක්වූවා මේ පාලම ගැන විශේෂ අවධානයක් යොමු කරලා තියෙනවා කියලා.බොහොමත් ම ස්තුතියි ඒ සම්බන්ධව.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමාගේ 06.29 යෝජනාව, බටහිර කරඳන බෝමළුව අසලින් ගමන් ගන්නා මල්වත්ත පාලම සැකසීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණියගේ 06.30 යෝජනාව.

**සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය:-**
**06.30.ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ පවතින සම්භාහන මධ්‍යස්ථාන (ස්පා) තහනම් කිරීම, ඉවත් කර දැමීම යෝජනා කරමි.**

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා'

**සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, මම හිතන්නේ සම්භාහන මධ්‍යස්ථාන අපේ බල ප්‍රදේශයේ මේවන විට 14ක් විතර තියෙනවා. ඒවා මම හිතන්නේ සම්භාහන මධ්‍යස්ථාන විදිහට නෙවෙයි පවත්වා යන්නේ, ගණිකා මඩම් විදිහට.ඒ කියන්නේ මගේ රැකියාව අනුවයි සමාජයෙන් ගැවසෙන නිසා ඒ අදහස් හා තොරතුරු අනුව ගරු සභාපතිතුමනි මේ හරහා අපේ තරුණ දැරියන් ගොඩක් වෙලාවට අපයෝජනයට ලක් වෙනවා. හේතුව රුපියල් විසි තිස්දාහකට ඇඟලුම් කම්හලක කරන රැකියාවකට අමතරව මෙයින් ලොකු මුදලක් ලැබෙනවා නිසා, මේ හා සමානව මේවට යොමුවීම ලොකු ප්‍රවණතාවයක් තියෙනවා.ඒත් එක්කම පවුල් කඩා වැටීම්, ආර්ථික බිඳ වැටීම් ආදී සියලු දේ වගේ ම මේකේ විශේෂයෙන් ම වෙන හානියක් තමයි රත්නපුර දිස්ත්‍රික්කයේ විශේෂයෙන් ම වෙන හානියක් තමයි ඒඩ්ස් වසංගතය.ඒ නිසා වැඩියෙන් ම බෝවන ස්ථානයක් විදිහට මෙම සම්භාහන මධ්‍යස්ථාන හරහා කියලා මේවන විට වාර්තා වෙලා තියෙනවා.ඒ වගේ ම සමාජ රෝග.ඒ හින්දා මම හිතන්නේ මේවාට දෙන බලපත්‍ර තහනම් කිරීමක් හෝ, වෙන මොනව හරි දේකට ලොකු මැදිහත් වීමක් වෙලා මේක නතර කරන්න පුළුවන් නම් ලොකු දෙයක්.ඒ වගේ ම තමයි ගරු සභාපතිතුමනි, මේකෙ විශේෂ ම හානිය අපේ ප්‍රාදේශිය සභාවට, පොලිසියට, ඒ වගේ දේවල් වලට තියෙනවා.මොකද සභාපතිතුමාගේ ආශිර්වාදයෙන්, පොලිස්පතිතුමාගේ ආශිර්වාදයෙන් මේක ලොකුවට ම ව්‍යාප්ත වෙලා යනවා කියන චෝදනාව තියෙනවා.මේකට විශේෂයෙන් ම මැදිහත් වෙන්න කියන ඉල්ලීම මම මේ වෙලාවේ කරනවා.මේවන විට අපේ සෞඛ්‍ය කම්කරුවන් පවා මේ ස්ථාන වලට ගිහිල්ලා කුණු ටික ගේන එක පවා, කතා කරනකොට ඒකටවත් කැමැත්තක් දක්වන්නේ නැහැ.මේ සඳහා විශේෂ අවධානය යොමු කරලා මේක නවත්වන්න කටයුතු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා ගරු සභාපතිතුමනි.

**සභාපතිතුමා :-**
මේකට ඇත්තට ම මෙතුමියගේ යෝජනාව එන්න ඉස්සරවෙලා, ඒ යෝජනාව දාල කියලා මම දන්නේ නෑ.මම සහ පොලිසියේ මහත්වරුන් අතර සාකච්ඡාවක් සිදු කළා.එහිදී අපි තීරණය කළා ඇහැලියගොඩ ප්‍රදේශය තුළ ස්පා ආයතන අපි නතර කරමු කියලා.ඊට පසු අපිට අවශ්‍යව තිබුණා මේවට අවසර හම්බුනේ කොහොමද කියලා.ඒක සමාගම් පනතක් හරහා ඕන කෙනෙකුට බලපත්‍රයක් ගන්න පුළුවන්.හැබැයි ඒක ගෙන යාම සඳහා අපි හිතමු අනුරාධපුරේ ගන්න පුළුවන් කියලා.හැබැයි අනුරාධපුරේ ප්‍රාදේශිය සභාවෙන් අනුමැතිය තියෙන්න ඕනි.අපි හොයලා බැලුවා ම ඒ ගොල්ලන් කොළඹින් අරන් තියෙනවා සමාගම් පනතින් දාන්න පුළුවන් කියලා හැබැයි අපේ අවසර නැහැ.මේ යෝජනාව සඳහා ඉතාමත් ම ස්තුතියි.අපි ඔවුන් සමඟ සාකච්ඡාවක් කරලා, ඔවුන් ගෙන්වලා, විශේෂයෙන් ම පොලිසියෙන්, අපි මැදිහත් වුනේ නැහැ.පොලිස්යෙන් ඒ සියලු දෙනා ම කැඳවලා කිවුවා හෙටින් පස්සේ කරන්න තහනම් ඇහැලියගොඩ.ඊයේ හවස බුළුගහපිටිය කොට්ඨාශය සභාව කැඳවන්න මම යන කොට ලෝයර් සංගමයේ කියලා මහත්මයෙක් මට කතා කළා, ඔවුන් කට්ටිය කැඳවලා අපිත් එක්ක සාකච්ඡාවක් ඉල්ලුවා.මම කිවුවා හෙට සාමාන්‍ය මහ සභාව තියෙනවා අපි මේකෙන් උත්තරයක් දෙමු කියලා.මේ යෝජනාව ගැන මම දැනන් හිටියේ නැහැ.මේක වත්සලා මන්ත්‍රීතුමියගේ යෝජනාවක් කියලා.ලේකම්තුමාට මම කතා කරලා කිවුවා හෙටින් පස්සේ තීරණයක් ගන්න ඕනි හින්දා අපි විශේෂ නිවේදන යටතේ මේක දාමුද කියලා.ඒ වෙලාවේ මන්ත්‍රීතුමෙක් මේක බලලා කිවුවා ඒක වත්සලා මන්ත්‍රීතුමියගේ යෝජනා යටතේ තියෙනවා, ඒක දාන්න ඕනි නැහැ කියලා.ඒතකොට මේක පෞද්ගලිකව නෙවෙයිනේ.එතකොට අපිට ඇහැලියගොඩ ස්පා වහන්න අවසර තියෙනවා.අපි ස්ථානාධිපතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා මෙයට මූලිකත්වය දීම පිළිබඳව.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපේ වත්සලා මන්ත්‍රීතුමියගේ යෝජනාව කාලෝචිත යෝජනාවක්.මේක සභාවට අපි යෝජනාවක් විදිහට දැම්මේ නැති වුණාට අපි මේකට ක්‍රියාමාර්ගයක් ගත්තා.ඒක තමයි ඒතුමා පැහැදිලි කළේ. මෙම සම්භාහන මධ්‍යස්ථාන නමින් ක්‍රියාත්මක වන ලිංගික සේවා සැපයීම් ආයතන විවිධ සමාජ සහ

ආර්ථිකමය ගැටලු, සෞඛ්‍ය ගැටලු, සමාජීය ගැටලු විශාල ප්‍රමාණයක් ඇති කරලා තියෙනවා.අපිට මේවා පාලනය කරන්න පුළුවන්.අපිට බලය තියෙනවා.මේවා තහනම් කරලා ආයුර්වේද සම්භාහන මධ්‍යස්ථාන විදිහට, නීත්‍යානුකූල විදිහට තියෙන ඒවා තියෙනවා.ඒවා සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාවක් වගේ සකස් කරලා, විධිමත් කළ හැකියි.ඇත්තට ම සම්භාහනය කියන්නේ, ඈත අතීතයේ ඉඳන් තියෙන ආයුර්වේද ක්‍රියාවලියක්.මේක ඇත්තට ම ඉගෙනගෙන කරන්න ඕනි හොඳ වැදගත් රැකියාවක්.ඒ වගේ ම විශාල ආදායම් ලබන සංචාරක කර්මාන්තට වගේ විශාල ආදායම් තියෙන එකක්. කෙසේ වෙතත් මෙය තැනින් තැන හතු පිපෙනවා වගේ, ඒ නමින් විවිධ ලිංගික සේවය සැපයීම සඳහා මේ වගේ ආයතන හැදෙනවා.අපි ප්‍රාදේශිය සභාව විදිහට අපි ලොකු ජයග්‍රහනයක් කලේ අපි මේ සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා කමිටුවක් තියෙනවා. අපිට පළාත් සභාව විදිහට අනිත් සභා වලටත් ආදර්ශයක් දෙන්න පුළුවන්.අපි හැමෝම එකතු වෙලා.මෙම සම්භාහන මධ්‍යස්ථාන, වෙන රටවල් ගත්තොත් ඒහෙම පිරිමි අයගේ සම්භාහනය කරන්නේ පිරිමි අය ම තමයි.මම කොරියාවේ හිටියා.ඇත්තට ම ගත්තොත් එහෙම (සෝෂාව) විධිමත් කරලා මේ තියෙන ලිංගික සේවා සපයන ස්ථාන මන්ත්‍රීතුමිය යෝජනා කරපු සියල්ල වසා දැමීමට කටයුතු කරමු කියලා සභාවේ ඒකමතිකව සම්මත වෙනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, සභාපතිතුමා ගත්තු තීන්දු සම්බන්ධයෙන් බොහොමත්ම ස්තුතියි.ප්‍රමිතිකරණය සම්බන්ධයෙන් කමිටුවක් දාල හරි අතුරු ව්‍යවස්ථා යටතේ ආයුර්වේද සම්භාහන මධ්‍යස්ථානයක් දානව නම්, ඒකට එම නිර්දේශ ලබාදෙන ක්‍රමවේදය සම්බන්ධයෙන්, අතුරු කමිටුව හරහා හරි ගැළපෙන පුද්ගලයන් උපදේශන මණ්ඩලයට පත් කරලා, ඒකට අවශ්‍ය උපදෙස් ගැනීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා.ආයුර්වේද සම්භාහන මධයස්ථානත් ක්‍රමානුකූලව පවත්වන්න නීතිමය ක්‍රමවේදය තුළ අවස්ථාව ලබාදීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, උපසභාපතිතුමාගේ යෝජනාව බොහොම ප්‍රායෝගිකයි.හැබැයි මම දකිනවා මෙහෙම දෙයක්.අපි ඒ කටයුත්ත වෙළඳාමක් විදිහට කරන්න ගියොත් ඒක ප්‍රායෝගික වෙන්නේ නැහැ.ඒ සද්භාවය වෙන් නෑ.ආයෙත් වෙන්නෙ ම, අපි මේ තහනම් කරපු දේ වෙන්නේ.ඒ යෝජනාව අපි සභාවක් විදිහට සභාවේ, උදාහරණයක් විදිහට ගත්තොත් දිවුරුම්පිටියේ ආයුර්වේද මධ්‍යස්ථානය ගතහොත් අපේ ඒ ගොඩනැගිල්ල සභාවෙන් පාලනය වන විදිහට ඒ කටයුත්ත කළොත් උපසභාපතිතුමාගේ යෝජනාව සාර්ථක වෙයි.ඒ සඳහාත් අවධානය යොමුකරන්න .

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ලංකාව පුරා සම්භාහන මධ්‍යස්ථාන 6000 කට වැඩි ප්‍රමාණයක් තියෙනවා.උපසභාපතිතුමා සඳහන් කරපු ආයුර්වේද සිංහල වෙදකම කරන මධ්‍යස්ථාන ඇහැලියගොඩත් අපේ ගම්වල තිබෙනවා.ඒක අපි වෙන් කරන්න ගියොත් අපිට මේක කරන්න වෙන්නේ නැහැ.ඒයාල ඔක්කොම ඉන්නේ රජයේ ලියාපදිංචි වෛද්‍යවරයෙක් අර ගෙන, ඒයා මේ ස්ථානයේ ඉන්නවා, ඒ යටතේ සම්භාහනය සිදු වෙනවා කියලනේ කියන්නේ.ඒහෙනම් උපසභාපතිතුමා යවලා බලන්න වෙනවා.විහිලුවක් නෙමේ ඇත්තටම කිවුවේ.ඇත්තටම අපිට ඒක කරන්න බෑනේ.අපිට බලන් ඉන්න බෑනේ.එහෙම වෙන්නේ නැහැ. ස්පා වල තියෙන ප්‍රධාන ප්‍රශ්නය තමා එක මත්ද්‍රව්‍ය වෙළඳාම සිදුවීම.දෙක තමයි මේ ගෑණු ළමයි, මං මේක කලිනුත් කිවුවා.මේ කඩවල වැඩ කරන්නේ රු.15000.00, රු.25000.00, රු.30000.00 ක වගේ පඩියට.එවිට එයාල මේ රස්සාවට ගියාට පස්සේ මාසෙට ලක්ෂයක් දෙකක් හම්බකරන්න ගත්තට පස්සේ, අයෙත් කවදාවත් එන්නේ නැහැ.ඒ එන්නැති කෙනාට පවුල් ජීවිතයක් නැති වෙනවා.එයා මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වෙනවා. එයාගේ ජීවිතේම ඉවරයි. අපේ සංස්කෘතියේ අම්මා කියන කෙනා නැති වෙලා යනවා.ලංකාව පුරා ලක්ෂ තුනකට වැඩි ප්‍රමාණයක් මේ රැකියාව කරනවා.මේවාට අමතරව උදව් කරන අයත් ඉන්නවානේ.ඔය හැම එකට ම පිරිමි කට්ටියක් ඉන්නවා උදව් කරන.ඒයාලත් ඒක්ක ලක්ෂ හත අටක් දහයක් විතර ඇති මේක චක්‍රව ගත්තහම.හැබැයි මේක අපි නවත්ත ගත්තේ නැති වුණොත් මේ සියලු දෙනා ම යන්නේ එතෙන්ට.ඇහැලියගොඩ ගත්තොත් අවිස්සාවේල ගැටහැත්ත ඒකක් තිබුණා.ඒකත් ගමේ මිනිස්සු විරෝධතාවය ප්‍රකාශ කරලා වැහුවා.අපි සභාව විදිහට ඒ බලපත්‍රය ලබානොදීම තුළ අපිට ඒක නිදහසේ වහගන්න පුළුවන්.මම නම් යෝජනා කරන්නේ අපි සියලුදෙනා ඒකමතිකව, කවුරුහරි විරුද්ධව ඉන්නවා නම්, කියන්න ගැටළුවක් නැහැ.ඒ නිසා අපි සියලු දෙනා ම ඒකමතිකව තීන්දුවක් අරගෙන මොකද නගරයට ආවම නගරයේ පොඩි අවලස්සනක් තියෙනවා.අපි කුරුවිටට ගියත් ඇහැලියගොඩ දැන් අවිස්සාවේල්ලෙ ටික අපේ කරුමෙට පුංචි තලවතුගොඩ වගේ දැන් කතා හැදිලා තියෙනවා.තව ප්‍රචාරයක් යනවා මේ අයට කවුද මේ කරගෙන යන්න අවස්ථාව ලබාදෙන්නේ කියලා. පොලීසියෙ නම් කියනවා.සභාවේ නම් කියනවා.ඒ සම්බන්ධතා අපි දන්නේ නැහැ.මම හිතන්නේ නැහැ පොලිසිය සම්බන්ධ අතැයි කියා. මේ නිසා මේ සියලු දෙනා එකතු වෙලා මේ වගේ තීන්දුවක් අරගෙන මේක වහන්න පුළුවන් වුණොත්, නගරයටත් හොඳයි. නැත්නම් අනවශ්‍ය ප්‍රශ්න ලෙඩ රෝග.රත්නපුර තමා ලංකාවේ වැඩියෙන් ම ඒඩ්ස් තියෙන නගරය.මම හිතන්නේ ඇහැලියගොඩත් ඇති ඒ අතරේ.ඒ නිසා මම යෝජනා කරනවා සියලු දෙනාම ඒකමතිකව තීරණයක් ගමු මේක නවතන්න.ඇත්තට ම ආයුර්වේද සිංහල වෛද්‍යවරයෙක් කරන වෙදකමක් නම් ගැටළුවක් නැහැනේ.පොලිසිය ගාව තියෙනවා ලියාපදිංචි සිංහල වෛද්‍යවරියක් කරන වෛද්‍ය ආයතනයක්.ඒක ගැටළුවක් නැහැ.ඉලුක්පිටියේ වෙද මහත්මයා සිංහල වෙද මහත්මයෙක් කියලා අපි හැමෝම දන්නවා. ඇත්තට ම ලංකාවේ ජනප්‍රිය කට්ටිය ඉන්නවානේ ආටිගල වගේ ඒ වගේ දේකට අපි අවස්ථාව දෙමු කියලා මම යෝජනා කරනවා.

**සභික පී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපේ ගයානි මන්ත්‍රීතුමියත් මමත් දහම් පාසල් ගුරුවරුන් වශයෙන් මේ සඳහා ගත් තීරණය පිළිබඳව අපේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා.ඒ වගේ ම ගරු සභාපතිතුමා තව එක දෙයක් ඔබතුමාගේ අවධානයට යොමු කරනවා.ඒ තමයි ඇහැලියගොඩ ෆාමසි සම්බන්ධයෙන්.ඇහැලියගොඩ ෆාමයි කොපමණ තිබෙනවාද .ප්‍රාදේශිය සභාවේ ලියාපදිංචි ෆාමසි කොපමණ සංඛ්‍යාවක් තිබෙනවාද කියා සොයා බලන්න. මොකද ෆාමසි හරහා සිදුවන ඒ පෙති වර්ග භාවිතය නිසා අපේ තරුණ පරම්පරාව විනාශ වෙලා යනවා.ඒ

විනාශය වලක්වා ගන්නත්, ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව ෆාමසි පිළිබඳ අවධානය යොමුකරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, ස්පා වහන්න ගත්ත තීන්දුව ගැටලුවක් නෑ.හැබැයි, මේවන විට අවිස්සාවේල්ල සිට රත්නපුර දක්වා තියෙන රෙස්ට් හවුස් ගෙස්ට් හවුස් මේ කාමර කුළියට දෙන හොටෙල්.මේවත් එක්ක සංසන්දනය කළොත් එහෙම මේ ස්පා වලට යනවට වැඩිය මේ ළමයි වැඩිපුර යන්නේ ඕවට.අපි දන්නවා. මේවට යනවා .කුඩු ගන්නවා,ටැබ්ලට් ගන්නවා,වෙනම තවත් දේවල් පාවිච්චි කරනවා.මේක වසංගතයක් වෙලා ඇහැලියගොඩ ඉහළ මට්ටමෙන් සිද්ධ වෙනවා.ඇහැලියගොඩ පාසල් ළමුන් විශාල වශයෙන් ළමයි මේවට යනවා. හොයලා බලනව නම් මේ දේවල් ගැන කතා කරන්න පුළුවන්.මේ ස්පා නවත්වන එක ඉතාමත් ම හොඳයි.හැබැයි ඊට එහා ගිය දැවැන්ත විදිහට මේ ළමයි විනාශ වෙන, මේ ඇහැලියගොඩ ම කීයක් නම් තියෙනවද.මම ගිහින් තියෙනවා ඒ හොටෙල් එකකට ළමයෙක් සම්බන්ධව.ඒ හින්දා මම එතන ගිහින් කතා කරලා රණ්ඩු වෙලාත් තියෙනවා.මේ ඇහැලියගොඩ.විශේෂයෙන් ම තැන් තැන්වල තියෙන කඩ.මේවා එකක්වත් ලියාපදිංචි වෙලා නැහැ.නීත්‍යානුකූල නැහැ.මේ හැම එකකට ම මේ ත්‍රීවිල් කාරයො එක්කන් යනවා මේ කාමරවලට.ඉතින් මේවා පිළිබඳව අපිට සිද්ධ වෙනවා මේවා හදා ගන්න.අපිට මේවා සම්පූර්ණයෙන් ම නවත්වන්න බැහැ. මොකද මේක දැවැන්ත විදිහේ කඩා වැටීමක් සහ විනාශයක් සිද්ධ වෙලා තියෙන්නේ. ඒකට එකතු වෙලා තියෙනවා මේ මත්ද්‍රව්‍ය. මත්ද්‍රව්‍ය නිසා මේක දැවැන්ත විදිහට වැඩි වෙලා තියෙනවා. ඉතින් ඒ සම්බන්ධව මට තියෙන්නේ ඉතාම දුකක්. ඒ නිසා මේ ස්පා නවත්වන්න ගත්තු තීන්දුව ඉතා ම ඉහළයි කියන ගමන් ම අනිත්වා පිළිබඳවත් අපිට අරගලයක් කරන්න සිද්ධ වෙනවා, අපේ මේ දරුවො ටික ආරක්ෂා කර ගන්න.

**සභික අයි.එච්.රණවීර මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, අපි කතා කරන කාරණය ඉතා වැදගත් එකක්.අපිට පේන පැත්ත තමයි කතා කරන්නේ.නමුත් මේකේ හරය තියෙන්නේ වෙන පැත්තක, අපිට පේන දේ තමා ස්පා තියෙනවා, ළමයි සම්බන්ධ විවිධ දේවල් තියෙනවා.නමුත් මෙහි හරය තියෙන්නේ, මිනිස්සුන්ගේ ලිංගික අවබෝධය නැතිකම.ඒකට හොඳ අර්ථයක් දෙන්න මිනිස්සුන්ව දැනුවත් කිරීමක් කරන්න ඕනේ.අපි ඒ සඳහා තමයි දුරදිග බලලා භාවිතා කළේ ලිංගික අධ්‍යාපනය ළමයින්ට දෙන්න ඕනි කියලා.දැන් ඒකට විශාල විරෝධයන් තියෙන බව ඇත්ත.නමුත් අපි දන්නවා මිනිස්සුන්ට හොඳ උත්තරයක් තමයි මේ ලිංගික අධ්‍යාපනය සම්බන්ධයෙන් හොඳ දැනුවත් කිරීමක ඉන්න එක.අපි මෙහිදී ක්‍රියාකරන්නේ කොහොමද, අපිව පෙළඹෙන්නේ ඇයි.මේවා පාලනය කරන්නේ කොහොමද, මේවා සම්බන්ධයෙන් හොඳ දැනුමක් මිනිස්සුන්ට එන්න ඕනේ.ඒ නිසා අපි අර ලීක් ඒකට මූඩියක් ගැහුවා වගේ හිර කර ගෙන හිටියට.මේකෙ හරය පැත්තට තමා උත්තරයක් දෙන්න ඕනේ.ඒ නිසා අපි මේකට විරුද්ධ වෙන්න එපා කිසි කෙනෙක්.ඇත්තට ම ලිංගික අධ්‍යාපනය ළමයින්ට දීම සඳහා තියෙන ඉඩකඩටත් අපේ සහයෝගයත් දෙන්න ඕනේ කියන එක තමයි මම යෝජනා කරන්නේ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, ආරියදාස මන්ත්‍රීතුමා කරපු ඒ ප්‍රකාශය තුළ සමහර විට වැරදි මතයක් යන්න ඉඩ තියෙනවා. මම හිතනවා ඒක නෙවෙයි කතා කළේ කියලා.මම හිතනවා අවුරුදු 18 ට වැඩි අයට අපිට මැදිහත්වීමක් කරන්න බැහැ. ඒ අයගේ පෞද්ගලික කාරණා සම්බන්ධයෙන් අපිට මැදිහත් වීමක් කරන්න බෑ.නීත්‍යානුකූලව ඒ අයට ඕන තැනක ගිහිල්ලා සිද්ධ කර ගන්න පුළුවන්.අපිට ඒක නවත්වන්න බැහැ. අනිත් කාරණාව තමයි රණවීර මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා.මට ඒක අපිට ද චෝදනා කළේ කියලා හිතෙනවා.ලිංගික අධ්‍යාපනය ලබාදීම සඳහා අපේ යම්කිසි බාධකයක්, අපි විසින් ඇති කරලා තියෙනවා කියන චෝදනාවක් වගේ තමයි මට හැඟුනේ.හැබැයි එහෙම චෝදනාවක් නැහැ.අපිත් කැමතියි ළමයිට ලිංගික අධ්‍යාපනය දීල ඒ පිළිබඳව පූර්ණ අවබෝධයෙන් ඉන්න ළමයි පිරිසක් සමාජයට යන්න, සමාජයට දායාද කරන්න, ඒ පිළිබඳව අපිත් උනන්දුවෙන් ඉන්නේ.හැබැයි මෙතන නෙවෙයි ප්‍රශ්නය තිබ්බේ.අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හේතුව.ඒ පිළිබඳව අපිට ප්‍රශ්නයක් නෙවෙයි.ඒ පිළිබඳව අපි කලිනුත් කතා කළා.උපසභාපතිතුමා සභාපතිතුමාගේ පුටුවේ සභාව මෙහෙයවද්දී, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ කිසිසේත් ම අකුළන්නෙ ම නෑ නෑ කියන ඒක, විනාඩි පහයි ගියේ අකුළ ගත්තා කිලා අපිට මැසේජ් ඒක ආවා ගිය ගමන සභාවේදී.මේ ස්පා ගැන කතා කරන කොට මේ ස්පා වහන්න ඒකට මගේ සහයෝගය දෙනවා.හැබැයි ඒතන ඒ කාර්ය භාර්ය කරන කාන්තාවන්ගේ මොන වගේ පසුබිමක්ද තියෙන්නේ කියන ඒක අපි හොයා බලන්න ඕනේ.අපි දැන් මේ ස්පා ටික වැහුවා කියමුකෝ.මං විරුද්ධ නෑ.හැබැයි මේ ස්පා වැහුවහ ම මේ කාන්තාවන් මොකද වෙන්නේ කියන ඒකට අපේ වැඩපිළිවෙළක් තියෙන්න ඕනේ.මේ ස්පා වහන්න කලින්.හොඳ විදිහට ඒ ගන්න වැටුපට ඒ පවුල් ජීවත් කරන්න ඒ ගන්න ක්‍රියාදාමයට අපි යොමු කරන්න ඕනේ ඒ කාන්තාවන්.කාර්ය භාරය කරන කාන්තාවන්ගේ මොනවගේ පසුබිමක්ද තියෙන්නේ කියලා අපි සොයා බලන්න ඕනි.අපි හිතමුකෝ මේ ස්පා ටික අපි වැහුවා කියලා.අපි ඒකට විරුද්ධ නෑ. ස්පා ටික වහන්න.හැබැයි ඒ ස්පා වැහුවහම ඒ කාන්තාවට මොකද වෙන්නේ කියලා අපේ වගකීමක් තියෙන්න ඕනි ස්පා වහද්දී.එක්කෝ හොඳ විදිහට ඒ ගන්න වැටුපට ඒ පවුල ජීවත් කරවන්න පුළුවන් විදිහකට අපි යොමු කරන්න ඕනේ ඒ කාන්තාව.ස්පා එක වැහුවොත් පාරෙ හිඟා කන්න කියන්න බැහැ අපිට.මේක ඉතාමත් බැරෑරුම් කාරණාවක්.ඒ කාන්තාව අපිට කොන් කරන්න බැහැ සමාජයෙන්.අපේ තියෙන සංස්කෘතික, ආගමික මේ සියලු දේවල් එක්කනේ මේ කතා කරන්නේ.හැබැයි සමහර රටවල්වල, හැබැයි තායිලන්තේ පතාය ගත්තොත් එහෙම, සම්පූර්ණයෙන්ම පතාය වීදයේ නීත්‍යානුකූලව ඒ කාර්යය කරන කාන්තාවො තමයි පතාය වීදියෙ ඉන්නේ.ලංකාවේ මිනිස්සු ගිහින් එහෙ යනවා. ලංකාවේ ලිංගික වෙළඳපලක් නැති හින්දා.ඒකට සංස්කෘතිය, ආගම බලපාල තියෙනවා.හැබැයි මම විශ්වාස කරනවා අනාගතයේදී මේ ලංකාව සංවර්ධනය වෙන කොට,සංචාරකයන් දිගින් දිගට ම ඇදීගෙන ඒනවා.එතකොට, මේ අවුරුද්දේ තමයි වැඩිම සංචාරකයින් පිරිසක් ලංකාවට ඇවිල්ලා තියෙන්නේ.2018 ට පසුව. හැබැයි ඒ නිකන් නෙවෙයි.කාලයක් තිස්සේ, මේ සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න යටිතල පහසුකම් සංවර්ධනය වෙලා, වරාය හැදිල, ගුවන් තොටුපල හැදිල, ඒ හේතුව හින්දා තමයි මේ සංචාරකයින් එන්නේ.සමහරු කියනවා එකපාරට සංචාරකයින් මේ ආණ්ඩුව යටතේ ආව කියලා.වැරදි අවබෝධයක් කරගන්න එපා.මම කියන්නේ මේ ස්පා වැහීම තුළ මෙතනින් අයින් වන කාන්තාවන් සේවා නියුක්ත කිරීම

සඳහා අපේ යෝජනාවක් තියෙන්න ඕනේ අපේ මේ සභාවේ.එක්කෝ ඔවුන්ට ස්වයං රැකියාවක් දෙන්න වැඩපිළිවෙලක් හදන්න ඕනේ.නැත්නම් වෙනත් ආයතනයක් හොයල දෙන්න ඕනේ එයාලට රැකියාවකට බඳවා ගන්න.මොකද අපිට එයාලව කොන් කරන්න බැහැ.ඒ යෝජනාවට මම ඒකත් එකතු කරනවා. ඒ අගතියට පත්වන ඒ කාන්තාව ඇත්තට ම මේ සමාජයේ ජීවත් වෙන්න ආර්ථික මට්ටමක් නැති හින්දා තමයි ඒ වගේ ගිහින් වැඩ කරන්නේ.නැත්නම් එයාලත් කැමතියි ගෞරවාන්විතව ජීවත් වෙන්න.හැබැයි ඒ ගෞරවාන්විතව ජීවත් වෙන්නත්, ආර්ථික පසුබිමක් නැති හින්දා තමයි ස්පා වල ගිහිල්ලා වැඩ කරන්නේ, රු.4500.00 ට, රු.5000.00 ට.හැබැයි අපේ වැඩපිළිවෙලත් එක්ක මෙන්න මේ ක්‍රියාදාමයට යමු කියන අදහස ඔබේ අවධානයට යොමු කරන්න කැමතියි ගරු සභාපතිතුමනි.

**සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, ඇත්තට ම මේ ප්‍රදේශයේ තියෙනවා වෙනත් ප්‍රදේශවලින් කාන්තාවන් ගෙනල්ලා ගණිකා මඩම් විදිහට පවත්වාගෙන යන ස්ථාන තියෙනවා.ඇත්තට ම මම බස් ඒකේ යනකොට ම දැක්ක ඒක් සිද්ධියක් විතරයි මේක, ස්පා ඒකක් ඉස්සරහ ඒක් කාන්තාවක් යට ඇඳුම් පමණක් ඇද ගෙන ඒක් කාන්තාවක් රෙදි වනනවා.මම මගේ ඇහැට දැක්කා.ඒ හේතුව හින්දයි.ඒක ඒකක් විතරයි.ඒ කාන්තාවන් කොන් නොකරන්න තමයි අපි වගබලා ගන්න ඕනේ.ඒ වගේ ම තමයි ඇගලුම් කම්හල් ඕන තරම් තියෙනවා කාන්තාවන්ට යන්න.විශේෂයෙන් ම මේ වෙලාවේ මම කියන්න කැමතියි මේ දවස්වල එක දිගට ම බෝපැත්ත ගාමන්ට් එකේ ඉන්ටවීව් කරනවා, ළමයි ගන්නවා.ඒ වගේ දේවල්වලට යොමු කරන්න පුළුවන් නම් හොඳයි කියලා මම කියනවා.මම හිතන්නේ මේ ස්පා වල ගොඩක් ම ඉන්නේ අපේ ප්‍රදේශයේ ඉන්න කාන්තාවෝ නෙමෙයි.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණියගේ 06.30 යෝජනාව, ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවතින සම්භාහන මධ්‍යස්ථාන (ස්පා) තහනම් කිරීම, ඉවත් කර දැමීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණියගේ 06.31 යෝජනාව.

**සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය:-**
**06.31.සුනිල් ජයතුංග මහතාගේ නිවසට යන මාර්ගය සංවර්ධනය කිරීමට (ඇහැලියගොඩ වත්ත වසම කන්ද උඩ) යෝජනා කරමි.**

**සභික පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය:-**
ගරු සභාපතිතුමනි ,නිවාස 10ක් විතර තියෙනවා.කන්ද උඩ පන්සල ඉස්සරහින් තියෙන පාර මේක.බයික් එකක්වත් යන්න බැරි මට්ටමට තමයි තියෙන්නේ.එය සංවර්ධනය කර දෙන්න කියල මම ඉල්ලා සිටිනවා.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණියගේ 06.31 යෝජනාව, සුනිල් ජයතුංග මහතාගේ නිවසට යන මාර්ගය සංවර්ධනය කිරීමට (ඇහැලියගොඩ වත්ත වසම කන්ද උඩ) වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභික එච්.එස්.එල්.දීපාල් මැතිතුමාගේ 06.32 යෝජනාව.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, දීපාල් මන්ත්‍රීතුමා හදිසි අත්‍යවශ්‍ය කාරණාවකට එළියට ගියා.එතුමාගේ යෝජනාව විදිහට මම මේක ඉදිරිපත් කරනවා.
**06.32.නැදුරන වසමේ ඇරැපොල පාසල් මාවතේ පොදු නාන ළිඳ පැති බැම්ම ගැල වී ගොස් ඇත.එම ළිඳ අලුත් වැඩියා කර දෙන මෙන් ඉල්ලා සිටිමි.**

**සභික පී.මාලින්ද මුදන්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මීට කලින් සභාවෙන් අලුත්වැඩියා කරපු ළිඳක් වෙන්න ඕනේ මේක.ඒ නිසා සභාපතිතුමාගේ කාරුණික අවධානය යොමු කරලා, අපේ මන්ත්‍රීතුමියත් ඉන්නවා.එතුමියගේත් අදහසත් අරගෙන මේ සඳහා මුදල් වෙන් කර දෙන ලෙස ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එච්.එස්.එල්.දීපාල් මැතිතුමාගේ 06.32 යෝජනාව, නැදුරන වසමේ ඇරැපොල පාසල් මාවතේ පොදු නාන ළිඳ පැති බැම්ම ගැල වී ගොස් ඇත.එම ළිඳ අලුත් වැඩියා කර දෙන මෙන් ඉල්ලා සිටි යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභික පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමාගේ 06.33 යෝජනාව.

**සභික පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා:-**

**06.33.උඩුමත්ත බෝපැත්ත ප්‍රධාන මාර්ගයේ උඩුමත්ත පාසල අසල මාර්ගය හා කාණු පද්ධතිය අතර ඇති මාර්ගය උරහිස කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මෙම මාර්ගයේ පාසල් වේලාවට මාර්ග තදබදයක් පවතිනවා. එම පාසල් කාලය තුළදී මාර්ග තදබදය මගහරවා ගන්න ක්‍රමවේදයක් තමයි ,මෙම අඩි 02ක වගේ පොඩි තීරුව මීටර් 100ක් පමණ දිගයි. එය සංවර්ධනය කර දෙන මෙන් මම යෝජනා කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමාගේ 06.33 යෝජනාව, උඩුමත්ත බෝපැත්ත ප්‍රධාන මාර්ගයේ උඩුමත්ත පාසල අසල මාර්ගය හා කාණු පද්ධතිය අතර ඇති මාර්ගය උරහිස කොන්ක්‍රීට් යොදා සංවර්ධනය කිරීමට වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභික පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමාගේ 06.34 යෝජනාව.

**සභික පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා:-**
**06.34.සභා බල ප්‍රදේශයේ පාසල අසලින් දිවෙන ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගවල වේග සීමා ගැටිති ස්ථාපනය කිරීමට යෝජනා කරමි.**

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,උදාහරණයක් ලෙස ගැටහැත්ත අනුර විද්‍යාලය ඉදිරිපිට ඒ වගේ ගැටිති ටිකක් දාල තියෙනවා.ඒ වගේම මම දකින දෙයක් තමයි උඩුමත්ත මගේ ගමේ පාසලේ, නිතර ම කුඩා දරුවන් ගැවසෙනවා.විශේෂයෙන් ම බයික් යන වේගයට ළමයෙක් වැදුණොත් එහෙම ගොඩක් දුරට ජීවිතය පවා නැතිවෙන්න පුළුවන්.ඒ නිසා පාසල ඉදිරිපිටින් ගැටිති දාල වේගය පාලනය කරන්න ක්‍රමවේදයක් සකසා දෙන මෙන් මම යෝජනා කරනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඒකට මම එකතු කරන්න කැමතියි ඔබතුමා අදහස් කරන්නේ අර රෝඩ් ස්ට්‍රිප් කියන එක නෙමෙයි ඊට වඩා ලොකු ගැටිති නේද?සභාපතිතුමනි, ජා ඇල පාරේ තමයි මම දකින විදිහට වැඩිම ඔය වගේ ගැටැති ප්‍රමාණයක් තියෙන්නේ.පාරේ යන්න බැහැ වාහනයක එහෙම උඩ පැන පැනා යන්න තියෙන්නේ.මම නම් පෞද්ගලිකව විශාල ගැටිති දාන එකට විරුද්ධයි. වේග සීමා පාලනය කරන්න කියලා, ප්‍රමිතියෙන් තොර ගැටිති.අපි හිතමු ගැටහැත්ත අනුර විද්‍යාලය ඉදිරිපිට ගැටිති ඇත්තට ම මම දන්නේ නැහැ, අපි හිතමු වාහනයක් වේගයෙන් ආවා කියලා, ඒ ගැටිත්ත පන්නන්න පාලනය කර ගන්න බැරුව අපිට අනතුරක් වෙන්න තියෙන ඉඩකඩ වැඩියි.ඒ නිසා අපි එහෙම නෙවෙයි කරන්න ඕනේ.මාර්ග සංඥා යොදන්න පුළුවන් වේගය සීමා කරන්න.ඊට අමතරව මම යෝජනා කරනවා රෝඩ් ස්ට්‍රිප්.මම අධ්‍යනයක් කළා.මාර්ග තීරු කියලා තියෙනවා.ඒතකොට අන්න ඒ හරහා වාහනයේ ගමන් කරන අයට අපහසුවක් නොවෙන්න, ඒ වගේ ම පාරේ යන පදිකයන්ට අනතුරක් නොවෙන්න, ඒ දෙගොල්ලො ගැන ම හිතල තීරණයක් අරගෙන වහාම වැඩියෙන් ම සුදුසුයි කියලා යෝජනා කරන්නේ, අර මාර්ග තීරු.එහෙමත් නැත්නම් මාර්ග සංඥා යොදන්න, හොඳයි කියන මතයේ තමයි මම නම් ඉන්නේ.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපේ ඩිල්ෂාන් මන්ත්‍රීතුමාගේ යෝජනාව ඉතාම හොඳයි.කාලෝචිතයි.එහිදී දිලීන් මන්ත්‍රීතුමා කිවුවා වගේ දෙපැත්තම හිතන්න ඕනේ තමයි.අපේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ සියලු ම තැන්වල අපි මෙය යොදන්න කියන යෝජනාවක් නැහැ.පාසල් අතර තියෙන ප්‍රාදේශිය සභාවට අයත් මාර්ග. ගැටහැත්ත මාර්ගය කියන්නේ ප්‍රදේශිය සභාවට අයත් පාරක් නෙවෙයි.ඒක පළාත් සභා පාරක්.අපි දකිනවා පළාත් සභා පාරවල්වල ඒ වගේ ගැටිති තියෙනවා.ගොඩක් වෙලාවට දාන ගැටිත්ත ඒ කියන්නේ බම්ප් එක ගොඩක් රටවල් වල තියෙනවා.ඒක ප්‍රමිතියකට අනුකූලව තමයි දාන්න ඕනේ.නැත්නම් විශේෂයෙන් ම බයික්වල යන අය වැටෙනවා.වෙනත් රටවල්වල නම් ඔවුන්ගේ නැරිගේෂන්වල බම්ප් එකක් තියෙනවා කියලා ඉස්සරහ පෙන්නනවා.තවත් දුරකින් බම්ප් එකක් තියෙනවා කියලා ඔවුන්ගේ නැරිගේෂන්වල පෙන්නනවා.එම නිසා මම කියන්නේ අපි ඒ තාක්ෂණයට යන්නත් ඕනේ.තාක්ෂණය හැදෙයි ගූගල් වලත් ඒක තියෙනවා.ඇත්තට ම වෙලා තියෙන්නේ අත්තනෝමතික විදිහට ඒක දාපු එකත් තියෙනවා.සමහර ප්‍රදේශවල ඇහැලියගොඩ ම අත්තනෝමතික විදිහට ගැටිති දාගෙන තියෙනවා, ඒවා මිනිස්සුන්ට ඕනි විදිහට.එහෙම නැතුව ප්‍රමිතියට අනුව වාහනයේ එන අයටත් අපහසුතාවයක් නොවෙන්න, ළමයින්ගේ ආරක්ෂාව ගැනත් හිතලා, ඒ වගේ තියෙන පාසල් ඉදිරිපිට තමා.අපේ දිලීන් මන්ත්‍රීතුමා කිවුවා වගේ පාර දෙපැත්තෙන් ඒ වගේ ගැටිත්තක් තියෙනවා කියලා මාර්ග සංඥා පවා යොදන්නත් පුළුවන්.ඒකත් හොඳයි.අනතුරක් වුණාට පස්සේ අපි ඒ ගැන කතා කරනවාට වඩා, අනතුරු වළක්වා ගැනීමේ කටයුතුත් අපට පැවරිලා තියෙන නිසා මෙම යෝජනාව ඉතා කාලෝචිත යෝජනාවක්.අපි ඒක ක්‍රියාත්මක කරමු කියලා කියනවා.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මෙම පදික මාරු වීම් සහ ගැටිති ගැන කතා කරන කොට මම මීට පෙරත් වාර කිහිපයකට කලින් අදහසක් ලෙස ගෙනාවා ඇහැලියගොඩ පදික මාරුවන ස්ථාන කිහිපයක් ගැනත් සඳහන් කරලා.දිලීන් මන්ත්‍රීතුමා කිවුවා වගේ යම් විදිහක මොනව හරි සවිකරලා ඒ ස්ථානවල විදුලි පහනක් සවිකිරීමට අවධානය

යොමු කරමු කියලා.ඔබතුමාට මතක ඇති මීට වාර කිහිපයකට කලින් මම ඇහැලියගොඩ පදික මාරු ස්ථාන 06 ක් නම් කරලා, ඒ තැන් වල හට්ලයිට් වන පරිදි යම් කැට වර්ගයක් ඇල්ලීම හෝ එහෙම නැත්නම් එම ස්ථානයේ විශේෂ විදුලි පහන්, පදික මාරු වෙන තැන පෙනෙන පරිදි සවිකරන්න කියලා මම යෝජනා කළා. තාම ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වුණේ නැහැ.සභාවට බැරිනම් මේ සම්බන්ධයෙන් අදාළ ස්ථාන වලට හරි යොමු කරලා මේ සම්බන්ධව කටයුතු කරනවා නම් ඉතාම හොඳයි ගරු සභාපතිතුමනි.

**සභාපතිතුමා :-**
ගරු මන්ත්‍රීතුමා කිවුව විදිහට අපි පළාත් සභාවේ දී මාර්ග කමිටුවෙදිත් ප්‍රධාන ඇමතිවරු සම්බන්ධවන ඒවට සහභාගී වෙනවා.ඒ තැන්වදීත් ඔබලා කරන යෝජනා අපි ක්‍රියාත්මක කරන්න දැනටමත් පියවර දාල තියෙන්නේ.ඉදිරියේ දී එම කටයුතු සිදුවේවි.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමාගේ 06.34 යෝජනාව, සභා බල ප්‍රදේශයේ පාසල අසලින් දිවෙන ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගවල වේග සීමා ගැටිති ස්ථාපනය කිරීමට වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
තේ පානය සඳහා විනාඩි 15 ක් සභාව කල් තබනවා.

**සභාපතිතුමා :-**
තේ පානයෙන් පසුව නැවතත් සභාව ආරම්භ කරනවා.

**සභාපතිතුමා :-**
සභික එච්.ආරියදාස මැතිතුමාගේ 06.35 යෝජනාව.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
**06.35.බුළුගහපිටිය මෝරගල පාර ජයසූරිය මහතාගේ නිවස සිට ඇති පාර දැඩි අබලන් තත්ත්වයක පවතින බැවින් එය සංවර්ධනය කරදීම සඳහා යෝජනා කරමි.( මීටර් 100)**

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමාගේ 06.35 යෝජනාව, බුළුගහපිටිය මෝරගල පාර ජයසූරිය මහතාගේ නිවස සිට ඇති පාර දැඩි අබලන් තත්ත්වයක පවතින බැවින් එය සංවර්ධනය කර දීම ( මීටර් 100 ක්) සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභික එච්.ආරියදාස මැතිතුමාගේ 06.36 යෝජනාව.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
**06.36.යාය පාර මිනිපේ මහතාගේ නිවස සිට පීරිස් මහතාගේ නිවස දක්වා පාර සංවරධනය කිරීමට යෝජනා කරමි. ( මීටර් 100)** (මිනිපේ නෙමේ, මිනොලි මහතාගේ ලෙස නිවරදි විය යුතුය.)

**සභික පී.මාලින්ද මුදන්නායක මැතිතුමා:**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එච්.ආරියදාස මැතිතුමාගේ 06.36 යෝජනාව, යාය පාර මිනෝලි මහතාගේ නිවස සිට පීරිස් මහතාගේ නිවස දක්වා පාර සංවරධනය කිරීමට (මීටර් 100 ක්) වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභික එස්. එම්. සුමිත්‍රා සේනානායක මැතිනියගේ 06.37 යෝජනාව.

**සභික එස්. එම්. සුමිත්‍රා සේනානායක මැතිනිය:-**
**06.37.මාහිංගොඩ වසමට අයත් පොදු සුසාන භූමි දෙක සභාවට පවරා ගැනීමට සහ සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.
**සභික එස්. එම්. සුමිත්‍රා සේනානායක මැතිනිය:-**
ගරු සභාපතිතුමනි, මාහිංගොඩ වසමට අයත් පොදු සුසාන භූමි දෙකක් තියෙනවා. එයින් එකක් පසුගිය 4 වෙනිදා රෝයල් සෙරමික් ආයතනය ,මරණාධාර සමිතිය එකතුවෙලා ශ්‍රමදානයක් කළා. අක්කර 01ක ප්‍රමාණයක් නිසා ඒක ඉවරකරගන්න බැරි වුණා. නැවත ලඟදී දිනක ශ්‍රමදානයක් සංවිධානය කරලා තියෙනවා සෙරමික් ආයතනයේ සහයෝගයද ඇතිව.
අනෙක් සුසාන භූමිය පොත්තෙකුඹුර ප්‍රදේශයේ තියෙන්නේ.තලගහමුලින් ඉසුරු පදෙසට ඇතුල් වුණාම වෙල කෙලවරේ .මේ වෙනකොට ඒ භූමිය වල් බිහිවෙලා ගොඩක්. නිවාස ඉදිකිරීම් වලදී එම භූමිය අල්ලාගෙන තියෙනවා කියල ආරංචි තියෙනවා. ගරු සභාපතිතුමනි, එම සුසාන භූමිය සභාව සතු කරගෙන සංවර්ධන කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා. එම සුසාන භූමිය හඳුන්වන්නේ කොස්මැදවත්ත සුසාන භූමිය කියලා.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එස්. එම්. සුමිත්‍රා සේනානායක මැතිනියගේ 06.37 යෝජනාව, මාහිංගොඩ වසමට අයත් පොදු සුසාන භූමි දෙක සභාවට පවරා ගැනීමට සහ සංවර්ධනය කිරීමට වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභික එස්. එම්. සුමිත්‍රා සේනානායක මැතිනියගේ 06.38 යෝජනාව.

**සභික එස්. එම්. සුමිත්‍රා සේනානායක මැතිනිය:-**
**06.38.වරිපනම් බදු ගෙවන කුඩා ගම්මානවලට අත් කරත්ත භාවිතා කිරීමට යෝජනා කරමි.**

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
ගරු මන්ත්‍රීතුමිය ඇහැලියගොඩ නගරයේ ට්‍රැක්ටර් යන්න බැරි පාරවල් කිහිපයක් තියෙනවා.ඒ සඳහා අපි ත්‍රිවිල් රථ කිහිපයක් සහ අත් කරත්ත 08 ක් ඉල්ලා තිබෙනවා පළාත් සභාවෙන්.මම හිතන්නේ මේ වසරේ ඒ ටික අනිවාර්යයෙන් ම ලැබෙයි.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එස්. එම්. සුමිත්‍රා සේනානායක මැතිනියගේ 06.38 යෝජනාව, වරිපනම් බදු ගෙවන කුඩා ගම්මානවලට අත් කරත්ත භාවිතා කිරීමට වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමාගේ 06.39 යෝජනාව.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
**06.39.මීගස්වල සමඟි මාවතේ සංඛ මහතාගේ නිවස අසල සිට ජයරත්න මහතාගේ වත්ත දක්වා කොන්ක්‍රීට් ඇතිරීමට යෝජනා කරමි. .( මීටර් 150 පමණ)**

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මේ පාරෙ පොඩි අඩි 06 ක පාරක් තිබුණේ.ඒ පාරෙ දෙපස අය තමන්ගේ වතුවලින් දීලා අඩි දෙක දෙක වගේ දීල මොවුන් අඩක් පමණ කොන්ක්‍රීට් අතුරල තියෙනවා.මේ පාරෙ වහින දාට යන්න බැහැ තනිකර මඩවලක්.මෙහි තව මීටර් 150 ක් වගේ තියෙනවා අවසන් කරන්න.අපේ නඳුන් මන්ත්‍රීතුමත් දන්නවා ඒ පාර ගැන.මම යෝජනා කරනවා මෙය ඉක්මනින් කරලා දෙන්න කියලා.

**සභික කේ.ඩබ්.ඒ.නඳුන් සමීර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඒකෙ මම දන්න විදිහට ජයරත්න මහතාගේ නිවස අසලට යනකන් ක්ලීය නෑ නේද?මල්කාන්ති මහත්මියගේ නිවසට යනකන් පැහැදිලියි.ඒ ටික ක්ලීය කර ගන්න ඕන.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම පාර හදන කොට හැම ඉඩමකින් ම දෙපැත්තෙන් දුන්න ඉඩකඩ.හදපු ටිකත් ළිං වහල තමා ඉදි කළේ.ඉතිරි ටිකත් එහෙම තමා කරන්න වෙන්නේ.

**සභික දිලින් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අමාරුවෙ වැටෙන වැඩක් වෙන්න යන්නේ.ලිඛිතව එකඟතාවය අරන් කරන්න.නැත්නම් අමාරුවේ වැටෙයි.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, සභයට කතා කරපු මන්ත්‍රීතුමා බොහොම ස්තුතියි.ගිහින් බලලා ඔබතුමා හරි ඒක කරන්න.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමාගේ 06.39 යෝජනාව, මීගස්වල සමඟි මාවතේ සංඛ මහතාගේ නිවස අසල සිට ජයරත්න මහතාගේ වත්ත දක්වා කොන්ක්‍රීට් ඇතිරීමට ( මීටර් 150 පමණ) වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමාගේ 06.40 යෝජනාව.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
**06.40.මාහිංගොඩ වඩුගෙදර වත්ත පාර ආරම්භයේ ඇති ඇළ මාර්ගයේ පැති බැම්ම සැකසීම සඳහා යෝජනා කරමි. .( මීටර් 100 පමණ)**

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, මාහිංගොඩ වඩුගෙදර වත්ත මාර්ගයේ ගොවි ජනතාව වතුර ගන්න ඇළ මාර්ගයක් තියෙනවා.වැසි දිනවලදී එම ගොවිතැන විනාශ කර ගෙන වතුර පාරක් යනවා.එමෙන්ම බන්ට් එකත් තියෙන්නේ ටිකක් එහාට වෙන්න. එම බන්ට් එක අබලන් වෙලා.ඒ නිසා එහි වතුර පිරිලා පාර එහා පැත්තේ තියෙන වෙලට යනවා වතුර.එවිට ගල් මුල් ඔක්කොම ගිහින් වෙලේ තමයි නතර වෙන්නේ. ගමේ ගොවි ජනතාව වෙනුවෙන් ගම්මුන් කළ ඉල්ලීමක් කළේ. බැම්මක් දාල දුන්නා නම් වතුර පාර මෙහා පැත්තට එන්නැ.පාරෙ තියෙන ගල් මුල් වෙලට යන්නෙත් නැහැ.ගොවියන්ට නිසි පරිදි වතුර ටික ගන්න පුළුවන්.ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා මේ පිළිබඳව අවධානය යොමුකර අවශ්‍ය කටයුතු සිදුකර දෙන ලෙසට.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම පාර නාකන්දල වසමට අයත් මගේ කොට්ඨාශයේ පාරක්. පාර සේදිලා යනවා.වරිපනම් සීමාවටත් අයත් කොටසක්.මේ සඳහා ප්‍රමුඛතාවක් දීලා වැඩේ කරමු කියලා යෝජනා කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමාගේ 06.40 යෝජනාව, මාහිංගොඩ වඩුගෙදර වත්ත පාර ආරම්භයේ ඇති ඇළ මාර්ගයේ පැති බැම්ම සැකසීම (මීටර් 100 පමණ) සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමාගේ 06.41 යෝජනාව.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
**06.41.වරිපනම් සීමාවේ මාර්ග අනතුරුදායක ස්ථාන (වංගු මංසන්ධි වැනි) සඳහා උත්තල දර්පණ සවි කිරීමට යෝජනා කරමි.**

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මාර්ග ආරක්ෂා කරදීම අපේ ලොකු වගකීමක්.මහා මාර්ග අමාත්‍යාංශයෙනුත් අපිට නිර්දේශ ටිකක් ඇවිල්ලා තියෙනවා මාර්ග ආරක්ෂාව සම්බන්ධයෙන් තියෙන යෝජනා ඒ පිළිබඳ සැලකිල්ලක් දක්වන්න කියලා.ඒ අනුව අපේ වරිපනම් සීමාව ටිකක් විශාලයි.ඒ සීමාව තුළවත්, සෑම කොට්ඨාශයකම බැහැ.මූලික අදියරේදී වරිපනම් සීමාව තුළවත් අඩුම ගානේ කරන්න පුළුවන්නම් හොඳයි.මූලික අදියර ලෙස අනතුරුදායක වංගුවක් ආසන්නයේ ම පුළුවන් නම් උත්තල දර්පන සවි කරන්න, පාර දෙපැත්ත පේනව එතකොට.හදිසි අනතුරු අපිට වලක්වා ගන්න පුළුවන්.ජනතාවගේ ආරක්ෂාවත් සැලසෙනවා ඒ තුළින්.

**සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපේ උපසභාපතිතුමා ගෙනාපු යෝජනාව ඉතා ම වැදගත්.වෙලන්ගල්ල පාරේ පන්සල ළඟ තියෙන වංගුවේ සවි කරලා තියෙනවා.ඒ නිසා ඒ යෝජනාව බොහොම වැදගත් යෝජනාවක් කියලා මම කියනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මෝරගල හන්දියෙත් තියෙනවා ඉසිවර අරණ කියලා බෝඩ් එකක් ගහලා.ඊට අමතරව සන්දලැන්ඩ් වත්තේ වතු යායට යන තැන බෝඩ් එකක් ගහලා තියෙනවා.මම දන්නැ ඒක ප්‍රමිතියකින්ද ගහලා තියෙන්නේ කියලා. අවසරයකින් ද ගහලා තියෙන්නේ කියලා දන්නේ නැහැ.එතනින් වාහනය දාන්න විදිහක් නැහැ.කඩේ බොහොම අමාරුවෙන් පස්සට කරලා කියලා හඳාගත්තා.හැබැයි වාහනය පැල්පිටිය හන්දියට දාන්න විදිහක් නැහැ, පේන්නේ බෝඩ් එක ඉසිවර අරණ කියලා.වාහනේ පේන් නැ.ඒ පිළිබඳවත් හොයල බලල එක්කෝ උත්තල දර්පනයක් දාන්න නැත්නම් ඉසිවර අරණ බෝඩ් එක අයින් කරන්න.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මාහිංගොඩ වියලගොඩ පාරෙත් එකක් දාන්න.එතන පිවිසුම් මාර්ගයට අනතුරුදායකයි.දෙපැත්ත පේන්නේ නැහැ.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමාගේ 06.41 යෝජනාව, වරිපනම් සීමාවේ මාර්ග අනතුරුදායක ස්ථාන (වංගු මංසන්ධි වැනි) සඳහා උත්තල දර්පණ සවි කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා** :-
උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමාගේ 06.42 යෝජනාව.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
**06.42.**ඇහැලියගොඩ **සතිපොල භූමිය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, අපි ඇහැලියගොඩ නගර සංවර්ධනයේ මූලික සාකච්ඡා වට කිහිපයක් තිබ්බා.2026 වසරේ අයවැයේ දී ඇහැලියගොඩ නගරය සංවර්ධනය කිරීම සඳහා මුදල් වෙන් කළා.ඒ සඳහා සභාපතිතුමා ගොඩ මහන්සියක් ගත්තා.එහිදී ඇහැලියගොඩ නගරයේ තියෙන අක්‍රමවත්භාවය ක්‍රමවත් කිරීම සඳහා එක උත්තරයක් තමයි සතිපොළ භූමිය සංවර්ධනය කරන එක.ඒකට හේතුව තමයි අපේ පදික වෙළඳාම, වාහන වලින් කරන සංචාරක වෙළඳාම කරන්නේ නගරයේ දෙපැත්තේ තියෙන ප්‍රධාන මාර්ගයේ නවත්වලා තමයි.එම ව්‍යාපාර කටයුතු කරන්නේ. අපේ රටේ තියෙන අදහසක් තමයි ගොඩක් වෙලාවට පාර දෙපැත්තේ කඩ හැදෙනවා.කඩ හිමියන්වත් කල්පනා කරන්නේ නැහැ කඩේට එන සෙනගට වාහන නවත්වන්න තැනක් තියන්න ඕනි කියලා.නගර සංවර්ධනයේදී අපිට ගැටළුවක් තමයි ඒක.ඒ සඳහා මූලික පියවරක් විදිහට අපිට තියෙනවා ලොකු සම්පතක්.ඇහැලියගොඩ සතිපොල භූමියේ ලොකු ගොඩනැගිලි දෙකක් තියෙනවා.අපිට ඒකෙ ඇතුලේ පදික වෙලදාම කරන අයට, වාහන වලින් වෙළඳාම් කරන අයව අපිට පුළුවන් නම් සතිපොල භූමියට ගෙනියන්න.අපිට ඒක ලොකු ජයග්‍රහනයක් විදිහට ඇහැලියගොඩ නගර සංවර්ධනය සඳහා අපි සිදු කරන වැඩපිළිවෙලේ එකක් තමයි ගරු සභාපතිතුමනි. අපි අක්‍රමවත් විදිහට තමයි තට්ටු ගහලා තියෙන්නේ. දල සැකැස්මකට නියමිත ප්‍රමාණයෙන් යකඩ ආධාරක ආල, ලෑලි තට්ටු වෙනුවට ලස්සනට ක්‍රමවත්ව සකසමු කියලා යෝජනා කරනවා.ශාලාවක යකඩ බට මගින් තට්ටු ශාලා හැදීමට.අනිත් එක තමයි ඇහැලියගොඩ සතිපොළ භූමියේ බස් නවත්වනවා.අපි බලාපොරොත්තු වෙනවා ඇහැලියගොඩින් පටන් ගන්නා හා අවසාන වන රූට් සියල්ලම සතිපොළ භූමියට ගන්න.පහුගිය සභාවලින් කිව්වා එතනට පොල ගේන්න එතන්ට සෙනග ගේන්න ඔන කියලා.මේ පැත්තට නිතරම වහින නිසා ඒ බස් නවත්වන භූමියත් අපිට ටිකක් ක්‍රමවත් කර ගන්න ඕන.ඉන්ටලොක් කැට අල්ලලා හරි අපි ඒ භූමිය සංවර්ධනය කර ගන්න ඕන.ඒ නිසා මේ යෝජනාව ඉක්මනින් ක්‍රියාත්මක කරමු කියලා යෝජනා කරනවා.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, නගරයේ පදික වෙළඳාම් කරන අය ඔක්කොම පොළ භූමියට ගෙනියනවද?දැනට එකක පොල තියෙනවා.ඒකටම ද ගෙනියන්නේ.නැත්නම් අනිත් ගොඩනැගිල්ලටද?

**සභාපතිතුමා :-**

තව ඉඩ තියෙනවා. අපිට පුළුවන් ඒවා වෙනම හට් ගහලා විශාල භූමි ප්‍රමාණයක් තියෙනවා.ඇතුළට ම ගන්න පුළුවන්.ඔවුන්ට වෙන් කරපු කාමර තියෙනවා.ඊට අමතර තිබුණොත් අපිට ඇතුළෙ දෙන්න පුළුවන්.එහෙම නැත්නම් පොළ භූමියේ විශාල ප්‍රදේශයක් තියෙනවා තාප්පෙත් එක්ක.පොඩි පොඩි හට් ගහලා දෙන්න පුළුවන්.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, මාස 3 කට විතර කලින් උපසභාපතිතුමා යෝජනාවක් දැම්මා ආදායම් උත්පාදන මාර්ගයක් කරන්න ඕනි කියලා. මම හිතනවා හොඳ විශේෂ යෝජනාවක් වෙයි කියලා පොළ භූමියට.අක්කර ගානක හොඳ වටිනාකමක් තියෙන දෙයක්.පොළ දැන් සතියේ දවස් දෙකයිනේ තියෙන්නේ.ඒ කියන්නේ ඒකත් වෙනස් වෙනවද?දවස් හතම තියෙනවාද?මෙයාල වෙළඳාම් කරන කොට අනිත් කට්ටියත් එනවානේ. මම ඒකයි අහන්නේ.නැත්නම් මේක කෙරෙන්නේ නැහැ.පොළ දවස් දෙකයි තියෙන්නේ.මෙහෙ ඉන්න අය තල්දූවේ පොළට ගිහිල්ලා බඩු අරන් එනවා.මොකද ගාණ අඩුයිනේ.ගැටහැත්ත පොළට ගිහිල්ලා බඩු අරන් එනවා.අපි හැමෝගෙම ගම්වල කාන්තාවන් වාහන අරගෙන ත්‍රීවිල් එකක් එකතු කර ගෙන තුන්දෙනා හතරදෙනා එක්ක තල්දූවේ, ගැටහැත්තේ පොළට ගිහිල්ලා අරගෙන එනවා.අපි මේ පොළ සංවර්ධනය කිරීම කෙරෙන්න ඕනි කියලා මගේ අදහස තියෙනවා, ගරු සභාපතිතුමනි. නැත්නම් පොළකට ඇවිල්ලා වෙළඳාමක් වෙන්නේ නැහැ.පිටින් ඇවිල්ලා වෙළඳාමක් වෙන් නෑ.පත්තරේක තිබ්බා කොහේද දිහාව කියලා මට මතක නැහැ .උදේ ඉදන් හවස 5.00 වෙනකන් තිබිලා තියෙනවා.ඔවුන් සභාවෙන් තීන්දුවක් අරන් තියෙනවා පොළ 2.00 ට වහන්න.වෙළෙන්දො තන්සිය ගාණක් ඉදලා තියෙනවා.එයින් 180 ගාණක් වගේ කැමති වෙලා තිබිලා.එවිට ජනතාවට වාසියක් තියෙනවා දෙක වෙන කොට ඉවර කරනවා කියන්නේ,තව බඩු මිල අඩු වෙනවා.අපිත් ඒ වගේ දේකට ගියොත් මේ ප්‍රදේශයේ ජනතාවට සහනයක් වෙයි.නිකන් පොළක් තියෙනවා. ව්‍යාපාරිකයන් දෙතුන් දෙනෙක් කරන.හොඳට බලන්න. පොළේ ඉන්න අපේ ප්‍රදේශයේ හිටපු ව්‍යාපාරිකයන් නැති වෙලා තියෙනවා. ව්‍යාපාරිකයන්ටත් නැවත අවස්ථාව තියෙනවා පොළට ඇවිල්ලා සතියට දවස් දෙකක් වෙළඳාම් කරන්න.ගමේ කෙනෙක් පදිංචි වෙලා හිටියා පින්නවල මට නම මතක නැහැ.බලංගොඩ ඉඳන් ඇතුළට යන්න ඕනේ කි.මී. 10 ක් 15 ක්.ඒ ගමේ ඉඳන් උදේට ඇඹිලිපිටි ගිහිල්ලා මඤ්ඤොක්කා, වට්ටක්කා අරගෙන ඇහැලියගොඩ ඇවිල්ලා විකුණනවා.ආයෙත් බලංගොඩ පින්නවල යනවා.ඒ කියන්නේ එයාට ලාභයිනේ.මේ ප්‍රදේශයේ ජනතාවට ව්‍යාපාරිකයන්ට අවස්ථාවක් තියෙනවා.ඒකත් පොඩ්ඩක් සලකා බලන්න. මේ සම්බන්ධවත් අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා :-**

ගරු සභාපතිතුමනි, මෙතුමා මතු කරපු විදිහට පොළ දවස් 2 ද නැත්නම් 7 ද කියලා පිළිතුරක් අපේක්ෂා කරනවා.නැත්නම් යකඩ බටවලින් ආවරණ හදලා දුන්නහම නැත්නම් ඒක ස්ථිර වෙනවා.ක්‍රමවත් වෙන එක හොඳයි.ඒත් එක්කම පිවිසුම් මාර්ගය තියෙන එක එක අත්පත් කරගෙන ඒක ක්‍රියාත්මක වෙනද කියන එකයි.නගර සංවර්ධනය තුළ බස් නැවතුම්පල නැද්ද.බස් නැවතුම්පල පොළ භූමියේ ස්ථාපිත කරමින් ද පවතින්නේ.බස් නැවතුම්පල තිබුණේ පරණ පොළ තිබුණ භූමියේ.බස් නැවතුම්පල දැන් තියෙන පොල භූමියේ ස්ථාපිත වෙනවද .ඍජු පිළිතුරක් අපේක්ෂා කරනවා.බස් නැවතුම්පලක් නගර සංවර්ධනය තුළ නැද්ද.මීට ඉස්සෙල්ලා සුදු අලියෙක් දැක්කේ.අද වෙන කොට මාස අටකට පස්සේ සුදු අලියා හොඳ ආයෝජන කලාපයක් ලෙස හඳුනගෙන තියෙනවා.මේ වන විට හොඳ ආයෝජනයකට යොදා ගැනීම වටිනවා.පිවිසුම් මාර්ගයත් ඒ විදිහටම භාවිතා කරන්නනේ.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, නගර සංවර්ධනය බස් නැවතුම්පල එතන තමා හැදෙන්නේ.තව යෝජනාවකුත් තියෙනවා. මෙය 11 වෙනිදා සාකච්ඡාවේදි එයි.පොළ අපි ක්‍රමවත් කර ගන්න ඕනි. ඒක 2ද තියෙන්නේ 7 ද

තියෙන්නේ කියලා.ඒක ඊළඟ සාකච්ඡාවෙදි කරමු.දැනට පදික වේදිකාවේ වෙළඳාම් කෙරෙන්නේ ගොඩක් වෙලාවට එළවළු ,පලතුරු ඒ දේවල්.ඒ වා පොල භූමියට දාන්න පුළුවන් කිසි ගැටලුවක් නෑ.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි. මම මෙයට යෝජනාවක් කරනවා අපි මේකට කමිටුවක් පත්කරලා මේ පිළිබඳව සාකච්ඡාවක් ගමු කියලා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, පොළ සංවර්ධනය කිරීමේදී ඒ යෝජනා ටික හොඳයි.ඒ වගේම උප සභාපතිතුමා අතින් කියවුණා ,අපේ නගර සංවර්ධන සැලැස්මට වට කිහිපයකට සහභාගී වෙලා මේ පිළිබඳ යෝජනා දීල තියෙනවා.ඔබතුමා කලින් අපිට ආරාධනාවක් කළා.අපෙන් හතර දෙනෙකුට නගර සංවර්ධනය පිළිබඳ සාකච්ඡාවක් තියෙනවා ලෆායට් එකේ තියෙන උදේ 9.30 සිට 3.30 දක්වා අපිට එන්න කියලා. එවිට මම දැන ගන්න කැමතියි ගරු සභාපතිතුමා,දැන් වට කිහිපයක් ගිහිල්ලානේ තියෙන්නේ.ඒ සාකච්ඡා වටවලදී සාකච්ඡා වුණ කාරණා පිළිබඳව සාරාංශයක් අපිට යන්න කලින් දැන ගන්න පුළුවන් වුණා නම් හොඳයි.

**සභාපතිතුමා :-**
පුළුවන්.බස් නැවතුම්පල පිළිබඳව යෝජනා කරලා තියෙන්නේ,පරණ පොළ භූමියේ. ඒ භූමියට මේවන විට නඩුවක් යනවා.ඒක සභාවට අයිති වෙන්න තිබුණ එකක්.අයිති වෙලා තිබුණ දෙයක්.අපේ හිටපු සභාපතිවරු, නඩුව දිනලා තිබුණා හැබැයි, බුක්තිය භාරගන්න ගිහිල්ලා නැහැ.නැවත වතාවක් නඩුව යනවා.වෙලාවට නඩුව ඉවර වෙන්න තිබුණ එකක්.ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඔවුන් ඉදිරිපත් වෙලා තියෙනවා.ඒ නිසා නඩුව යනවා. ඊළඟ නඩු වාරය තියෙන්නේ මාර්තු  තුන් වෙනිදා.මේ අවුරුද්ද ඇතුළත ඉතා ම කෙටි නඩු වාර කිහිපයකින් මෙය අවසන් වේවි.එහෙම උනොත් අපිට ලොකු වාසියක් වෙනවා.බස් නැවතුම්පල අපිට නැවත ස්ථාපිත කරන්න පුළුවන්.ලොකු භූමියක් නිසා පාකින් ගැටළුවත් අපිට ගොඩක් දුරට විසඳගන්න පුළුවන්.ඒවත් අපි 12වෙනිදා සාකච්ඡා කරනවා.විශේෂයෙන්ම  මාළු කඩ ,මස් කඩ සභාවට තමා අයිති.අපි සභාවට අරගෙන, සභාවේ නියාමනය පරිදි අපි ටෙන්ඩර් දාල හරි කරන්න පුළුවන්.හැබැයි දැන් එහෙම නෙවෙයි.අපිට ඉස්සරහට ඒකට අතුරු ව්‍යවස්ථාවක් අවශ්‍ය නැහැ. ඒක සභාවේ පනත් වලින්ම තියෙනවා මේවා අයිති අපිට කියලා.

**සභික ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, දැන් පොල ඔතන ස්ථාපිත වෙලා නැත්තේ, දැන් හැමතැනම කඩවල එළවළු තියෙනවනේ.පොළ භූමියේ වෙන ම විකුණන්න පුළුවන් එළවළු වර්ග තියෙනවා.ඒ දේවල්ම පිටත් තියෙනවා. ඒකට යම් කිසි ක්‍රියාමාර්ගයක් ගන්නව ද කඩවල් වල තියෙන ඒවාට.

**සභාපතිතුමා :-**
ඒක බලන්න ඕනේ වෙළඳ බලපත්‍ර අරන් තියෙන්නේ කොහොමද කියලා.සමහර ඒවා අරන් තියෙන්නේ, උදාහරණයක් ලෙස කීල්ස් එක, කාගීල්ස් එක වාගේ ඒවාට ගන්න පුළුවන්.අපි බලමු අනිත් ඒවාට කොහොමද අවසර දීල තියෙන්නේ කියලා.ගොඩක් අයත් එක්ක කතා කරලත් අපිට මෙය සිදු කර ගන්න පුළුවන්.නැත්නම් පොළට සෙනග එන්නේ නැති නිසා ,අවුරුදු ගානක ඉඳන් පොළේ ඉන්න වෙළෙන්දන්ම කියනවා පොළට එන්නේ නැහැ සෙනඟ.ඒ නිසා ප්‍රධාන අරමුණ තමයි අපේ පාරිභෝගිකයන් පොළට ගන්න එක.ඒ නිසා බස් ටික එතෙන්ට දාන්න. අනිත් අය එවිට එනවානේ.පාරෙ තියන් විකුණන අඹ කරත්ත ටික පොළේ නම් පොලට එනවා.පොඩි දුරයිනේ.ඒ නිසා පාරිභෝගික ජනතාව වැඩියෙන්ම පොළට පැමිණීමේ අරමුණින් තමයි ගොඩක් වෙනස්කම් ටිකක් අපි කරන්න බලාපොරොත්තු වෙන්නේ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා :-**
ගරු සභාපතිතුමනි, මස් කඩ මාළු කඩ සම්බන්ධයෙන් පනතේ මොකක්ද දන්නේ නෑ වගන්තිය.

**සභාපතිතුමා :-**
ගැටහැත්තේ පොළේ සෙනඟ පිරිලා ඉන්නවා.ඇහැලියගොඩ පොලේ සෙනග නෑ.පොළට යන්නේ මිළ අඩුවෙන් ගන්නනේ.මං කිවුවත් හොඳ බඩු පොලට දාන්න කියලා.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමා, අපේ පොළේ වෙළඳාම් කරන්නේ දෙන්නෙක් තුන්දෙනෙක්නේ.මේකට වෙළෙන්දො එන්න ඕනේ.පොළේ බඩු නැහැ.හැමදාම පොල ඇරලා.වෙළෙන්දොත් අද බැරි වුණොත්  හෙට විකුණනවා.හෙට බැරි වුණොත් අනිද්දා විකුණනවා.එතකොට මේක අපිට දවස් දෙක හරියට ක්‍රියාත්මක කරන්න පුළුවන් නම්, ඒක ඉස්සර පොලේ තිබුණා.පිටින් වෙලෙන්දොන්ට එන්න අවස්ථාව දෙන්න ඕනේ.එහෙම නැති වුණොත් සභාපතිතුමා කොපමණ සෙනග හිටියත්, ටවුන් එකේ තියෙන සමහර කඩ වලට බස් හෝල්ට් එක ගාව තිබ්බත් මිනිස්සු යන්නේ නැහැනේ.අපි පොළට කොච්චර ගිහින් දැම්මත් වැඩක් නැහැ සෙනඟ.වෙලදාම් කරන අය ඒකට අනුගත වෙන් නැත්නම්.අපිට ම අයිති ගැටහැත්තෙ පොලේ සෙනග ඉන්නෙ ඇයි කියලා අපිට ම ජේනවනේ.ඒක 2.00 ට 3.00 ට පටන් ගන්නවා හවස 5.00වෙනකොට ඉවරයි.අලුත් බඩු ,නැවුම් බඩු  විකිණිලා ඉවරයි.අපිට තියෙන්නේ ඉරිද උදේට ගෙනැල්ලා දාන ටික ඊළඟ ඉරිද උදෙත් තියෙනවා.සතියට දවස් දෙක කරලා දවස මරි කමක් නෑ.අපි වෙළෙන්දොත් එක්ක කතා කරලා බලන්න ඕන ඒක.දවස හරි දෙක හරි කරලා වෙලෙන්දො එන ක්‍රමයක් හදා ගත්තොත්, ඕක 2011 තිබ්බ සභාවෙදිත් මීගොඩ ආර්ථික මධ්‍යස්ථානයට ගිහිල්ලා ඒ වෙලෙන්දොත් එක්ක කතා කළා.ඒ වෙලෙන්දෝ මෙහෙට ඇවිත් කතා කරන්න කැමති වුණා.ස්ථිරව පොලේ වෙළදාම් කරන්න දුන්නොත් වෙන්නෙ ටවුන් එකේ කඩේ ගන්න ලක්ෂයක් විතර දෙන්න ඕන කෙනා, ඕකෙන් කැලි පහක් විතර අරගෙන රුපියල් 1000 ක් 2000 ක් ගෙවලා වෙළදාම් කරනවා.අපි ටවුන් එකක් මැද්දෙ ඉඩක්නේ දෙන්නේ පාර්කින් එකක් එක්ක.මේ ටවුන් එකේ කඩේකට තමා පාර්කින් නැත්තේ.මහපාරේ ඉඳන් මීටර් 100 ක් නෑ.කොළඹ මඩකලපු ප්‍රධාන පාර.ලංකාවේ 4 වෙනි ප්‍රධාන පාරක්

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම හිතන්නේ සියලු දෙනාට ම මතක ඇති දැනට වාර කිහිපයකට කලින් මම පොළ භූමිය ගැන කතා කළා. පොළ භූමිය සාර්ථක කර ගන්න නම් අපිට කළ හැක්කේ, ඇහැලියගොඩ නගරයේ තියෙන ලයිසන් නැති සියලු ම එළවළු වෙළඳ මහතුන් ටික පොළ භූමියට ඇතුළු කර ගන්න එක.අපි පොළ භූමිය කොච්චර හදන්න හැදුවත්, මේ නගරයේ උඩහ හන්දියේ ඉදල හැම කඩයක ම එළවළු පොඩ්ඩක් තියන් ඉන්නවා.ඒ නිසා මේක සාර්ථක වෙන්න නම්, නගරයේ තියෙන ලයිසන් නැති එළවළු විකුණන ස්ථාන , කාගීල්ස් , කීල්ස් ඒවට ලයිසන් තියෙනවා.ගොඩක් ඒවට ලයිසන් නැහැ.සමහර කඩ තියෙනවා පාරේ යන්න පදිකයෙකුට යන්න බැහැ කුඩ ගහල තියෙනවා පාරේ.පලතුරුයි, එළවළුයි කලවන් වෙලා තියෙනවා.පාරේ යන්න බැහැ ඒ තැන්වල .බලන්න ගිහිල්ලා.මෙතන ඉදන් මීටර් 50 ක්වත් මේ පැත්තට බලන්න ගිහිල්ලා.අපිට තමයි දෝෂය එන්නේ.ඔබතුමා බලන්න,පොළ භූමියට හැරෙන තැන කඩ හදන් තියෙනවා. එක එක්කෙනා එක එක්කෙනාගේ අනුමැතිය උඩ බිස්නස් කරනවා.අපි මාස ගාණක් සභාවට ඇවිල්ලා තියෙනවා.අපි තාම සැලකිය යුතු දෙයක් අපේ පැත්තෙන් වෙලා නැහැ.මම හිතන්නේ පොළ භූමිය සාර්ථක කර ගන්න නම් නගරයේ තියෙන එම එළවළු කඩ ටික කෙසේ හෝ අපි ඇතුළට දාන්න ඕනි.

**සභාපතිතුමා :-**
අපි ලිඛිතව දීලා තියෙන්නේ.අපි ඔවුන්ට ලියුම් බෙදුවා මෙම 01 වෙනිදා සිට එම ස්ථානයෙන් ඉවත් වෙන්න කියලා.මට ගොඩක් අය කතා කරලා කිවුවා අප්‍රේල් අවුරුද්ද වෙනතුරු දෙන්න කියලා.එතෙන්ට ඇවිල්ලා ඉන්නේ.අපි අනිද්දා ගන්න ක්‍රියා මාර්ගත් එක්ක තමා ඒක තීරණය වෙන්නේ.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මෙය ක්‍රියාත්මක කරන්න අවශ්‍යා නම් මුලින්ම ක්‍රියාත්මක කරන්න ඕනි පාසල් භූමිය ඉදිරිපිට ගහලා තියෙන වාහන ටික.ඒක පාසල් ළමුන්ට ලොකු අවහිර තාවයක්.අශෝභනයි.එතන පාර පටු බවක් තියෙනවා එතන.ඒ නිසා එතන පාසල පැත්තෙන් වාහන ආවට පස්සේ, අශෝභන තත්ත්වයක් නිර්මාණය වෙලා තියෙනවා.වාහන බ්ලොක් වෙනවා.එමෙන්ම පාසල් අරින වෙලාවට මම ඉල්ලීමක් කළා ඔබගුමාගේ නිල රථය ප්‍රාදේශීය සභාවට අයිති කොටසේ රදවන්න එපා කියලා.ළමයි පොඩ්ඩක් හරි සෙවනක් ගන්නේ ඒකෙන්.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා**
ගරු සභාපතිතුමනි, පනතේ මම දන්න විදියට ගෝඝාතනය පිළිබඳ තියෙනවා.මස් කඩයි, මාළු කඩයි අපට පාලනය කරන්න පුළුවන් කියලා ඔබතුමා කියනවා.

**සභාපතිතුමා:-**
ඔව් පුළුවන්.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මං කියන්නේ මස් කඩයි, මාළු කඩයි අපට අයින් කරන්න පුළුවන් ද කියලා?

**සභාපතිතුමා:-**
හරි සරලයි.වෙළඳ බලපත්‍ර දෙන්න තියෙන්නේ ප්‍රාදේශීය සභා වෙන්නේ.අපි ඒවට නොදී හිටියහම, අපිට ඒක නියාමනය කරන්න පුළුවන්.පාරෙ දෙපැත්තෙ තියෙන ඒවට, අර බණ්ඩාරවත්තට හැරෙන තැන සෙනසුරාදට වෙළදාම් කරනවා ලොරියක් ඇවිල්ලා.එදාට කීදෙනෙක් නම් කෝල් කරනවද දන්නෑ.ව්‍යාපාරත් එක්ක අමනාපෙන් නෙමේ, අපිට පුළුවන් ඒවා.මාළු ලැල්ලක් ඇත්තටම පොලේ තියෙනවා.මම සභාපති වෙලා ඇවිල්ලා මාස දෙකකින් මම ධීවර සංස්ථාවටත් ලිවුම් ගහලා තියෙන්නේ අයින් කර ගන්න කියලා.ඒක පාරේ තියෙන එක, සුන්දර නගරයක් කරන එකට ලොකු ගැටලුවක් තියෙනවා.පොල භූමියේ තියෙනවා.හැබැයි කිසි කෙනෙක් යන් නෑ.එතන්ට යන්න කියන්න තමා අපි විශේෂයෙන් බැලුවේ.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව විසින් 2019-12-05 මාලු විකිණීමේ ස්ථාන පවත්වාගෙන යාම කියන අතුරු ව්‍යවස්තාව.මේකෙ වගන්ති තියෙනවා විශාල ප්‍රමාණයක්. "ඇහැලියගොඩ බල ප්‍රදේශය තුළමාළු විකුණන ස්ථාන පවවත්වාගෙන යැම පාලනය කිරීමට පරිපාලනය කිරීමහා විධිමත් කිරීමට මේ අතුරු ව්‍යවස්ථාව පනවන ලදී" අපි ක්‍රියාත්මක කරන්න ඕනි මේ පාරවල් වල තැන් තැන්වල මාළු විකුණන්න බැහැ. අපි නීතිය ක්‍රියාත්මක කරන්නෙ නැති එක තමා තියෙන්නේ. අපි ඒක ක්‍රියාත්මක කළානම් හරි.

**සභික පී.මාලින්ද මුදන්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඇහැලියගොඩ නගරය ගැන කතා කරද්දී.කලින් ආණ්ඩුවකදී කේ.එල්.රත්නායක හිටපු ගරු සභාපතිතුමා ගත් තීරණයක් තියෙනවා.සභාවේ ඒකමතිකව තීරණය කරලා තමයි අරන් තියෙන්නේ, පෝය දවසේ කඩවල් වහන්න.ඒ නීතිය සභාවෙ අනුමැතියෙන් වෙනස් කරලත් නැහැ.තාම කඩ අරිනවා.කුමක් හෝ පිළිතුරක් බලාපොරොත්තු වෙනවා.එක්කෝ කඩ අරිනවනම් අරින්න කියන්න. පිරිසක් ඇරන් ඉන්නවා. පිරිසක් වහලා තියෙනවා.නගරයේ අශෝබන ගතියක් තියෙනවා පෝය දවසට. එම නිසා සභාපතිතුමා සහ උපසභාපතිතුමා මැදිහත් වෙලා, අපි හැමෝම එක තීරණයකට ආවා නම් හොඳයි.එක තීරණයකට එමු.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමාගේ 06.42 යෝජනාව, ඇහැලියගොඩ සතිපොල භූමිය සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**

උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමාගේ 06.43 යෝජනාව.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
**06.43.මෝරගල බතලවත්ත වෙද නිවසට ආසන්නයේ දුම්රිය මාර්ගයේ සිට ගමට පිවිසෙන මාර්ගය සංවර්ධනය කිරිමට යෝජනා කරමි.**

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මෝරගල වසමේ වරිපනම් සීමාවට අයත් පාරක් මේක.ගෙවල් 20 කට වැඩි ප්‍රමාණයක් භාවිතා කරනවා.දුම්රිය මාර්ගයෙන් තමයි ඒකෙ පිවිසුම පටන් ගන්නේ.එය අබලන් වීම නිසා එම පාරට ප්‍රමුඛතාවයක් දීල සංවර්ධනය කර ගමු කියා මම යෝජනා කරනවා.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමාගේ 06.43 යෝජනාව, මෝරගල බතලවත්ත වෙද නිවසට ආසන්නයේ දුම්රිය මාර්ගයේ සිට ගමට පිවිසෙන මාර්ගය සංවර්ධනය කිරිම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.44 යෝජනාව
**06.44. ප්‍රාදේශිය සභාව සතු ස්ථාවර තැන්පතු කල් පිරෙන දිනේට පවතින බැංකුවෙන් සභාවේ ජංගම ගිණුමට මාරු කර නව පොලී අනුපාත යටතේ වැඩි ම පොලිය ලබා දෙන මූල්‍ය ආයතනයේ තැන්පත් කිරීම සුදුසු බව යෝජනා කරමි.**

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඒ පිළිබඳව විස්තරයක් කරන්න පුළුවන්ද?

**සභාපතිතුමා :-**
අපේ සභාවේ තියෙනවා අපේ ස්ථාවර තැන්පත් දාපු ගිණුම් කිහිපයක්.එය මාස තුනෙන් තුනට කල් පිරෙන්න දාල තියෙන්නේ.වැඩි පොළියක් දෙන එහෙකට මාරුවිය හැකි නිසා.එම කල් පිරෙන එම ගිණුම් වල තියෙන මුදල්, අපි මේක කරන්නේ මුදල් කමිටුවේ ද අනුමැතිය ඇතිව, අපි ලියුමක් දානවා ඔබ ආයතනයේ අහවල් දිනට මුදලක් තැන්පත් කරනවා ඔබේන් ඒ මාස 3,6,12 ඒ සඳහා පොළිය කියන්න කියලා.වැඩිම පොළියක් තියෙන එකට තමයි අපි දාන්නේ.වැඩි ම පොළිය දෙන රජයේ බැංකුවක අපි තැන්පත් කරනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එහෙනම් මේ යෝජනාව වෙනස් වෙන්න ඕනි වැඩිම පොළියක් ලබා දෙන රාජ්‍ය බැංකුවක තැන්පත් කරනවා කියලා. මූල්‍ය ආයතන පෞද්ගලිකයි රජයේයි දෙකේ ම තියෙනවා.වැරදි වැටහීමක් යන්න ඉඩ තියෙනවා.

**සභාපතිතුමා :-**
අනිවාර්යයෙන්ම අපි දාන්නේ රාජ්‍ය බැංකුවක තමයි.වෙන එකක දාන්න බෑ.ඔව් ඒක රජ්‍ය බැංකුවක ලෙස සඳහන් කරන්න.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.44 යෝජනාව, ප්‍රාදේශිය සභාව සතු ස්ථාවර තැන්පතු කල් පිරෙන දිනේට පවතින බැංකුවෙන් සභාවේ ජංගම ගිණුමට මාරු කර නව පොලී අනුපාත යටතේ වැඩි ම පොලිය ලබා දෙන රජයේ මූල්‍ය ආයතනයක තැන්පත් කිරීම සුදුසු බවට සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, සභාවේ මන්ත්‍රිවරුන්ට සභාවේ ලෙටර් හෙඩ් එකක් සහිතව A4 කොල ලබා දෙන්නේ නැද්ද? ගියවර සභා වල නම් දීලා තියෙනවා.ඒ වගේ ම සභාව දිනට හැම සභිකයෙකුට ම පැනක් හා භාෆ්සීට් දෙක තුනක් ලබා දෙන්න කියලා කියනවා.

**සභාපතිතුමා :-**
එහෙම නෑ.සභාපති වන මටවත් එහෙම ලිපි ශිර්ෂයක් සහිතව ලබා දෙන්නේ නෑ.එහෙම නම් එය සභා යෝජනාවක් විදිහට දාන්න.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
සභාපතිතුමනි අපිට 6.9 මග හැරුණු යෝජනාවක් තියෙනවා.

**සභාපතිතුමා :-**
තව එකක් අපිට මග හැරුණා පෞද්ගලික ලේකම් දීමනාව 6.4 .

මහ හැරුණු යෝජනා සම්බන්ධ කතා කළ කරුණු අදාළ යෝජනාව හා සම්බන්ධ කරන ලදී.

**සභාපතිතුමා :-**

**හදිසි යෝජනා:-01**

LF- 4825 අංක දරණ 2024.12.11 දින වෙන්දේසි කරන ලද බොලෙරෝ රථයේ වෙන්දේසි කාලය දක්වා ලබා ගෙන නොමැති ආදායම් බලපත්‍ර ගාස්තු වන රුපියල් 68,500.00 ක් හා දඩ මුදල රුපියල් 17,500.00 ක් ගෙවීමට වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**සභාපතිතුමා.**
මේක 2024 .12.11 දින මේක වෙන්දේසි කරලා තියෙනවා සභාවෙන්.මේක වෙන්දේසි කරන්න ඉස්සෙල්ලා ආදායම් බලපත්‍රයක් ලබා ගෙන නෑ.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මේක වෙන්දේසි කරලනේ තියෙන්නේ.මේක වෙන්දේසි කරන කොට අපි ආදායම් බලපත්‍රය හදලා දෙන්න ඕන් නැනේ.

**සභාපතිතුමා.**
මේකත් මේ හදිසියේ දැන් ආපු එකක්.මේක 2024 වෙච්ච එකක්.අනිවාර්යෙන් සභාවෙන් ගෙවන්න ඕනේ එකක් ද දන්නේ නෑ.අපි විෂය නිලධාරී ගෙන්නලා මේක දැන ගමු.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ හදිසි යෝජනාව - 01, LF- 4825 අංක දරණ 2024.12.11 දින වෙන්දේසි කරන ලද බොලෙරෝ රථයේ වෙන්දේසි කාලය දක්වා ලබා ගෙන නොමැති ආදායම් බලපත්‍ර ගාස්තු වන රුපියල් 68,500.00 ක් හා දඩ මුදල රුපියල් 17,500.00 ක් ගෙවීමට වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
**07.කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම.**

**සභාපතිතුමා :-**
**07.01.2026.01.08 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්තාව මහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව, 07.01 යටතේ ඉදිරිපත් කළ 2026.01.08 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්තාව මහා සභා අනුමැතිය සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
**07.02. 2026.01.08 වන දින පැවති ප්‍රසම්පාදන (මිලදී ගැනීම් සම්බන්ධ) කමිටු වාර්තාව මහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව, 07.02 යටතේ ඉදිරිපත් කළ 2026.01.08 වන දින පැවති ප්‍රසම්පාදන (මිලදී ගැනීම් සම්බන්ධ) කමිටු වාර්තාව මහා සභා අනුමැතිය සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
**07.03. 2026.01.26 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්තාව මහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව, 07.03 යටතේ ඉදිරිපත් කළ 2026.01.26 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්තාව මහා සභා අනුමැතිය සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
**07.04. 2026.01.26 වන දින පැවති ප්‍රසම්පාදන (මිලදී ගැනීම් සම්බන්ධ) කමිටු වාර්තාව මහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව, 07.04 යටතේ ඉදිරිපත් කළ 2026.01.26 වන දින පැවති ප්‍රසම්පාදන (මිලදී ගැනීම් සම්බන්ධ) කමිටු වාර්තාව මහා සභා අනුමැතිය සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
**07.05. 2026.01.20 වන දින පැවති කාර්මික සේවා කමිටු වාර්තාව මහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව, 07.05 යටතේ ඉදිරිපත් කළ 2026.01.20 වන දින පැවති කාර්මික සේවා කමිටු වාර්තාව මහා සභා අනුමැතිය සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
**07.06. 2026.01.22 වන දින පැවති පරිසර හා පහසුකම් කමිටු වාර්තාව මහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**සභික කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික පී.ඩිල්ශාන් කාවින්ද මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එදා කමිටු සාකච්ඡාවේ දී ශාන්ත මහත්මයා ගෙන්නලා ඇහුවා.අපේ ට්‍රැක්ටර් වගයක් හදන්න දාලා තියෙනවා.අපිට ඒක කවද්ද ගන්න පුළුවන් කියලා.සතියෙන් අපිට දෙන් නම් කිව්වා.දැන් සති තුනක් විතර ගිහින් තියෙනවා.ඒ සම්බන්ධව මොකුත් ක්‍රියාමාර්ගයක් අරන් තියෙනව ද කියලා දැන ගන්න කැමතියි.

**සභාපතිතුමා :-**
ඒ දෙකෙන් එකක් මේ වන විට වැඩ කරනවා.එකක් ලොල භූමියට ගෙනැත් තියෙනවා.ඒක අපි හදල ගෙනාවට දුවන්න එපා කිව්වා.විධායක ඉන්ජිනේරු කාර්යාලයෙන් ඇවිල්ලා බැලුවට පස්සෙ තමා අපිට ගන්න පුළුවන්.තව දවස් දෙකකින් වගේ එයි.අද කතා කළා.

ඒ අනුව මුලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව, 07.06 යටතේ ඉදිරිපත් කළ 2026.01.22 වන දින පැවති පරිසර හා පහසුකම් කමිටු වාර්තාව මහා සභා අනුමැතිය සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
**07.07.නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව - නොපැවැත්විණි.**

**සභාපතිතුමා :-**
**08. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළ යුතු වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම.**

**08.01.2026 ජනවාරි මස ආදායම් වියදම් වාර්තාව මහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව, 08.01 යටතේ ඉදිරිපත් කළ 2026 ජනවාරි මස ආදායම් වියදම් වාර්තාව මහා සභා අනුමැතිය සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
**08.02.2026 ජනවාරි මස හිඟ ආදායම් වාර්තාව මහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව, 08.02 යටතේ ඉදිරිපත් කළ .2026 ජනවාරි මස හිඟ ආදායම් වාර්තාව මහා සභා අනුමැතිය සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
**09.සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම්.**
**සභාපතිතුමා :-**
වතුර ප්‍රශ්නය.ඒක මගෙ වරදක්.මම තමයි යෝජනා කළේ, මම හිතුවේ වතුර සඳහා යන මුදලින් තව මොනවා හරි කැමබීම ටිකක් ලබා ගන්න.ඒ නිසයි.දකුණු පස අයවත් දන්නේ නැහැ.ඒක මගේ වරදක් කියලා පිළිගන්නවා.එක සභිකයෙක් එක අවස්ථාවක් අරගෙන බොහොම කෙටියෙන් පැහැදිලි කිරීම් කරන්න.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, මම ගොඩක් කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ.සභාවට පරිණත පුද්ගලයෙක්, ඒ වගේ පුද්ගලයෙක් කථා කරන විලාසය සහ හැසිරීම පිළිබඳව මම කණගාටු වෙනවා.ආවේගශීලි වුණාට කමක් නැහැ.වේගවත් වුණාට කමක් නැහැ.අනිත් අයට කියන්නේ මම.අපි එහෙම නොවිය යුතුයි කියන එක මම කියන්නේ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ වෙලාවේ සුජීව මන්ත්‍රීතුමා මෙතන නෑ.ඒ ගැන දැන් කතා කරන එක හරි නෑ නේ ද?

**සභාපතිතුමා :-**
මම කාරුණිකව ඉල්ලා සිටිනවා අපිට තව පොඩි කාලයක් තියෙන නිසා පුද්ගලික කාරණා නොකියා සිටිමු කියා.සියලු දෙනාම යන් නැතුව තව පොඩි වෙලාවක් ඉන්න. (ඝෝෂාව)

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමා, රීති ප්‍රශ්නයක් .''37-2 සභා රැස්වීමක කතා කරන සෑම සභිකයෙකුම මූලාසනය අමතා කථා කළ යුතු අතර, කාරක සභා අවස්ථාවකදී හැර සභාවේ නැගිට සිට කථා කළ යුතුය.'' ඒ කියන්නේ සභාපතිතුමා එක්ක තමා කථා කරන්න ඕනි.වෙන අයත් එක්ක කථා කලාට වැඩක් නැහැ.ගරු සභාපතිතුමනි,ඇත්තටම අපි සෙල්ලම් ගෙයක් කරනවා නෙමෙයිනේ. (ඝෝෂාව) මෙහි තියෙනවා කිසියම් සභිකයෙකු කථා කරන විට වෙනත් කවර හෝ සභිකයෙකු විසින් ඊට බාධා නොකළ යුතු අතර, කෙසේ වුව ද කතා කරන සභිකවරයාසම්බන්ධයෙන් රීති ප්‍රශ්නයක් ඉදිරිපත් කිරීමක් මේ වගන්තිය යටතේ බාධා කිරීමක් වශයෙන් නොසැලකිය යුතුය. සභාපතිතුමනි, මේක ඇත්තට ම මේ රීති පොත හැමෝ ම කියවන්න.උපදෙස් දෙන්න.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමා, රීති ප්‍රශ්නයක් ගෙනාවානේ.සභාපතිතුමා රීති ප්‍රශ්නය විසඳලා ඉන්න ඕනේ.එහෙම රීති ප්‍රශ්නයක් ගෙනාවට පස්සේ සභාපතිතුමා සියලු වැඩ නවත්වලා ඔබතුමා පැහැදිලි කරන්න ඕනි අපි කරපු දේ හරිද වැරදිද කියලා.එතෙක් ඔබතුමා වාඩි වෙලා ඉන්න ඔබතුමාට අවස්ථාව හම්බෙනවා. (ඝෝෂාව)

**සභාපතිතුමා**
සභාවේ කියන දේ ඇහුණෙත් නෑ.මම ඒකයි සභාව කල් තිබ්බා. කල් තිබ්බ එක ඇහුනෙත් නැහැ.ඒ නිසා අපි රීති මාලාවක් දීල තියෙන්නේ.ඇත්තට ම අපි ඒවා ක්‍රියාත්මක කරන්න ඕනි.ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව කියන්නේ, ඇහැලියගොඩ ප්‍රදේශයේ තියෙන ප්‍රධානම ආයතනය.හැමෝම මෙතෙන්ට ඇවිල්ලා තියෙන්නේ මහජන ඡන්දයෙන් තේරී පත්වී.අපි දෙන ආදර්ශය තමයි.අපේ වාර්තා සහෘදයින් ඉන්නවා .ඒවා එළියට ගියහම පක්ෂ විපක්ෂ නෙමෙයි වැදගත් වෙන්නේ.ඒ නිසා සියලු දෙනාගෙන්ම ඉල්ලා සිටිනවා, අපි කථා කරන කොට එක්කෙනෙක් නැගිටලා කතා කරලා.ඊළඟ එක්කෙනා නැගිටින එකට ගරු කරලා, ඒ අනුව තමයි.නැත්නම් පටන් ගත්තේ කොතනද අවසානය කොතනද කියලා හොයාගන්න බැහැ.මේක දිගින් දිගටම ගිහාම.හරියට නිශ්චිතව අපි තීරණයක් අරගෙන ඒක එහෙම සමථයකට පත් කර ගන්න පුළුවන්.අර විදිහට ගිහාම කිසි තේරුමක් නැහැ.කාලය යනවා විතරයි.එම නිසා හැමෝගෙන්ම ඉල්ලා සිටිනවා කෙටියෙන්, එක්කෙනෙක් දෙපාරක් නැගිටින්න බැහැ.ආරියදාස මන්ත්‍රීතුමාට පොඩි වෙලාවක් දෙමු.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමා, අපේ නිවාස කමිටුව මාස තුනක් තියන්න බැරි වුණා.ගිය අවුරුද්ද ගැන කිවුවේ.නිවාස කමිටුවේ සිටින සියලු ම මන්ත්‍රීතුමන්ලාට කියන්නේ, අනිවාර්යයෙන්ම ඒකට සහභාගී වෙන්න.ගිය වසරේ අපි නිවාස කමිටුව හරහා විශාල වැඩ කොටසක් කළා.ඒ එක්ක ම පොළ වැඩසටහන පිළිබඳව පුළුල්ව කතා කළොත් හොඳයි කියලා.සියලුම දෙනා ඒකරාශී කර ගෙන එම වැඩසටහන ඉක්මනට ආරම්භ කළ යුතුයි කියන ඉල්ලීම සිදු කරනවා.

**සභික ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා:-**
ගරු සභාපතිතුමා, අදහසක් තියෙනවා.අදහසට කලින් මම උදාහරණයක් කියන්නම්, සභාපතිතුමනි කොළඹ සිට බදුල්ල බස් එනවානේ.ඒවා රත්නපුරෙන් එහා නගින්න කියනවා.එතකොට මම ඇහුවා මේ ටිකේ උඩින්ද යන්නේ කියලා.ඒ වගේ තමයි මේ ලයිට් සම්බන්ධව මෝරගල වරිපනම් ප්‍රදේශයේ.ඕකට දෙන්නෙම නැහැ.කී පාරක් කිවුවද?.මේ උපසභාපතිතුමා සාක්ෂි දරයි. උපසභාපතුමා ඔබතුමාගේ ලේකම්ට කියනවා, එයා දෙන්නෙම නෑ.සිංහල බැරිද දන්නෑ.මොකක්ද දන්නෑ ප්‍රශ්නෙ.ඇත්ත ම කතාව මේ කියන්නේ.පෞද්ගලික ප්‍රශ්නයක්ද දන්නෑ.ඒ වගේම අනිත් හැම කොට්ඨාශයකට ම මන්ත්‍රීවරයෙක් අණ්ඩු පක්ෂයේ ඉන්නවා. මෝරගලට නැනේ ආණ්ඩු පක්ෂයේ එක්කෙනෙක්.ඒ නිසා අපි යෝජනාවක් දැම්ම ම ඒවට මුල් තැනක් දෙන්න.දිය යුතුයි.මිනිස්සු බලාගෙන ඉන්නවා.npp එකට ඡන්දෙ වැටුණා.ඒ ටිකත් නැති වෙයි.තරහට නෙවෙයි කියන්නේ මම.රාමසාන් එනවා.අතුරු පාරවල් වල මිනිස්සු එනවා.මම පසුගිය සභාවෙත් කතා කළා.උපසභාපතිතුමා ඔබතුමා කිවුවේ නැද්ද මෙතුමාගේ ලේකම්තුමාට.මොකක්ද දන්නෑ ප්‍රශ්නය.පස්සට දාන්න එපා මේක දෙන්න.මහ ලොකු දෙයක් ඉල්ලුවේ නෑ.කෝටි ගාණක් ඉල්ලුව වගේනේ.බල්බ් එකක් ඉල්ලුවේ.

**සභික එච්.පී.ජේ.හිරිපිටිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මමත් පොඩි අදහසක් එක් කරනවා.ස්පා සම්බන්ධ ප්‍රශ්නය හොඳ යෝජනාවක්.මීන්නාන කොට්ඨාශයේ මං හිතන්නේ ස්පා තුනක් වගේ තියෙනවා.ඔබතුමා මූලික වෙලා මෙය නවත්වන්න හැදුවට.අනිවාර්යයෙන් නවත්වන්න. ඔතකොට මොනව හරි ප්‍රශ්න එන්න පුළුවන්.එතකොට අපි සභාවක් විදිහට අපි සියලු දෙනාම එකතු වෙන්න ඕන.ඒව කරන්නේ සාමාන්‍යයෙන් යමක් කමක් කරන්න පුළුවන් හයිය හත්තිය තියෙන පුද්ගලයින් තමයි මේ වගේ ව්‍යාපාර කරන්නේ.ඒවායේ සෑහෙන දේවල් සිද්ධ වෙනවා. අපිත් දකිනවා රාත්‍රී කාලයේ ගමන් බිමන් යද්දී රෑ දහය එකොළහ උනාට පස්සේ කොල්ලෝ කුරුට්ටෝ හතර පස් දෙනා එළියට එනවා යනවා.ඒ හින්දා අපිත් ඒවට සම්බන්ධ කර ගන්න.ඒ වගේ ම සභාපතිතුමනි,

මීන්නාන ප්‍රදේශයේ සිවිල් ආරක්ෂක කමිටුවට පොලිස් නිලධාරීන්,ග්‍රාම නිලධාරීන්,අපේ මන්ත්‍රීවරුන් සියලුදෙනා ඇවිල්ලා පන්සලේ හාමුදුරුවෝ මමත් කොට්ඨාශයේ මන්ත්‍රීවරයෙක් විදිහට මගේ නමත් ඒකට දාල තිබුණා.කවුරු කැපුවද කියලා දන්නේ නැහැ. නමුත් අපිට කිසිම දැනුම්දීමක් නැතුව එදා ඒ රැස්වීම මීන්නාන පන්සලේ පැවැත්වුවා. අපිත් නිකන් ආරාධනාවක් නැතුව බලෙන් වගේ එම ස්ථානයට ගිහිල්ලා මම ප්‍රශ්න කළා. මොකද මමත් ඡන්ද 569ක් ගත්තා.ඒකෙ වැඩිපුර හිටියේ npp එකට ඡන්දෙ දීපු මිනිස්සු විතරයි. එහෙම කරන්න එපා ගරු සභාපතිතුමනි.මම මේකට ආපු පළවෙනි දවසෙත් කිවුවා, අපේ ගමේ මන්ත්‍රිවරු හිටියට මොනව හරි දෙයක් වුණ් නැති නිසා තමා අපිත් දේශපාලනය කරන්න ආවේ.පක්ෂයක් බඳාගෙන පෞද්ගලික දේවල් බලාපොරොත්තුවෙන් නෙමේ.ඔබතුමා මෙතන දී වම දකුණ කිවුවට, ගමට ගියහම ඒක නෑ.එහෙම කරන්න එපා.මොකද අපිත් හැමවෙලේම සභාපතිතුමා වෙනුවෙන්,ගම වෙනුවෙන්,ගමේ මිනිස්සු වෙනුවෙන් ඕනි වෙලාවක වැඩ කරන්න, හඬක් නගන්න තමා ගමේ මිනිස්සු අපිට ඡන්දය දීල තියෙන්නේ. ඒ වගේ ප්‍රශ්න තියෙනවා.ඔබතුමාගේ කණ්ඩායමට ඒ පිළිබඳව අවධානය යොමුකරවන්න ඉල්ලා සිටිමින් මම නිහඩ වෙනවා.

**සභික ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,මම පසුගිය දවස්වල පහළ කඩ කාමර කීපයකම දැක්කා වතුර ලීක් වෙනවා.එක කඩයක් තියෙනවා ඒකෙ උඩ ඉටිරෙදි ගහලා තියෙනවා.ඒ ඉටි රෙදිවල වතුර පිරෙනවා.ඒව අයින් කරන්න ගිහාම දෙපාරක් තුන්පාරක්ම කරන්ට් එකත් වැදිලා තිබුණා.ඒ කාරණය පිළිබඳව අවධානය යොමු කරන්න කියලා කියන ගමන්ම.

තව එක තැනක් තියෙනවා අපේ ගමේ මීට අවුරුදු ගානකට කලින් පාරක් කොන්ක්‍රිට් කරපු එකක් තියෙනවා තනි ගෙදරකට.ඒකට දැන් ගේට්ටුවක් දාල තියෙනවා.ඒක පොදු පාරක් වෙන්න ඕනේ පාර කොන්ක්‍රීට් කරා නම්.එහෙම නම් ඒකට ගේට්ටු දාන්න බෑ.ඒ පාර කොන්ක්‍රිට් කරපු එක ගැටළුවක් තියෙනවා.එක කරපු තාක්ෂණ නිලධාරීතුමෙක්ගේ ගැටලුවක් තියෙනවා.ඒක්කො ගේට්ටුව අයින් කරන්න ඕනේ මිනිස්සුන්ට ප්‍රයෝජනයක් ගන්න පුළුවන් විදිහට.ඒ ගැටලුව මං කලිනුත් ඉදිරිපත් කරා ඒකට තාම ප්‍රතිචාරයක් නැහැ.

ඒ වගේ ම තව මේ එහා පැත්තේ හෝටලයක් තියෙනවා රැට. හට් ගහලා තියෙන්නේ පාරේ. සම්පූර්ණයෙන්ම පාර භාගයක් ම අල්ලාගෙන.රෑට අට නමය වෙන කොට දැක ගන්න පුළුවන්.ලයිට් දාල රෑට හරි කරදරයි.කුඩ ගහලා තියෙන්නේ පාරෙ මැද්දෙ.ඒ ගැන ඔබතුමාගේ අවධානය යොමුකරන්න කියලා ඉල්ලා සිටිනවා.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, අපි මේ ළඟදි දවසක ආදාහනාගාරයට ගියා යම් අවස්ථාවක.සමන්සිරි මන්ත්‍රිතුමත් හිටියා. ඒ යන කොට එහි රාජකාරි කරන පුද්ගලයා අපිට යම් දෙයක් කිවුවා.අපි බැලුවා.සභාපතිතුමා එම ආදාහනාගාරය ඇතුල දැන් කැඩී බිඳී ගිහිල්ලා. එහි මිනියක් තැන්පත් කළ විට පෙට්ටිය විතරක් ගිනි ගන්නවලු මිනිය ඇතුලට වැටෙනවලු. ඔහු කිවුවා මොකක්හරි පොල්ලක් ගහල උස්සන් ඉන්නවලු කරේ තියන් මිනිය පිච්චෙකන්.එය ඉතාම වේදනාකාරී සහ කරන්න බැහැ.ඉතින් මම කිවුවා අපි අනිවාර්යයෙන්ම මේක සභාවේ කතා කරමු කියලා. වහ වහාම අපි ඒක බලලා ලොකු කාලයක් ගන්නේ නැතුව අපි ඒක කරලා දෙමු සභාවක් හැටියට.එම පුද්ගලයාට එම රාජකාරි කටයුතු කරන්න බැහැ.මිනිස්සුනෙ අපි.ඒ යකඩ පලු කැඩිලා පෙට්ටිය පිච්චෙන කොට මිනිය ඇතුලට වැටෙනවලු. යකඩ පලු කැඩිලා තියෙන්නේ. ඒ නිසා කාරුණිකව ඔබතුමාගේ අවධානය යොමු කරලා එම කටයුත්ත ඉතා ඉක්මනින් සිදු කර දෙන මෙන් ඉල්ලා සිටිනවා.

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, මගේ යෝජනාවේදී සුමිත් මන්ත්‍රිතුමා හා අතුරලිය මන්ත්‍රිතුමත් හිටියා එදා.මගේ යෝජනාවල පළමු යෝජනාව තමා.ආදාහනාගාරය හැදීම පිළිබඳව මම හිටපු සභාපතිතුමාට ස්තුතිවන්ත වෙනවා.ඒ වගේම ආදාහනාගාරය අලුත් වැඩියා කිරීමට ලක්ෂ 16 ක මුදලක් පළාත් සභාවෙන් අනුමත වීම පිළිබඳව වර්තමාන සභාපතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා.ආදාහනාගාරයට සාමාන්‍යයෙන් සතියකට දවස් හතරක්වත් අපිට යන්න වෙනවා.ඒකෙ වැඩ කරන්නේ ඒ ගමේ ම ප්‍රදීප් කියලා මහත්මයෙක්.එම මහත්මයා දැඩි අපහසුතාවයකට පත් වෙනවා, ආදාහනාගාරයේ ඒ පිච්චෙන ගෘහය ඇතුලත කොන්ක්‍රිට් ගල් සවි කරලා තියෙන්නේ.ඒ කොන්ක්‍රිට් ගල් සියල්ල කැඩිලා තියෙනවා. මම හිතන්නේ, ඒක ප්‍රමිතියෙන් තොරයි.ඒකෙ වැඩ කරපු අයට මඩ ගැසීමේ අදහසින් නෙමේ මේ කියන්නේ.කොහොමහරි ඒක දැන් වෙලා තියෙනවා.ඒක අනුමත වෙලා දැන් මුදලුත් ගෙවලා තියෙනවා.මම හිතන්නේ ආදාහනාගාරය දැන් පටන් අරන් වැඩි කාලයක් නැහැ. එම සේවය කරන තරුණයා දැඩි අපහසුතාවයකට පත් වෙනවා. මොකද ඔහුගේ සෞඛ්‍ය පිරිහීමකට ලක් වෙනවා, ඒ ගල් ගැලවිලා තියෙන නිසා, එම පෙට්ටිය පල්ලෙහාට බහිනවා.ඒක නැවත සවි කරන්න කියලා සභාපතිතුමාට නැවත ඉල්ලීමකුත් කරලා තියෙනවා.ලේකම්තුමාටත් දැනුවත් කරලා තියෙනවා.ඒය නිවැරදි නොකළොත් එම සේවකයින් දෙදෙනා දැඩි අසාධාරණයකට ලක්වෙනවා. ඒ වගේම ඔහු වැඩ කරන්නේ ගෑස් එක්ක. එම නිසා තාක්ෂණය පැත්තෙන් ලොකු කර්තව්‍යයක් ඔවුන් කරන්නේ. අපිට ජේන්නේ නැති වුණාට යම් කිසි ආකාරයකින් ලොකු පිපිරීමක් එහෙම සිදු වුණොත් ඔවුන්ගේ ජීවිත පවා හානි වෙන්න පුළුවන්.ඒ ගොල්ලොත් කියනවා මේකෙ වැඩ කරන්නේ බොහොම අමාරුවෙන්, ඒ නිසා මේක සභාව එක්ක කථා කරලා යම් කිසි මුදලක් යොදලා මේක වහල හරි මේක කරලා දෙන්න. ගරු සභාපතිතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.ඒ සේවකයින් දෙන්නා අපි ආරක්ෂා කර ගන්න ඕනි.ඇහැලියගොඩට ඉන්නේ පුහුණු සේවකයින් දෙදෙනයි. අපි තව ඉල්ලීමක් කරලා තියෙනවා සේවකයෙක් තව දෙන්න කියලා. මම හිතන්නේ දැනට ලේකම්තුමා මැදිහත්වෙලා කසළ එකතු කරන අයට පුහුණුවක් දීලා, ඔහු ඒ කටයුත්ත කරනවා සේවකයෙක් නැති වෙලාවට.ඒක මම අගේ කරනවා.මම කියන්නේ ඒ ස්ථානයට ස්ථිර සේවකයෙක් දෙන්න පුළුවන් නම් තවත් හොඳයි., කියලා මම ඉල්ලීමක් කරනවා.

මම හිතන්නේ ඒ කාරණා ටික කරන අතරම අතුරලිය මන්ත්‍රීතුමත් මතු කරපු ප්‍රශ්නයක් රත්නපුර දිස්ත්‍රික්කයේ සහ සබරගමුව පළාත් සභාවේ ආදාහනාගාර වල මුදල් වල යම් යම් වෙනසක් තියෙනවා කියලා අපිට දැඩි විවේචන එනවා. මක් නිසාද යත් මේක සුභ සාධන සේවයක්. රු.15000.00ක් අපි ගන්නවා.ඒ පිළිබඳව මම නීතිය දන්නේ නැහැ. මේක කොහොමද සම්බන්ද වෙන්නේ කියලා. අපිට සභා බල ප්‍රදේශය තුළ රු.12000.00 ට පුළුවන්නම් ඒකෙ නීත්‍යානුකූල පැත්ත බලලා කරලා සකසලා දෙන්න.සභා ප්‍රදේශය තුළ

රුපියල් 1000.00 ක් අඩු කළා කියලා ප්‍රශ්නයක් නැ.සියලු මන්ත්‍රීවරුන්ට ඒක ප්‍රශ්නයක්. මම හිතන්නේ අතුරලිය මන්ත්‍රීතුමා යෝජනාවක් ගෙනාවා .මෙම කාරණා දෙක තමයි කියන්න තියෙන්නේ.
මම තව පොඩි යෝජනාවක් ගේන්නම්.බස් නැවතුම්පල අපි කෙසේ හෝ පොළට ගෙනාවත්, අපි උදාහරණයක් ගනිමු පනාවල දෙහිඕවිට ඉදන් එන බස් එකක් ඔවුන් කෙලින්ම කරන්නේ මෙතනින් ඇවිල්ලා පොළට දානවා.මම සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා එම බස් එකේ අවසාන ස්ථානය මාර ගහ යට.එතනට ගිහිල්ලා ආපහු හරවාගෙන ඇවිල්ලා එම ස්ථානයට බස් රථය යොදන්න .නැත්නම් ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට, රෝහලට උදේ පාන්දර එන මිනිස්සු මෙතනින් බැහැල රුපියල් 30 ක් 40 ක් දීලා තමයි ආපහු බස් එකක යන්න වෙන්නේ බස් එකක රෝහල් හන්දියට.ඒකෙ අනිත් පැත්තත් එහෙම තමා, රත්නපුරෙන් එන බස් මම හිතන්නේ බොහෝවිට පොලිසිය ළඟට යනවා.පොලිසිය ළඟට ගිහිල්ලා හරවාගෙන ඇවිල්ලා තමයි මේ පාර්ක් එකට දාන්නේ.අවිස්සාවේල්ලෙන් එන බස් යන්නේ නැහැ. මං හිතන්නේ මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරියේ ඉන්න මහත්වරුන්ට කිවුවා නම්, ගොකු තෙල් පිච්චීමක් වෙන් නැනේ.විනාඩියයි යන්නේ.විශේෂයෙන්ම ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට සහ රෝහල හන්දියට යන අයගේ දැඩි ඉල්ලීමක් තියෙනවා.රෝගීන් එන නිසා තමයි මම දැඩිව ඉල්ලීමක් කරන්නේ.රෝගීන්ට බැහැල පයින් යන්න බෑ.එම නිසා ඒ පිළිබඳව මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය සමඟත් කථා කරලා ඒකට විසඳුමක් ලබාදෙන්න කියලා ඉල්ලමින්.
තව රීති ප්‍රශ්නයක් පිළිබඳව කථා කළා සභාවේ සභිකයන්ගේ හැසිරීම පිළිබඳව, එහි රීතිය මම පොඩ්ඩක් කියන්නම්. "37-12 සභාවේ අදහස් දැක්වීමේ දී කිසියම් සභිකයෙකු විසින් නොනිසි වචන ඉදිරිපත් කර ඇති විටෙක දී එම වචන ඉල්ලා අස් කර ගැනීමට හා එම වචන පාවිච්චි කිරීම සම්බන්ධයෙන් සභාවට කණගාටුව පළ කරන ලෙස මුලාසනය විසින් නියම කර ඇති විටකදී ඊට අනුකූලව එකී නියමයන් යටතේ සභිකවරයා විසින් ක්‍රියා කල යුතුයි" කියලා තමා රීතිවල තියෙන්නේ.මම හිතනවා එතුමා නැති නිසා කතා කරලාට, වැඩක් නැ.එතුමා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්.අපි ඉතින් එතුමාට විරෝධතාවයක් නැහැ.ඉදිරියේදී මේ පැත්තේ මන්ත්‍රීවරුන් සියල්ලමත් මම හිතන්නේ අපි ඇහැලියගොඩ සිටින පුරවැසියෝ නගරය දියුණු කරන්න තමයි ඇවිල්ලා තියෙන්නේ.එම නිසා ප්‍රශ්නයක් නැතිව, තියෙන ප්‍රශ්න අපි නීත්‍යානුකූලව විසඳගෙන කටයුතු කරමු කියා ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.බොහොම ස්තුතියි.

**සභික ආර්.වත්සලා නිශාන්ති ධනරත්න මැතිනිය:-**
ගරු සභාපතිතුමනි, විදුලි බල්බ ලබා ගැනීම සම්බන්ධව මම යෝජනාවක් දැම්මා.උපසභාපතිතුමා කථා කරලා ඇත්තට ම මේක සභාවේ යෝජනාවක් විදිහට දාන්න ඕනි නැහැ කිවුවා. ගෙවල් 25 කට වැඩිය දීගල්ල ගමේ තියෙනවා.එක විදුලි පහනක්වත් ලැබිලා නැහැ.අලුතින්ම තමයි දාන්න ඕනේ.මීට පෙර මං ඔය වගේ යෝජනා ඉදිරිපත් කළා.ඒ දෙපාර ම මට ලිඛිතව ලිපි එවුවා එහෙම ඉදිරිපත් කරන්න අවශ්‍යා නැ කියලා.මෙතන ගැටලුව තියෙන්නේ අලුතෙන් ම දාන්න බෑ කියන එක.මම විශේෂ අවධානය යොමු කරනවා, එතන ගම්මානයක්. උඩුමත්ත වසම අයිනටම තියෙන ගම්මානයක් හින්දා නව විදුලි පහන් කණු තුනක්වත් ලබා දෙන්න කියන ඉල්ලීම කරනවා.සභාපතිතුමනි විජේනායක මාවතේ වරිපනම් එකතු කරන්න යනවා රෝහිණී මල්ලිකා කියන මහත්මියගේ නිවසට.දැනට වසර 20 කට එහා ඉදලා ඒ නිවසෙන් වෙනමම වරිපනම් ගන්නවා.ඒ ගෙදරම ඉස්සරහ කාමරේට සමෘර්ධි සංවර්ධන නිලධාරී කාර්යාලය කියලා වෙන ම වරිපනම් අය කිරීමක් කරනවා.දිගින් දිගට ම මේ වෙනකන් අය කරගෙන ඇවිල්ලා, මේ ගමන අපේ වරිපනම් වැඩි වීමත් එක්ක ම ඒක ගෙවා ගන්න විදිහක් නැ කියන ඉල්ලීම කියලා ලිඛිතව ලිපි දුන්නා.ඒ ගැනත් අවධානය යොමු කරන්න කියන ඉල්ලීම කරනවා.මොක ද අවුරුදු 5 ක් වගේ යන කොට සමෘර්ධි නිලධාරී එතනින් අයින් වෙලා.දැන් කාර්යාලයක් නැ.ඒ නිසා එක ගෙදරින් වරිපනම් බදු දෙකක් එකතු කරන එකක් තමා තියෙන්නේ.ඒ ගැන මං විශේෂ අවධානය යොමු කරනවා.
ඒත් එක්ක ම මෝරගල අවට තියෙන වෙල් යායේ හිමිකරුවෙකුට ගෙවීමක් නැතුව වුණත් මේ වන විට අනවසර ඉදිකිරීම් කරගෙන යනවා.අනවසර ඉදිකිරීම් කියන්නේ ස්ථිර ඉදිකිරීම් තමා කරන්නේ.ඒ ගැනත් අවධානය යොමු කරන්න.
ඒ වගේ ම පනාවල පාරේ ඔබතුමාගේ බල ප්‍රදේශයේ ඒ කඩ පේලියෙන් කියන දෙයක් තමයි, එතන මාර්ගයේ තියෙන විදුලි බල්බ්.සභාපතිතුමා පත් වෙන්න ඉස්සෙල්ල නම් මෙතනට ඇවිත් විදුලි බල්බ් දාල දෙනව කියලා ගියාට තාම විදුලි බල්බ් එකක්වත් දාල නැ කියලා කියනවා.ඒකටත් පිළියමක් යොදන්න කියලා කියනවා.
ඒ වගේ ම මාහර පාරේ විදුලි බල්බ් ටික දානව කිවුවා.ඒක නැ.ඒත් එක්ක ම බේරුවාන වත්ත තොරණගොඩ විද්‍යාලය ගාවින් තියෙන පාරේ, පනාවල අයියා කියලා කියන්නේ.මම නම දන්නෙ නැ.උපසභාපතිතුමා පෞද්ගලිකව දන්නවා කියලා කිවුවා.මම ඉල්ලීම කලේ ඒ බල්බ් එක දාල දෙන්න කියලා විතරයි කිවුවා.ඒක තාම මට දාල දුන්නැ කියලා කිවුවා.ඒ ගැනත් අවධානය යොමු කරන්න කියනවා.

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, රත්නපුර ඉදන් එනකොට මාරගහ ළඟ තමා පළවෙනි හෝල්ට් එක තියෙන්නේ.ඊළඟට ගානට එක ගාව.අතරමඟ යන අයට, පුස්තකාලය කිට්ටුව මඟීන් නවත්තලා ගන්න බස් හෝල්ට් එකක් ඉදිකිරීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා.

**සභාපතිතුමා:-**
මන්ත්‍රීවරු ගොඩක් කතා කරපු කාරණා 12 වෙනිදා පැවැත්වෙන නගර සැලසුම් සම්බන්ධව තියෙන රැස්වීමේදී විසඳගන්න පුළුවන්.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, තලාවිටිය ජල යෝජනා ක්‍රමයේ දැන් පවතින ප්‍රගතිය පිළිබඳව දැන ගන්න කැමතියි.ඉස්සරහට දේශගුණික විපර්යාසත් එක්ක ජල ප්‍රශ්නයට මුහුණදීමේ අවධානම වැඩියි.තලාවිටිය ජල යෝජනා ක්‍රමය වෝටර් බෝර්ඩ් එකේ ජල යෝජනා ක්‍රමයත් එක්ක සම්බන්ධ කරලා නගරයේ ජල ප්‍රශ්නය විසඳනවා කියලා මුලදිම ආවා.ඒකෙ ප්‍රගතිය දැන ගන්න කැමතියි.

පොල භූමිය අනාගතයේ ස්ථාපිත කරයි කියලා දැඩි විශ්වාසයෙන් ප්‍රකාශ කරන්නේ.පොල භූමියේ කසල එකතු කිරිමට එක සේවකයෙක් පමණයි ඉන්නේ.ඒ සේවකයා අසනීප වුණොත් එහෙම, තව සේවකයෙක් අනුයුක්ත කරන්න පුළුවන් නම් නීතිමය රාමුව තුළ හොඳයි කියලා මම යෝජනා කරනවා.
ඇහැලියගොඩ පොලභූමිය සංවර්ධනය කිරීමට ගත් තීන්දුව පිළිබඳව මම ප්‍රණාමය පුද කරනවා.පොල මේ මට්ටමක හරි රැඳිලා තියෙන්නේ ව්‍යාපාරික ප්‍රජාව එක්කෙනෙක් හෝ දෙන්නෙක් නිසා හරි, පොල භූමිය රැඳිලා තියෙනවා.පොල භූමිය ඒ අයත් අත අරින කාලය වැඩි ඈතක නෙමේ.ඒ තත්ත්වයට පත්වෙලා තියෙන්නේ.පොල භූමියේ යම් සංවර්ධන කටයුත්තක් කරනව නම් දැනට පොල භූමියේ ඉන්න වෙළෙන්ඳන් එක්ක සාකච්ඡාවකට ගිහිල්ලා ඔවුන්ගේ අදහස් ගන්න කියලා මං යෝජනා කරනවා.
ඒ වගේ ම සුසාන භූමිය සම්බන්ධව සමන්සිරි මන්ත්‍රීතුමත්, සුමිත් මන්ත්‍රීතුමත් අදහස් ප්‍රකාශ කළා.දැනට ඒකේ සේවකයා ප්‍රතිකාර ගන්නවා ආතතියටයි, හන්දිපත් රුදාවටයි.ඒකෙ තියෙන අඩුපාඩු ටික, මානසිකව එතුමාට ප්‍රශ්නයක් වෙලා තියෙනවා.ඒ ගැන විශේෂ අවධානය යොමු කරන්න කියලා කියනවා.
ඒ වගේ ම රෝහලට ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට හා රෝහලට යන අයගේ ප්‍රයෝජනය සඳහා බස් ටික දුම්රිය මාර්ගය හදන තෙක් ඒ සඳහා අවධානය යොමු කරන්න කියලා.දැනට බස් හරවන්න ඉඩ තියෙනවනේ.
ඒත් එක්ක ම හැකියාවක් තියෙනව නම් පොලිසිය මැණික් සංස්ථාව ඉදිරිපිට බස්හෝල්ට් එකක් හදන්න, ඕන්නම් පීපල්ලීසින් එකේ අනුග්‍රහය දෙන්න කැමැත්ත ප්‍රකාශ කරලා තියෙනවා.මට ලිඛිතව ඒ ඉල්ලීම ලබා දෙන්න පුළුවන්.නගර සංවර්ධන සැලසුම් එක්ක එතන බස් හෝල්ට් එකක් හදන්න පුවුවන් නම් එතන ඒ ආයතනයත් එක්ක සම්බන්ධිකරණය වෙන්න කියලා යෝජනා කරනවා.

**සභික ඩී.ගයානි බුද්ධිකා මැතිනිය:-**
ගරු සභාපතිතුමනි, මම එදත් කිවුවා ඡන්දය වෙනුවෙන් කරපු දේශපාලනය ඉවරයි.දැන් කොට්ඨාශයේ මන්ත්‍රීවරිය හැටියට වගකීම ජනතාව නගා සිටුවීම.බල්බ් දාගන්න එක කවුරු කොහොම කළත් ප්‍රශ්නයක් නෑ.මං හිතන්නේ අපේ වත්සලා මන්ත්‍රීතුමිය ඒකට සාක්ෂි දරයි.දේශපාලනය බල්බ් එක වෙනුවෙන් ගාව ගත් නැතුව, එතුමිය ප්‍රකාශ කළා ඒ ප්‍රදේශයේ බල්බ් හතරක් තියෙනවා, ඒක දාල දෙන්න කියලා.එදා බල්බ් හම්බුණාට පස්සේ ඒ බල්බ් දැම්මා.ඡන්දය වෙනුවෙන් කළ දේහපාලනය එතනින් ඉවරයි.දැන් පිළිවෙළට බල්බ් දාන්නේ.මං එදත් කිවුවා.නැවත නැවත කියන්න ඕන් නෑ.අපිට ඉල්ලීම ලැබුණු විදිහට තමා ඒ බල්බ් ටික දැම්මේ.ඒක තැනින් තැන වුණත් ඒක ඒවෙලාවේ දී කරන්න දෙයක් නෑ.වත්සලා මන්ත්‍රීතුමිය ගෙනා යෝජනාව දැඩි ලෙස සැලකිල්ලට අරගෙන ප්‍රදේශය ආරම්භයේ ඉඳන් බල්බ් පිච්චිලා තියෙන්නේ කොතනද ඒ ආකාරයෙන් තමා ඒ බල්බ් ටික දැම්මේ.මේක පුණ පුණා කියන්න එපා.මේ දේශපාලනය වෙනුවෙන් මේ බල්බ් එකේ ආලොකය මිනිසුන්ට දෙනවා කියලා.මට නම් හරිම කණගාටුයි.ඒ බල්බ් එකේ ආලෝකය ලබා ගන්න.ඒක එළියක්නේ.ඒ එළිය ගැනත් පොඩ්ඩක් නිහතමානීයව බලන්න.
සුජීව මන්ත්‍රීතුමා නැති වුණත් මම කියන්න ම ඕන.ගරු සභාපතිතුමනි, සුජීව මන්ත්‍රීතුමා නැති වුණත් මම අනිවාර්යෙන් ම කියන්න ඕනේ බෝපැත්ත ගම මතයක් ගෙනියනවා ඇති, එතුමා කියනවා ගොවි සමිතියටවත් එන්න බැරිලු.මං දන්නැ.එතුමා මොන වගේ මතයක් දැරුව ද කියන එක.මම ඒ සමිති ගැන පොඩි කාරණා කිහිපයක් කියන්න කැමතියි.(ඝෝෂාව) ගමක් නියෝජනය කරන කොට අනිවාර්යෙන් ම සමිතියක් වෙනුවෙන් කතා කරන්න ඕනේ.දේශපාලන මැදිහත් වීමක් ඒ සමිතියට වෙලා නෑ.මොකද අපේක්ෂකත්වය දරපු අය තමා එතන ඉන්නේ.දැඩි ලෙස හෙලා දකිනවා කාන්තාවන් වෙනුවෙන් කතා කරපු විදිහ.මම ත් කාන්තාවක් විදිහට.ඇත්තට ම මම නම් බයයි.වැරදි වැඩ කරන්න, වැරදි ප්‍රචාරණය කරන්න. හරිම බයයි.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම කියන්න කැමතියි අපි දිගින් දිගට ම මාස ගානක් තිස්සේ නිවරදි මාවතකට යන්න කියලා කිවුවා.ඒ නිසා තමා දැන් ඔය බල්බ් ටික පිළිවෙලට දාලා තියෙන්නේ.සභාපතිතුමනි, මට දැන ගන්න අවශයයි මෝරගල ඉඳන් ඉද්දමල්ගොඩ මාර්ගය, ජනතාවට පොරොන්දු වෙලා තියෙනවා පලවෙනි කාර්තුව තුළ හදලා ඉවර කරනවා කියලා.දැන් මාසයයි දවස් 10 ක් ගිහින් ඉවරයි.ඒ සම්බන්ධව ප්‍රගතියක් තියෙනව ද කියලා දැන ගන්න කැමතියි.මිනිස්සු අපෙන් අහනවා මේ සම්බන්ධ ප්‍රගතිය මොකක් ද කියලා.පළාත් මාර්ගය.

**සභාපතිතුමා:-**
ඒක මේ වන විට පැති බැම්ම දානවා.පැති බැම්ම පටන් අරන් තියෙනවා.මන්ත්‍රීතුමා දන්නවද දන්නෑ.අපිට ඒ මාර්ගය ලක්ෂ 20 වගේ ඒවා දාලා කොන්ක්‍රිට් දාන්න අවස්ථා කීපයක් ම ආවා.නමුත් වැඩි දෙනාගේ ඉල්ලීම මත කාපට් දාන්න තමා අපි දැන් අදහස් කරන් ඉන්නේ.ඒකෙ පළවෙනි කාපට් මාර්ගය පහුගිය මාසවල කෝටි 17 ක් වගේ වියදම් කරලා කාපට් දාල ඉවරයි.
**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
සභාපතිතුමනි අපි කලින් හඳුනාගෙන තියෙනවා ප්‍රධාන පාරවල් 3 ක්.ඒවා තමා යාය පාර,

**සභාපතිතුමා:-**
එක යාය පාර නෙමේ.එක පොල ගාවින් තියෙන අස්ගගුල පාර, දෙක පැල්පිටිය ඉද්දමල්ගොඩ පාර, තුන යාය පාර.RD එකෙන් ඇවිත් ඇස්තමේන්තු හදනවා.පැල්පිටිය පාරේ පොඩි ගැටලුවක් තියෙනවා.මන්ත්‍රීතුමා පුළුවන් නම් විසඳලා දෙන්න.ටවුමේ ඉඳන් ටික දුරක් යනකොට පාර ගොඩක් පටුයි.තාප්ප කඩ කඩ හිටියොත් ලොකු කාලයක් යනවා.ඒකට වෙන ම ක්‍රමවේදයකට යන්න වෙනවනේ.අධිකරණ කටයුත්තකටත් යන්න වෙනවනේ.තියෙන ගානට ම දානව නම් මාස තුනක් ඇතුළත වගේ දාන්න පුළුවන්.ප්‍රමිතියට ම අනඅව කාපට් කරන්න ගියොත තමා කාලය මදි වෙන්නේ.ඒ සම්බන්ධව ඔබතුමන්ලගේ මැදිහත් වීම ඉතාමත් අත්‍යාවශ්‍යයි.නීති මාර්ගයෙන් කටයුතු කරන් නැතුව සාකච්ඡා කරලා කරන්න පුළුවන් නම් අපට ඉක්මනට කරන්න පුළුවන්.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, පැල්පිටිය ගමේ ප්‍රචාරය ගිහිල්ලා තියෙන්නේ ඒ පාරවල් 3 න් ප්‍රමුඛතම පාර පැල්පිටිය මාර්ගය කියලා.ඒක නිවරදි කිරීමක් ඔබතුමා දැන් කළා.

අනිත් එක තමා අවස්ථා දෙකකදී මුදල් ප්‍රතිපාදන වෙන් වුණත්, මේ ළඟ දී ප්‍රදේශවාසීන්ගේ ඉල්ලීමකට පළාත් සභාවෙන් පිළිතුරක් හම්බුණා ප්‍රදේශ වාසීන්ගේ විරෝධතාවය මත ඒක නතර වුණා කියලා.පළාත් සභාවෙන් ආපු ලිවුමේ තියෙන්නේ.සභාපතිතුමා දකින්න ඇති.මේ ආණ්ඩුවේ නෙමේ.කලින් ආණ්ඩුවෙන් මේ පාර හදන්න හැදුවා, හැබැයි ඒ ප්‍රදේශවාසීන් ඉන්නේ npp එකේ.ඒ නිසා මම මැදිහත් වෙනවට වඩා, කොට්ඨාශ සභාව, නැත්නම් අලුතින් පිහිටුව ගත්ත ප්‍රජා ශක්ති වැඩ සටහන හරහා ඒ අය එක්ක කතා කරලා ඒ ගැටලුවට විසඳුම් හොයන එක තමා වඩාත් ම සාර්ථක.මං දන් නෑ එයාල තවදුරටත් මේ මාර්ගය හදන්න ඉඩ දෙයිද කියලා.කෙසේ වෙතත් ඔබතුමාල පොරොන්දු වෙලා තියෙනවා පළවෙනි කාර්තුව ඇතුළත මේ මාර්ගය කාපට් කරනවා කියලා.රජයේ ව්‍යාපෘතියක් තියෙනවා, මං දන්නැ ඒක පටන් අරන් ද තියෙන්නෙ කියලා.ඔබතුමා කියන විදිහට අස්ගගුල පටන් අරන් තියෙන්නේ.ඒක හදන්නේ RD එකෙන්ද?එතකොට පැල්පිටිය පාර හදන්නෙත් RD එකෙන්ද?

**සභාපතිතුමා:-**
ඔව් RD එකෙන්.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ඒකත් මට පැහැදිලි කිරීමක් කරන්න.අනිත් කාරණාව තමා සභාපතිතුමනි අපිට හම්බෙලා තියෙන අයිඩින්ටියේ පස්සෙ දැක්කෙ අපේ මන්ත්‍රීවරු කිවුවට පස්සේ.මේකෙ පක්ෂයේ නමත් තියෙනවා.ඔබතුමා කියන විදිහට අපි හැමෝ ම එකයිනම් පක්ෂයේ නම.මමත් දැක්කේ පස්සේ.(ඝෝෂාව) මං දන්නැ අනිත් ප්‍රාදේශීය සභාවල ඔබතුමා බලන්න පක්ෂයක නමක් දාලද තියෙන්නේ කියලා.ඒ ප්‍රශ්නයට පිළිතුරක් මම බලාපොරොත්තු වෙනවා.

**සභික පී.මාලින්ද මුදන්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මං හිතනවා වැඩිම මන්ත්‍රීවරු ඉන්නේ යකුදාගොඩ කියලා.මොකද මන්ත්‍රීලා 4 දෙනෙක් ම ඉන්නවා.ගමට සංවර්ධනයක් වෙනව නම් මගෙනම් බලාපොරොත්තුවක් නෑ මගෙ නම ගහන්නවත්, මං ඉදිරිපත් වෙන්නවත්.මම හැබැයි යෝජනාවක් දැම්මා, මං කතා කරන්නවත් කැමති නැති මාතෘකාවක්.මං කිවුවා කයිනයට කලින් නාකන්දල,මියගිය නිමල් මන්ත්‍රීතුමාගේ ගෙවල් පාරේ, සභාපතිතුමාගේ හොඳම යාළුවගේ ගෙවල් පාරේ බල්බ් කයිනයට කලින් දාන්න කියලා.හැබැයි මේ වෙනකන් දාල නෑ.මන්ත්‍රීලා අපි 4 දෙනෙක් ඉඳලත් ඒ බල්බ් දෙක ආරියදාස මන්ත්‍රීතුමාටවත් දා ගන්න බැරි වුණා.අනිත් එක සභාපතිතුමනි ගමේ දැන් මාස 8 කට කිට්ටුයි මේ සභාව.ඇහැලියගොඩ යකුදාගොඩ කියන ගමේ,මගෙ ගම.ඒකයි මම මේ කතා කරන්නේ.ආරියදාස මන්ත්‍රීතුමා ඉන්නෙත් ආරියදාස මන්ත්‍රීතුමා ඉන්නෙත් ගයාෂාන් මන්ත්‍රීතුමා ඉන්නෙත් ඒකෙ.ඒකට වෙලා තියෙන සංවර්ධන කටයුතු මොනවද කියලා මට ඒක ලොකු ප්‍රශ්නයක්.එකම එකයි වෙලා තියෙන්නේ.ඒකත්, ග්‍රාමීය කම්ටුවට මම ගියා.පළමු පටුමගේ කොන්ක්‍රීට් ටිකක් විතරයි දාල තියෙන්නේ.වෙන මොකුත් වෙලා නෑ.ආරියදාස මන්ත්‍රීතුමාට යන්න බැරමව ඇති.අපි යනකොටත් අපිව සවුත්තු කරනවා.මෙතුමත් යෝජනා කළා.සභාපතිතුමත් කිවුවා, මහේෂ්ලගෙ ගෙවල්වලට යන පාර අනිවාර්යෙන් හදන්න ඕන කියලා.ඒවා සංවර්ධන යෝජනාවලට දැම්මට වැඩේ වෙලා නෑ සභාපතිතුමනි.සභාපතිතුමනි, මොනවහරි සංවර්ධන කටයුත්තක් කරනකොට අපේ ගමට ම කරන්නත් එපා.ටවුන් එකට ආසන්නම ගමනේ.ඒකට ලොකු අවධානයක් දෙන්න.
කිරිපෝරුව ගමේ.අපේ චමිලා මන්ත්‍රීතුමියගේ ගමේ කිරිපෝරුව කන්දෙ ගෙදර ..... විතරයි පාර තියෙන්නේ.අනිත් ටික කොන්ක්‍රීට් කරලා ගලින් ගලට පැන පැන තමා යන්න තියෙන්නේ.එතනින් බයිසිකලක් එක්ක වාහනයක් මාරු කළොත් බයිසිකලේ යන කෙනා වැටෙනවා.ඇයි ගලින් ගලටනේ යන්න තියෙන්නේ.
අනිත් කාරණාව තමා අපේම සේවකයින් ගේ ආරක්ෂාවට යෝජනාවක් කළා.රෑට ට්‍රැක්ටර්වල යද්දි ජේන් නෑ පිටි පස්සෙන් එන අයට.ලොකු වියදමක් යන් නෑ.පොඩි ගානක් වියදම් කරලා කුම්නස් ස්ටිකරයක් ගහන්න කියලා.තාම නෑ.ඒකවත් සභාවේ මුදලින් කර ගන්න බැරි තත්ත්වයක් මං හිතන්නේ වෙලා ඇත්තේ.එහෙම නොවෙනවනම් මේ වෙන කොට ඒ දේ සිදු වෙලා තියෙන්න ඕනේ.

**සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ගියවර සභාවාරයේ දී බොපැත්ත දිද්ද කොට්ඨාශයේ වීථි පහන් ගැන කතා කළා.ඒ වෙලාවේ ඔබතුමා මුලාසනයේ හිටියේ නෑ.උපසබාපතිතුමා තමා මුලාසනයේ හිටියේ.මගේ ඉල්ලීම වුයේ මේ දාන බල්බ් කොට්ඨාශයේ ආරම්යේ සිට අවසානය දක්වා මේ වීථි පහන් පිළිවෙළට දාන්න කියලා.එතනදී උප සභාපතිතුමා කියා සිටියා එහෙම තමා කියලා තියෙන්නේ එහෙම තමයි කරන්නේ කියලා කිවුවා.ඉතින් දෙවනි වතාවේදීත් වීථි පහන් දාලා තියෙනවා.හැයි ඒ අනුව කටයුතු කරලා තියෙනවා.ඒකට මම ඇත්තට ම ස්තුතිවන්ත වෙනවා.තව ප්‍රධාන මාර්ගයේ වීථි පහන් සඳහා බල්බ් දාන්න තියෙනවා.ඒ ටිකත් සම්පූර්ණ කරලා ඉතුරු අතුරු මාර්ගවලටත් බල්බ් දාන හැටියට මම ඉල්ලීමක් කරනවා.ඒ වගේ ම අයුක්තියක් අසාධාරණයක් සිද්ධ වෙනව නම් ගමේ දී වගේ ම ( පැහැදිලි නැ)

**සභික නිරෝෂිකා කැලුම්සිරි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, මම මේ වෙලාවේ පොඩි වේලාවක් ගන්නවා.ස්පා සම්බන්ධව මම කතා කළේ නෑ.මේ කතාවලින් මීන්නානේ ගොඩක් තියෙනවා වගේ කතාවක් ආවා.ඇත්තට ම මීන්නානේ තියෙනවා තමයි.මින්නානෙ විතරක් නෙමෙයි ගැටහැත්ත මින්නාන තොරණගොඩ මාහිංගොඩ දිගට ම තියෙනවා.ඒවගේ ගණිකා ජාවාර ම එක්ක ම මත්ද්‍රව්‍ය ජාවාර ම යනවා.මම ඔය සම්බන්ධව ඊයේ ඇහැලියගොඩ පොලිසියට, ගමේ මිනිස්සුන්ගේ අත්සන් ලේඛනයක්ද එක්ක ලිවුමක් භාර දුන්නා.මාත් එක්ක ඩිල්ෂාන් මන්ත්‍රීතුමාත් මාත් එක්ක ඒ අවස්ථාවට සම්බන්ධ වුණා.ඒක මම මේ වෙලාවේ මතක් කරනවා.අනිත් එක ස්පාවල වැඩ කරන කාන්තාවෝ වෙනුවෙන් සන්වේදීව කරුණාවෙන් කතා කරපු අපේ සභාවේ මන්ත්‍රීවරු, ගමේ නායකත්වයත්වය අරන් ඉස්සරහට එන ගමේ කාන්තාවන්ට කතා කරපු විදිහ මේ සභාවේ ඇත්තට ම හරිම ලැජ්ජා සහගතයි.මොක ද මමත් කාන්තාවක්.ඒ කාන්තාව මොන දේ කළත් ගමේ යන කට කතාවලට ගැහැනියකගේ චරිත මනින්න බෑ.අනිත් එක.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක්. කෙනෙක් කතා කරන කොට බාධා කරන එකයි.කතා කරන මන්ත්‍රීවරයා අනිත් අය එක්ක උත්තර දෙන එක දෙකක්.මෙතනින් එහාට ඒ වැඩේ නවත්තලා සාපතිතුමාට මේ වැඩේ කරන් යන්න සහයෝගය දෙමු.කතා කරන මන්ත්‍රීවරුත් කෙළින් ම සභාපතිතුමාට කතා කරන විදිහට කතා කරන්න.

**සභික නිරෝෂිකා කැලුම්සිරි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, බොහොම කණගාටුයි සභාපතිතුමා, මොකද මාත් කාන්තාවක්.ඒ කාන්තාව කරන දේශපාලනයවත් රැකියාවවත් නෙමෙයි කාන්තාව කියන එක අපි මේ වෙලාවේ සියලු දෙනා ම පිළිගන්න ඕනේ.කැත විදිහට කතා කරන එක නවත්වන්න කියලා මම මේ සභාවෙන් ඉල්ලා සිටිනවා.මම මේ කිවුවේ කවුරුත් පුද්ගලයෙක් ඉලක්ක කරගෙනවත්, කිසි ම කාන්තාවක් ඉලක්ක කර ගෙනවත් නෙමේ.සමස්ථ කාන්තාවෝ වෙනුවෙන්.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමා.මම ඒ කතා කළේ සභාවට ගෙනාපු හදිසි යෝජනාවක් සම්බන්ධවයි.ඊට පස්සේ මම දැන් නැගිටින්න හදනකොට ම, අමිල් මන්ත්‍රීතුමා නැගිටිනවා දැක්කා.ඊට පස්සේ මම ඉඳගත්තා.ඊට පස්සේ මට සභාපතිතුමා මට අවස්ථාව දුන්නා, මට කතා කරන්න කියලා.සභාවේ සභා රීතිවල නීතිය තමා සභාවේ මුලින් ම නැගී සිටින කෙනා සභාපතිවරයා දකින කෙනා.මම කොච්චර වෙලාසන නැගිට්ටත් වැඩක් නෑ සභාපතිවරයා දැක්කෙ නැත්නම්.ඒක තමා රීතිය.

ගරු සභාපතිතුමනි, අපි ගිය සභාවේ අවස් වෙලාවේ, ඔබතුමා හිටියේ නෑ අවසන් වෙලාවේ.උපසභාපතිතුමා තමා සභාව මෙහෙය වුයේ.ඒ වෙලේ මමත් අදහස් දැක්වීමක් කළා.අපිට සභාවෙන් දැනුවත් කරලා තිබුණා ජනවාරි පළවෙනිදා රජයේ රාජකාරි ආරම්භ කරන  උත්සවයට අපේ දායකත්වයක් ලබා දෙන්න කියලා.ඒකට අපි දායකත්වය ලබා දුන්නා.ඒ වගේ ම අරමුදලුත් අපිටත් බෙදන්න කියලා.මගේ කතාව කියවලා බලන්න.නිමේෂ් මන්ත්‍රීතුමා ඒකට අදහස් දැක්වීමක් කළා.නෑ ඒක නිලධාරීන් දාපු දෙයක් කියලා.මම ඒ සම්බන්ධයෙන් ඔබතුමාගෙන් ඉල්ලුවා ඒ සම්බන්ධව විමර්ෂණයක් කරලා ඒකෙ ඇත්ත තත්ත්වය ප්‍රකාශ කරන්න කියලා.මට ඒකට උත්තරයක් ලබා දෙන්න ගරු සභාපතිතුමා.

ඊළඟට තියෙන කාරණය තමා, අපි මීට මාස තුනකට හතරකට කලින් අපිට යෝජනාවක් ආවා පාසල් බස් රථවලින් පොලේ නවත්වන්න ඉඩ ලබා දෙන්න පැයකට ගාස්තුවක් සමඟ.අපි ඒකට කමිටුවකුත් දැම්ම මට මතක විදිහට.එතකොට අපි ඒ සම්බන්ධව ගත්ත තීන්දුව මොකද්ද කියලා දැන ගන්න කැමතියි.එතකොට 7.30 ට එන බස් අපි පොලේ ගිහින් දාන්න අවසර දෙනවද නැද්ද කියන එක.ඒකත් පොඩි මතක් කිරීමක් කරන්න තියෙනවා.

තව දෙයක් තමා අපේ හිටපු සභාපති, මං අපේ දිලීන් මන්ත්‍රීතුමාගෙන් ප්‍රකාශ වෙයි කියලා බලාගෙන හිටියා.අපේ හිටපු සභාපතිවරුන්ගේ ඡායා රූප අපි මේකෙ එල්ලලා තියෙනවා.2018-2022 කාලයේ වැඩ කරපු අපේ මහජන පක්ෂයේ සභාපතිවරයා වු තිලක් රෝහන ජයවික්‍රම මැතිතුමාගේ ඡායා රූපයකුත් මෙතන ප්‍රදර්ශනය කරන්න පුළුවන් නම් ඒක හොඳයි කියලා මම යෝජනා කරනවා.සියලුම සභාපතිවරුන්ගේ ඡායා රූප ටික මෙතන තියෙනවා.

ඊට පස්සෙ කාරණය තමා, අයිඩින්ටි කාර්ඩ් සම්බන්ධව කතා කළා.පක්ෂයේ නම දාල තියෙන එක සම්බන්ධව.ඒ සම්බන්ධව මට තව ගැටලුවක් තියෙනවා.මේක අත්සන් කරලා තියෙන්නේ සාපතිවරයා හා සභාවේ ලේකම්තුමා.මේක මෙච්චර කාලයක් අත්සන් කළේ පළාත් සභාවේ ප්‍රධාන ලේකම්තුමා අත්සන් කරලා 1991 ඉඳන් 2018 දක්වා අයිඩින්ටි කාර්ඩ් ලබා දුන්නේ.එතකොට ඒකේ ගැටලුව තමා තියෙන ඔබතුමාලට ඉහලින් තමා සභාව තියෙන්නේ.එතකොට සභාව තමා එක.දෙක සභාපතිවරයා, ඊටපස්සේ ලේකම්තුමා ඉන්නේ.මේක වැරදියට හිතන්න එපා.ඒ බලය ගොඩ නැගීමේ පිළිවෙළ අනුව, ඔබතුමාට අත්සන් කිරීමේ ගැටලුවක් තියෙනවා කියලා මං හිතනවා.මොකද 1991 ඉඳන් 1991,1997,2001,2006,2011,2018 ප්‍රාදේශිය සභා හයක් තිබුණා.එතකොට ඒ ප්‍රාදේශිය සභා සියල්ලෙහි ම ප්‍රධාන ලේකම්වරයා තමා අත්සන් කරලා අයිඩී කාර්ඩ් එක ලබා දීලා තියෙන්නේ.එතකොට මේ සියලුම සභිකයන් ව පහතට දැමීමක් සිදු වෙලා තියෙනවා කියලා මම මේ වෙලාවේ ප්‍රකාශ කරනවා.

ඊට පස්සේ අපි කතා කරා ස්පා සම්බන්ධව.තායිලන්තයේ ප්‍රධාන ආදායම් මාර්ගය පතාය බැංකොක්වල තියෙන ඕක නෙමේ.එයාල 70% ලබා ගන්නේ සංස්කෘතික අංග  තමා එයාල විකුණන්නේ. එතකොට ගණිකා වෘත්තිය සම්බන්ධව තියෙන්නේ 9% කටත් අඩු ප්‍රමාණයක්.එතකොට ලෝකේ ප්‍රධාන ම රට තමා ඉතාලිය එගලන්තය, ජර්මනිය, ඔය රටවල් තමා අපේ තියෙන ඉතිහාසය, අපේ සීගිරිය වෙන්න පුළුවන්, ඒ රටවල තියෙන මාලිගා විකුණලා එන සචාරකයන්ට ඒවා පෙන්වලා අදායම් මාර්ග සොයා ගැනීම.ඒක නිවරදි කිරීමක් කළේ නැත්නම් කතාවල් එකතුවෙලා වෙන තැනකට අපේ රටත් යන්න ඉඩ තියෙනවා.පතාය වගේ කරමු කියලා.දැන් කවුරුත් බැංකොක් පතාය යන් නෑ.ගෙවල්වලින් ප්‍රශ්න හින්දා.

ඊළඟට කතා කරන දෙය තමා, ආරක්ෂක කමිටු සංවර්ධන කමිටු ගම්වල තියෙනවා, මගේ පදිංචිය තියෙන්නේ යකුදාගොඩ වසමට.මහපාරේ ඉඳන් මීටර් 100 ක් මීටර් 120 ඇති.ඒ කොට්ඨාශයෙන් වත් මට කැඳවීමක් ලැබෙන් නෑ.මං උපන්ගම විදිහට හඳුන්වන පලීගලින්වත් මට කැඳවීමක් ලැබිලා නෑ මේ වෙනකම් කිසි ම කමිටුවකට.අපි මේ ඉන්න කිසිම මන්ත්‍රීවරයෙකුට කැඳවීමක් වෙලා නෑ.මම ඔබතුමාගෙන් ඉල්ලනවා, ඉස්සරහා ඔබතුමා අපිට ඒ කමිටවලට කතා කරන්න, අපි ඒ අවශ්‍යතාවයන් ලබා දෙන්නම්.සේවය ලබා දෙන්නම්.

ඒ වගේම අපේ නිරෝෂිකා මන්ත්‍රීතුමිය ප්‍රකාශයක් කළා යම්කිසි කාන්තාවක් සම්බන්ධයෙන් අපහසුතාවක් ඇති වෙන විදිහට අපේ මන්ත්‍රීවරයෙක් කතා කළා කියලා.ඒකෙ මුල බලන්න ඕනේ.මොකද්ද ඒ කතාවේ මුල

කියලා.එතුමා කිවුවේ එතුමාගේ නම ඒ කමිටුවෙන් ඉවත් කරන්න ඒ අදාළ කාන්තාව මැදිහත් වුණා කියලා.කාටවත් චරිත සහතික දෙන්න මම යන්නෑ.ඒ සම්බන්ධව තමා එතුමා අදහස් ප්‍රකාශ කළේ.

ඊළඟ දේ ගරු සභාපතිතුමා අපේ සභාවේ තියෙන බාර්ත් රූම් එක.ඒක අපේ තියෙන FD එකක් හරි කමක් නෑ අරගෙන පුළුවන් නම් අපි හදමු.ඒ නිසා ඒක හදන්න කියලා මම යෝජනා කරනවා.අපි මාසෙකට දවසයි එන්නේ.ඕන්නම් කමිටුවකට දවසක් දෙකක් එයි.ඒ නිසා නිලධාරීන්, සභාපතිතුමා, උපසභාපතිතුමා ආණ්ඩුපක්ෂයේ මන්ත්‍රීවරු, මන් දකිනවා ගොඩක් එනවා සභාවට.ඔවුන් ආවට පස්සේ තමන්ගේ තියෙන ශරීර අවශ්‍යතාවය ඉෂ්ඨ කර ගන්න යන්න තියෙන්නේ ඕකට.ඉතිං එක නිසා එක පොඩ්ඩක් පිළිවෙළ කරලා FD එකක් හරි කමක් නෑ අරගෙන මේක හදන්න කියලා මම යෝජනා කරනවා.

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපි ප්‍රාදේශීය සභා කොට්ඨාශයක් විදිහට ඇහැලියගොඩ බලය අරගෙන දැන් මාස 6 ක් 7 ක් වැනි කෙටි කාලයක් තුළ ඉතාම සංවර්ධන වැඩසටහන් විශාල ප්‍රමාණයක් කරගෙන ගියා.මේ වගේ ඉදිරි සංවර්ධන කටයුතුත් කරගෙන යන ගමන් නගර සැලසුම ඇවිත් තියෙනවා.ඒ නගර සැලැස්මට ඇත්තට ම සියලු දෙනා ම එම සහයෝගය ලබා දී ඇහැලියගොඩ සවර්ධනය කිරීමට දායකත්වයක් සියලු පක්ෂවලින් සියලු ජනතාවගෙන් ම ලබා ගැනීමට ඕන.මොකද අපේ නගරය ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සංවර්ධනය අතින් ශ්‍රීඝ්‍රයෙන් ඉදිරියට යන කාලයක් මේ කාලය.ඇත්තට ම අපේ සභාපතිතුමත් මේ දවස්වල ගොඩක් කාර්ය බහුල වුණා.සමහර අවස්ථාවලදී එතුමා ජෝගින් යන ගමන් එතුමා සංවර්ධන ව්‍යාපෘති නිරීක්ෂණයට ආවා.ඇත්තටම එතුමන් සභාවේ වැඩි කාලයක් ගත කරමින් සියලු දේ අධික්ෂණය කරමින් නගර සැලසුම ඒ වගේ ම සංවර්ධන වැඩසටහන් ගැන මැදිහත් වීමත් කරගෙන යනවා.රටම එකට ජාතික මෙහෙයුම අපි හැම දෙනාගෙම සහයෝගය ලබා දෙන්න.මත්ද්‍රව්‍යවලින් තරුණ තරුණයින් බේරා ගැනීමේ මෙහෙයුම යනවා.ඒ වගේ ම ඔබතුමාල සියලු දෙනාගෙන් ම සහයෝගය ලබා දෙන්න.මොනව හරි තියෙනව නම් අදාළ පොලීසිය දැනුවත් කරන්න.ඒ වගේ ම රටක් විදිහට ඉස්සරහට යන කොට නගරයක් විදිහට දියුණුවක් කරා යන කොට ඒ නගරය හා ඒ සියලු දෙනාගෙ ම සහයෝගය ලබා දීම.ඇත්තට ම දැන් රාජ්‍ය නිලධාරීන්ට පඩි වැඩිවෙලා තියෙනවා.ඉස්සරහට ජීවන තත්ත්වය ඉහළ නංවාලීමට වැඩ කටයුතු කරගෙන යනවා.ස්වයං රැකියා සඳහා යොමු කරනවා.ඒ සඳහා ඔබතුමන්ලාත් මැදිහත් වෙන්න.ඉදිරියේ ලස්සන නගරයක් හැදීම සඳහා කරගෙන යන වැඩපිළිවෙළට එකතු වෙලා සියලු දෙනා ම සහයෝගය දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**සභික ඒ.එස්.එම්.එස්.සුමිත්‍රා සේනානායක මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, මං වීථි පහන් සම්බන්ධව කතා නොකරට, මේ සභාවේ නිතර ම හැමදෙනා ම වීථි පහන් ගැන කතා කරනවා.මහර කොට්ඨාශයේ මහජන නියෝජිතවරිය විදිහට වැඩි ම අපහසුතාවයකට පත් වී තිබෙන්නේ මම මේ වීථි පහන් ගැමාහර මාහින්ගොඩ වසම් දෙක ම ටලුව නිසා.ඒත් අද වෙනකම් මම මේ වීථි පහන් ගැන මම සභාවේ කතා කාළේ නෑ.ඒක ට හේතුව තමයි මේ වීථි පහන් ප්‍රශ්නය අපි බලයට පත් වෙන්නට පෙර වසර 4 ක පමණ සිට තිබුණ ප්‍රශ්නයක්.ඒ කාළේ මම දේශපාලනය කරන්නේ නෑ.මාහර මාහින්ගොඩ මාහර වසම් දෙක ම කාලයක ඉඳන් කළුවරේ තිබුණේ.ඉස්සර මේ ගැන කතා කරන්න සභාවට ආවා.ී ගැන අපි දන්නේ නෑ කිවුවා.මණ්ඩලේට ගියා.ඒ ගැන අපි දන්නේ නෑ කිවුවා.ඒ විදුලිබල ඇමතිතුමියගේ කාළේ.කිසි ම ක්‍රමවේදයක් නොමැතිව ඒ විදුලි පහන් සවි කරලා තිබුණේ.මගේ වසමේ මාහර ප්‍රධාන මාර්ගය සම්පූර්ණයෙන් මද, හුලන්ගස්දළුව වීථි පහන් 4 ක්, එපිටවත්ත වීථි පහන් 6 ක්, තලාවිටිය වත්ත වීථි පහන් එකක් විදිහට දාල තිබුණේ.සභාවේ කතා නොකෙරුවට මම ඒ ගැන, අවශ්‍ය හැම ආයෙතනයකට ම දැනුවත් කළා.ගරු සභාපතිතුමා ඇමතිතුමා එක්ක කතා කරලා ගරු සභාපතිතුමා ඒ පිළිබඳ රත්නපුර සම්බන්ධීකරණයේ කතා කරලා ඇමතිතුමාගේ මැදිහත් වීමෙන් වීථි පහන් ගැටලුව විසඳීමේ ක්‍රියාවලියේ ඉන්නවා.එහි ප්‍රතිඵලයක් විදිහට මේ වෙන කොට එම ගැටලුව සමතයකට පත් වෙලා ළඟදි ම වීථි පහන් අපිට ලැබෙන තැනකට ඇවිත් තියෙනවා.ගරු සභාපතිතුමනි හැකි ඉක්මනින් වීථි පහන් ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.මේ වීථි පහන් සම්බන්ධ ගැටලුව පසුගිය කාලයේ හිටපු මන්ත්‍රීවරු දන්නවා.නමුත් ඒ ගැන මතක් කරන්නෙවත් නැතුව තමයි නිතර නිතර මේ ප්‍රශ්නය සභාවට ගේන්න අපි බලයට පත් වුණා ම වුණ ගැටලුවක් වගේ.ඒකයි මම මේ මතක් කිරීම කළේ.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, පැල්පිටිය මාර්ගය, ඇත්තටම සම්බන්ධිකරණ කමිටු සභාපතිවරයා හැටියට, පැල්පිටිය අපිට ආවා කිලෝමීටර් 5 ක් කාපට් කරන්න.අපි එදත් කිවුවා මේක.පැල්පිටිය සදර්ලන්ඩ් මාර්ගයේ ඔක්කොම නෙමෙ ගරු සභාපතිතුමනි.මීටර් 700 ක් ආදාගල පාරට හැරෙන තැන දක්වා.අපිට කිලෝමීටර් 5 න් අපිට අනුමත වෙලා තියෙන්නේ පොඩි ප්‍රමාණයක්.ඒකෙන් එකක් තමා අස්ගගුල පාර.දැන් ඇස්තමේන්තු සකස් කරනවා.මේ අවුරුද්දෙ මුල් කාර්තුවේ මේ පළාත් මාර්ගවලට මුදල් වෙන් කර ගන්න පුළුවන්.අපි ඒකට යොමු කරලා තියෙන්නේ.අපිට ඒක අනිවාර්යෙන් ම ලැබෙයි.ඒ පාර අපි හදනවා.ඇහැලියගොඩ නගරයට වසම් ගණනාවක්, උතුරු කරදන, දකුණු කරදන වගේ කොට්ඨාශවල ඉඳන් ඇහැලියගොඩට එන්න තියෙන කෙටි මාර්ගයක්.නගර සංවර්ධනය ඇතුළේ ඒ පාර දාල තියෙනවා.නගරයට පිවිසෙන ප්‍රධාන පළාත් මාර්ගයක් නිසා.
අනික වීථි පහන්.වීථි පහන් එක පැත්තකින් හදන් යනකොට එක පැත්තකින් පිච්චෙනවා.අපි අනිවාර්යෙන් වරිපනම් සීමාවේ වීථි පහන් දාන එක අනිවාර්යෙන් කරන්න ඕනේ.ඒ සම්බන්ධව ගැටලු ටිකක් තියෙනවා.ඒ සම්බන්ධව ගැටලු ටික විසඳන්න සාකච්ඡා කරලා තියෙන්නේ.

**සභාපතිතුමා:-**

පෝය දිනට කඩ වසන කතාවක් කිවුවා.අපි එහෙම තීරණයක් ගන්න කොට අපිට ඉහළින් උපදෙස් දීලා තියෙන්නේ වෙළඳ සංගම් කැදවලා ඒ අයගේ බහුතර තීරණය ගන්න කියලා.වෙළඳ සමිගම් එක්ක අපි සාකච්ඡා කළා.එතනදී එන ප්‍රශ්න තමා. අවිස්සාවේල්ල අරිනවා.ඇහැලියගොඩ වහනවා.කුරුවිට අරිනවා.එතකොට දිනකට කෝටි 35 ක් 40 ක ප්‍රමාණයක් අර නගර දෙකට ඇදිලා යනවා.එකක් ඒක .අනික තමා ලංකාවෙ ම පෝයට වහනව නම් ඒක ප්‍රශ්නයක් නෑ.ඇහැලියගොඩ විතරක් වැහුවහම තේ එකක්වත් බොන්න තැනක් නෑ.සමහර අය යෝජනා කළා වැඩට අවිත් ඉන්නේ පිටින්.ඒ අය ගෙදර ගිහාම ආයෙ එන්න විදිහක් නෑ.ඒ කාරණා එක්ක වෙළඳ සංගමය කියන්නේ මුස්ලිම් අය පල්ලි යන්න වෙලාවක් වෙන් කරන් වහනවා.අපිටත් පන්සල් යන්න ඕන්නම් තමන්ගේ කැමැත්තෙන් වහලා යන්න පුළුවන් කියලා.මේකට තාම තිරණයක් නෑ.අපි තාම සාකච්ඡා කරනවා.බහුතරයේ තීරණය අනුව අපි ඒක ක්‍රියාත්මක කරනවා.
අනිත් කාරණය ස්පා.ඒකට සභාවේ ඉන්න සියලු ම දෙනා උදව් කරන්න වෙයි.මේකෙ විෂ මත්ද්‍රව්‍ය ජාලාවක් තියෙන්නේ.මේකෙ වැඩිපුර තියෙන්නේ විෂ මත්ද්‍රව්‍ය වෙන්න පුළුවන්.පාතාලෙ වෙන්න පුළුවන්.අපි පොලිසියත් එක්ක සාකච්ඡා කළා.පොලිසියත් එක්ක අපි තීරණයක් ගත්තා.මේක අපිට නවත්තන්න පුළුවන්ද කියලා නිත්‍යානුකූලව හොයා බලන්නත් ඕනේ.අපිට දැන් සභාවේ අනුමැතිය පවා තියෙන නිසා මටත් දැන් ලොකු ගැම්මක්.නැත්තන් ගැටෙන්න වෙන්නේ පොඩි අය එක්ක නෙමෙයි.ස්පා 14 ක් 11 ක් වගේ අදුරගෙන තිබ්බට අයිතිකාරයෝ මං හදුනගෙන තියෙන හැටියට එක්කෙනයි, දෙන්නයි ඉන්නේ.
ඊළඟට ප්‍රජා ශක්තිවලට, මෙතන සභාපතිහැටියට නෙමේ ඒක දෙන්නේ.ඒක යොමු කරන්නේ.ලංකාවෙම ප්‍රාදේශිය සභා, ප්‍රාදේශිය සම්බන්ධිකරණ සභාපතිවරයා තමා පත් කරන්නේ ප්‍රජා ශක්තිවල කොට්ඨාශයට අයිති සභාපති කවුද කියලා.සභාපතිට තමා බලය තියෙන්නේ කැමති අය පත් කර ගන්න.ඒක වරදවා තේරුම් ගන්න එපා.සභාවේ සභාපති හැටියට මම කරන යෝජනාවක් නෙමේ.
සභාවේ වෙළඳ සංගමයෙනුත් ලිපියක් දුන්නා වතුර ලීක් එක තැන හොයන්න.ඒක හොයන්න බෑ.ඒක හොයන්න අපේ තාක්ෂණ නිලධාරීන්ටත් බෑ.දෙවැනි මහලේ තමා ඒ ප්‍රශ්නය තියෙන්නේ.ඒකත් අපි හැකි ඉක්මනින් ම කරන්නම්.
ආදාහනාගාරය ප්‍රශ්නය.ගිනිගල් කැඩිලා තියෙන්නේ.ලෑස් එක එන තැන විතරක් පෙට්ටියටත් වදිනවා, ගිනිගල්වලටත් වදිනවා.ඒ නිසා ඒ එතන ගිනිගල් ටික පිච්චිලා තියෙන්නේ.අපි ගිහින් බැලුවා.ඇස්තමේන්තු හදන්න කිවුවා.අපිට කාර්මික නිලධාරී ප්‍රශ්නයකුත් තියෙනවා.එක මහත්තයයි මිස් කෙනයි ඉන්නේ.මිස් පහුගිය දවස්වල අසනීපනිසා නිවාඩු දාල තියෙන්නේ.අපි ඒ ගැන කොමසාරිස් එක්කත් කතා කළා.කාඩර් එකේ විදිහට ගන්න බෑ.ඒ නිසා මිස්ට අනුයුක්තයක් හදන්න ඉල්ලීම් ලිපියකුත් මිස්ගෙන් ගන්න කිවුවා.අපි එතනදී විශේෂයෙන් ම අපි ඉල්ලුවා පිරිමි තාක්ෂණ නිලධාරී මහත්මයෙක් අපිට දෙන්න කියලා.අපේ වසම් ගොඩක් ඈත තියෙන්නේ.ඒ හැමදේටම TO මහත්තයා යන්නේ.මුදල්වල ප්‍රශ්නයක් නෑ.ඒ සම්බන්ධවත් අපි කටයුතු කරමින් ඉන්නේ.
අනික බස්රථ සම්බන්ධව.ඒක 12 වෙනිදා සාකච්ඡාවෙන් නිරාකරණය වෙනවා.එදාට නගරයේ තියෙන ප්‍රශ්නවලින් සීයට අනු ගාණකට ම මං හිතන්නේ තීරණ ගන්න පුළුවන් එදාට.එදාට සියලුම ආයතනවලට එන්න කියලා දැනුවත් වීම් කරලා තියෙන්නේ.
ඊළඟට වීථි පහන් සම්බන්ධව.දෙගොල්ලොම හිතා ගන්න, හැමෝටම යොමු කරනවා.අපි මේ මාස 6 ඇතුළත බල්බ් 800 ට වැඩිය දාල තියෙනවා.විදුලිබල මණ්ඩලයේ ඒවත්, එයාලට දාන්න ප්‍රතිපාදන නෑ කියලා අපිට දාන්න කියනවා.අපි ඒකට අවසර අරන් තියෙන්නේ.දැන් ටෙන්ඩර් ක්‍රියාමාර්ග හරහා ගිහින් සාමාන්‍ය බල්බ් එක නෙමේ ලොකු ලයිට් එක දෙසිය ගාණක් අපි හෙට අනිද්ද ම ගේනවා.ඒ සම්බන්ධව වැඩ කටයුතුත් සිදු වෙනවා.
ඊළඟට තලාවිටිය ජල ව්‍යාපෘතිය.ඒකෙ ගැටලු දැන් 90% ක් විසඳිලා තියෙන්නේ.තව මාස දෙක තුනක් වගේ යනකොට අපිට පුළුවන් වෙයි ඒකෙ වැඩ ටික කරන්න.අපි කතා කරලා තියෙන්නේ.
ඔය කාරණා ටික තමා අපි විශේෂයෙන් ම කියන්න තියෙන්නේ.දැනට ප්‍රාදේශිය සභාවේ වසම් 44 තුළ ලක්ෂ පන්දාහට වැඩි ප්‍රමානයක් වෙන් වෙලා තියෙනවා සංවර්ධන වැඩවලට.පොඩි ගාණක් නෙමේ.සංවර්ධනය වෙච්ච අඩුම කොට්ඨාශය විලේගොඩ.ව්‍යාපෘති තුන්සියට වැඩි ප්‍රමාණයක් කරලා තියෙනවා.බයවෙන්න එපා.ආණ්ඩුවක් වැටෙනව නම් ඩොලර් නැතිවෙන්න ඕනේ.රුපියල් නැති වෙන්න ඕනේ.වැඩිම ඩොලර් ප්‍රමාණය ලැබිලා තියෙනවා.වැඩිම රුපියල් ප්‍රමාණය ලැබිලා තියෙනවා.ලස්සනට වැඩ ටික කරගෙන යනවා.බොහොමත්ම ස්තුතියි.දැන් වේලාව 2.55 යි.

බන්ධුලසේන දුණුවිල,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශිය

සභාව.2026 ක් වූ.................................මස...........දින
ඇහැලියගොඩ ප්‍රාදේශිය සභා කාර්යාලයේ දී.